ISSN 1391 - 4006

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT



2019

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
NATIONAL LIBRARY & DOCUMENTATION SERVICES BOARD

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை

National Library & Documentation Services Board

වාර්ෂික වාර්තාව - 2019

நிருவாக அறிக்கை – 2019

Annual Report - 2019

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2019

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA

සභාපතිතුමාගේ පණිවුඩය

රජයේ භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලැබෙන්නා වූ ප්‍රතිපාදන හා වෙනත් මාර්ගවලින් ලැබෙන ඉපයීම් යොදා ගනිමින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට 2019 වසරේ සියලු ම අංශ මගින් ඉටු කරනු ලැබූ කාර්යයන්වල ප්‍රගතිය මෙම වාර්තාවට ඇතුළත් වේ. එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් ලබාදුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන් ද කෘතවේදී ව සිහිපත් කරමි. මෙම කාර්යභාරය ඉටු කිරීමේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාටත්, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ සියලු ම නිලධාරීන්ටත් මෙය සම්පාදනය කළ ක්‍රමෝපාය සැලසුම් අංශයේ අංශ ප්‍රධාන ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීත්වය පළකර සිටිමි.

මහාචාර්ය නන්ද ධර්මරත්න

සභාපති

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පවත්වාගෙන යාමත් මෙරට සෙසු පුස්තකාලවල අභිවෘද්ධිය සහ සංවර්ධනය සඳහා කටයුතු කිරීම ඇතුළු ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් සේවා සම්පාදනය කිරීමයි. මේ යටතේ 2019 වසර තුළ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා තිබේ. ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු පසුගිය වසරේ ආරම්භ කළ ද එහි නවීකරණ කටයුතු තවදුරටත් අවසන් නොවීම හේතුවෙන් ජාතික පුස්තකාලයේ කාර්යයන් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා එය බාධාකාරී වී තිබේ. කෙසේ වුව ද විවිධ දුෂ්කරතා මධ්‍යයේ පාඨක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට මණ්ඩලය කටයුතු කර තිබේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් මහජන පුස්තකාල ආශ්‍රිතව ක්‍රියාත්මක කරනු ලබන ඩිජිටල් පුස්තකාල සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද එක් පුස්තකාලයක් වශයෙන් තෝරාගෙන තිබෙන අතර ඒ සඳහා අවශ්‍ය පරිගණක උපාංග හා ඊට අදාළ උපකරණවලින් සමන්විත ඩිජිටල් පුස්තකාල පහසුකම් එක් කිරීමට පියවර ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති අංක (ISBN,ISSN,ISMN) නිකුත් කිරීමේ ජාතික මධ්‍යස්ථානය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරනු ලබන අතර එහි සේවා පුළුල් කිරීමේ අරමුණෙන් අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිති අංක නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට මෙම වසරේ පියවර ගෙන තිබේ. මණ්ඩලය මගින් ඉතා දීර්ඝ කාල පරිච්ඡේදයක සිට සම්භාව්‍ය කෘති සංස්කරණයෙන් ප්‍රකාශයට පත් කිරීම සිදු කළ අතර මෙම වසරේ දී **බුත්සරණ** කෘතියෙහි සංස්කරණ කටයුතු නිමකර ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ලැබුණි. මීට අමතරව විවිධ ව්‍යාපෘති ගණනාවක් මෙම වසර තුළ ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපදෙස් හා අවශ්‍ය මග පෙන්වීම ලබා දුන් මණ්ඩලයේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, උපදේශක කමිටුවල සාමාජික මහත්ම මහත්මීන්ටත් ස්තුතිය පිරිනමන අතර මෙම වාර්තාව සම්පාදනය කළ ක්‍රමෝපාය සැලසුම් අංශයේ අංශ ප්‍රධාන ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පිරිනමමි.

ඩබ්ලිව්. සුනිල්

අධ්‍යක්ෂ ජනරාල්

පටුන

සභාපතිතුමාගේ පණිවිඩය	i
අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය	iii
දැක්ම / මෙහෙවර / අරමුණු හා පරමාර්ථ	1
ආයතනික දර්ශනය	2
කාර්ය මණ්ඩල තොරතුරු	5
කාර්ය මණ්ඩල පුහුණුවීම්	7
ප්‍රතිග්‍රහණ අංශය	10
පාඨක සේවා අංශය	13
තොරතුරු තාක්ෂණ අංශය	15
ග්‍රන්ථ විඥාපන පාලන අංශය	18
සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය	21
පුස්තකාල පර්යේෂණ අංශය	25
ඩිජිටල් පුස්තකාල ඒකකය	27
ව්‍යාප්ති සේවා අංශය	28
අධ්‍යාපන හා පුහුණු අංශය	34
ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය	38
පුස්තකාල සහයෝගිතා අංශය	47
ක්‍රමෝපාය සැලසුම් අංශය	50
පරිපාලන අංශය	52
නඩත්තු අංශය	54
මුදල් අංශය	54
අභ්‍යන්තර විගණන අංශය	56
සමාප්තිය	57
ගිණුම් වාර්තාව 2019	189
විගණකාධිපති වාර්තාව 2019	253

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

වාර්ෂික වාර්තාව - 2019



දැක්ම :

සමස්ත ජනතාවට පුස්තකාල හා තොරතුරු සේවා ප්‍රවේශයක් සපයන ජාතික ඥාන කේන්ද්‍රය බවට පත්වීම

මෙහෙවර :

දැනුවත් සමාජයක් බිහි කිරීම උදෙසා ජාතියේ බුද්ධිමය උරුමය සුරැකීම, ජාතික පුස්තකාල හා විඥාපන සේවා පද්ධතිය සංවර්ධනය, පුස්තකාල සේවා කාර්යක්ෂමතාව පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතයට දිරි දීම, ග්‍රන්ථ විඥාපන පහසුකම් සැපයීම සහ ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා අනුග්‍රහය දැක්වීම.

අරමුණු හා පරමාර්ථ :

- ශ්‍රී ලංකාවේ පුස්තකාල, තොරතුරු හා තදනුබද්ධ සියලුම සේවා සඳහා නායකත්වය සැපයීම.
- රට තුළ හෝ ඉන් බැහැර ව ලිඛිත, මුද්‍රිත හෝ අන්‍යාකාරයෙන් ප්‍රකාශිත පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ පරිපූර්ණ ජාතික සංචිතයක් පිහිටුවීම, වැඩිදියුණුව හා පවත්වාගෙන යාම.
- ග්‍රන්ථ විඥාපන, ප්‍රලේඛන සේවා සංස්ථාපනය හා පවත්වාගෙන යාම.
- පුස්තකාල හා තොරතුරු සේවා සම්බන්ධ අධ්‍යාපන පුහුණු හා වෘත්තීය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම හා ප්‍රමිති සම්පාදනය.
- දේශීය පුස්තකාල සංවර්ධනය සඳහා මානව සම්පත් සංවිධානය හා භෞතික සම්පත් ප්‍රවර්ධනය.
- දේශීය ග්‍රන්ථ ප්‍රකාශනයට දිරි දීම සහ කියවීම ප්‍රවර්ධනය.
- පුස්තකාල හා තොරතුරු සේවාවන්හි තොරතුරු තාක්ෂණය භාවිතය දිරිමත් කිරීම.
- පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ජාතික කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් පවත්නා ආයතන හා සංවිධාන සමඟ සහයෝගීතා වර්ධනය.
- විවිධ ජන කොටස්වල සංස්කෘතික අනන්‍යතාවලට ගරු කරමින් අන්‍යොන්‍ය සහජීවනය තහවුරු කෙරෙන පරිදි පුස්තකාල හා තොරතුරු සේවා සංවිධානය කිරීම.
- ශාස්ත්‍රීය පර්යේෂණ කටයුතුවලට අවශ්‍ය සම්පත්, සේවා සංවිධානය හා සැපයීම.

(1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 25වන වගන්තිය ප්‍රකාර සැකසුණි)

ආයතනික දර්ශනය

ජනතාවගේ දැනුම වර්ධනය කිරීම රටක සංවර්ධන ක්‍රියාවලියේ අතිශයින් වැදගත් කාර්යයකි. සමාජයේ විවිධ ජන කොටස්වලට අවශ්‍ය දැනුම විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ලබාදීමට අවස්ථාව සලසාදීම රටක පුස්තකාල පද්ධතියෙහි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලද අතර 1998 අංක 51 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නමින් එහි කටයුතු වඩාත් පුළුල් කෙරිණි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

(ආ) ජාතික මට්ටමේ පුස්තකාල සේවා හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම වේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය වන අතර එය දිවයිනේ අනෙකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙස කටයුතු කරයි. එමෙන් ම ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු යටතේ පුස්තකාල සඳහා උපදේශක සේවා සැපයීම, පුස්තකාල වැඩිදියුණු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු පැවැත්වීම, පුස්තකාල සම්පත් ලබාදීම, පොත් ප්‍රදර්ශන පැවැත්වීම, කියවීමේ රුචිය වර්ධනය කිරීමේ අරමුණෙන් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය වශයෙන් ඩිජිටල් පුස්තකාල ආරම්භ කිරීම සඳහා සහයෝගය ලබා දීම, පොත්පත් සංරක්ෂණය සඳහා පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, පුස්තකාල ශ්‍රේණිගත කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම, පළාත් සභා මට්ටමින් පුස්තකාල නගා සිටුවීම සඳහා පළාත් පුස්තකාල සේවා මණ්ඩල සමඟ කටයුතු කිරීම, විවිධ ව්‍යසනවලින් හානි වූ පුස්තකාල සංවර්ධනය, පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම, පුස්තකාල සහයෝගිතා වැඩසටහන් සංවිධානය හා ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ආධාර කිරීම, ජාතික පුස්තකාලයේ තොරතුරු ඩිජිටල්කරණය කිරීම හා එම තොරතුරු ඇසුරින් ජාතික ඩිජිටල් පුස්තකාලය පවත්වාගෙන යාම වැනි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරේ.

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 3 වැනි වගන්තිය (ආ) ප්‍රකාර ගරු අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය 2019.12.31 දින වන විට පහත සඳහන් පරිදි විය.

01. පී. එම්. දීපාල් චන්ද්‍රරත්න මහතා සභාපති (2019 නොවැම්බර් මස දක්වා)
එච්. හේවගේ මහතා (අති. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය) වැඩ බලන සභාපති
ජා. පු. හා ප්‍ර. සේ. මණ්ඩලය 2019 දෙසැම්බර් 09 සිට 2019 දෙසැම්බර් 31 දක්වා

සාමාජිකයන් නිල බලයෙන්

02. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවට, ආර්. එච්. එන්. නන්දසිරි මහතා (2019 ජනවාරි මස 14 දක්වා), එම්. කේ. ජේ. ඒ. අල්විස් මහතා (2019 ජනවාරි මස 28 සිට ජූලි මස දක්වා) ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (2019 අගෝසතු මස සිට නොවැම්බර් මස දක්වා)
03. බී. එම්. එම්. එම්. බස්නායක මහත්මිය, අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය) (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)
04. එස්. අරුලානන්දම් මහත්මිය, සභාපති (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය) (2019 ජනවාරි මස සිට ජූනි මස දක්වා), ආචාර්ය එන්. ඩී. විජයසුන්දර මහත්මිය, සභාපති (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය) (2019 ජූලි මස සිට නොවැම්බර් මස දක්වා)
05. මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මිය, සභාපති (ජාතික විද්‍යා පදනම) (2019 ජනවාරි මස 28 දක්වා, (ආචාර්ය ඒ. එම්. මුබාරක් මහතා, සභාපති (ජාතික විද්‍යා පදනම) 2019 පෙබරවාරි මස සිට නොවැම්බර් මස දක්වා)
06. අනෝජා පී. ගුරුගේ මහත්මිය, අතිරේක ලේකම් (අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය) (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)
07. ආර්. ඒ. ටී. ඒ. රණවීර මහතා, ගණකාධිකාරි (මුදල් අමාත්‍යාංශය) (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)
08. ශ්‍රියානන්ද රත්නායක මහතා, වැඩසටහන් විශේෂඥ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය), (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)

අනෙකුත් සාමාජිකයින්

09. මහාචාර්ය කේ. එන්. ඕ ධර්මදාස මහතා (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)
10. මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)
11. නීතිඥ ඩී. ආර්. කේ. ඩී. සමරකෝන් මහතා (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)
12. එම්. කේ. ජේ. ඒ. අල්විස් මහතා (2019 ජූලි මස සිට නොවැම්බර් මස දක්වා)
13. ඩබ්. පී. පී. කරුණාරත්න මහතා (2019 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා)

2019 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා තිබේ. එසේම රටේ පැවැති දේශපාලන වෙනස්වීම් හේතුවෙන් නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන් නැවත පත් වනතුරු දෙසැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සංවිධානය නොකරන ලදී.

උපදේශක කමිටු

ආයතනයේ ඒ ඒ අංශවලින් ඉටුකරනු ලබන කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා පත්කරන ලද උපදේශක කමිටු මෙම වසර තුළ දී පහත සඳහන් පරිදි රැස්වී තිබේ.

උපදේශක කමිටුව	**අංශය**	**රැස්වීම් පැවැත් වූ දින**
ජාතික පුස්තකාල උපදේශක කමිටුව	පාඨක සේවා හා ප්‍රතිග්‍රහණ	2019.03.11, 2019.03.21, 2019.06.24, 2019.07.08, 2019.07.20, 2019.08.16, 2019.08.20, 2019.12.27
ග්‍රන්ථ විඥාපන පාලන උපදේශක කමිටුව	ග්‍රන්ථ විඥාපන පාලන	2019.05.15
සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන උපදේශක කමිටුව	සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන	2019.05.06
පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ අනු කමිටුව	ව්‍යාප්ති සේවා	2019.02.26, 2019.05.16, 2019.11.07, 2019.12.13
ප්‍රකාශන උපදේශක කමිටුව	ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන	2019.07.23, 2019.08.29,
මුද්‍රණ උපදේශක කමිටුව		2019.08.28
නව ප්‍රකාශන උපදේශක කමිටුව		2019.04.24
ග්‍රන්ථ පරිවර්තන උපදේශක කමිටුව		2019.05.09, 2019.06.18, 2019.08.29
ළමා හා යොවුන් සාහිත්‍ය උපදේශක කමිටුව		2019.08.28
විගණන හා කළමනාකරණ කමිටුව	අභ්‍යන්තර විගණන	2019.03.19, 2019.06.12, 2019-09-23, 2019.10-15

කාර්ය මණ්ඩල තොරතුරු

ඉවත්වීම්		
නම	**තනතුර**	**දිනය**
එල්. පී. සී. එන්. වාදසිංහ මහත්මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	2019.03.01
ඩබ්ලිව්. ආර්. ඒ. එස්. එල්. රණසිංහ මහත්මිය	තොරතුරු සහකාර iii ශ්‍රේණිය	2019.01.10
එන්. සී. කළුපහන මෙනෙවිය		
ඩී. එල්.ඒ. නදීකා මෙනෙවිය		
බී. මෝහනාන්දි මහත්මිය		2019.05.08
ඒ. එල්. පී. මධුශානි මහත්මිය		2019.09.18
සින්තුජා ගනේෂ්ලිංගම් මහත්මිය		2019.10.30
කේ. එම්. එම්. යූ. සෙනෙවිරත්න මෙනෙවිය	කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය	2019.09.17
එච්. ඒ. එස්. හපුආරච්චි මෙනෙවිය		2019.09.18
කේ. වී. අයි. ගුණතිලක මහතා		2019.12.05
විශ්‍රාම ගැනීම්		
ඩී. අලහප්පෙරුම මහතා	පුස්තකාල සහායක ii ශ්‍රේණිය	2019.01.11
ඔස්. ටී. සමරසේන මහතා		2019.09.06
එන්. එස්. ජේ. එදිරිසිංහ මහතා	පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරී ii ශ්‍රේණිය	2019.02.01
නව බඳවාගැනීම්		
ඒ. පී. ඩබ්ලිව්. ඒ. අයි. උදේශිකා මෙනෙවිය	කාර්යාල සහායක iii ශ්‍රේණිය	2019.09.16
ඩබ්ලිව්. පී. ඩී. එස්. පී. තිලකසිරි මහත්මිය		
ඒ. පී. එම්. එස්. අත්තනායක මහතා		
එච්. එම්. ආර්. හේරත් මහතා		
එල්. පී. එච්. විජේවර්ධන මහතා		
එච්. පී. ඩී. පී. එස්. තිලකරත්න මහතා		
ආර්. එම්. යූ. පද්මසිරි මෙනෙවිය	තොරතුරු සහකාර iii ශ්‍රේණිය	2019.10.01
පී. ඩී. එස්. වාසනා විජේවර්ධන මෙනෙවිය		
එන්. ඩී. ඒ. දිලුසිකා මහත්මිය		2019.10.02
කේ. එස්. එස්. ගුණසිංහ මහත්මිය		2019.10.07

ඩබ්. එන්. පී. එම්. එස්. එච්. රණසිංහ මෙනෙවිය	කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය	2019.10.01
අයි. ඩී. යූ. ඉලුක්පිටිය මෙනෙවිය		
එම්. එල්. එස්. ලක්ෂිකා කුමාරි මෙනෙවිය		
එම්. ඒ. සී. ධර්මවර්ධන මහතා	සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය	2019.10.02
ඩී. එම්. පී. බණ්ඩාරනායක මහත්මිය	අධ්‍යක්ෂ	2019.10.07
උසස්වීම්		
ඩී. පී. එස්. පී. අබේගුණවර්ධන මහතා	පරිපාලන නිලධාරී ii ශ්‍රේණිය	2019.03.01
ඒ. කේ. කුසුමාවතී මහත්මිය	පුස්තකාල සහායක ii ශ්‍රේණිය	
එල්. ඩී. එන්. නිරෝෂන් මහතා		
ඩී. එම්. ඒ. දසනායක මහත්මිය	සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය	2019.10.01
අයි. එම්. කැටිපේආරච්චි මහත්මිය		2019.10.16
යූ. එච්. ආර්. එස්. දේශප්‍රිය මහත්මිය	තොරතුරු සහකාර iii ශ්‍රේණිය	2019.10.01
වී. පී. යූ. ඩී. ප්‍රියලාල් මහතා		
ඩී. පී. බී. එම්. සී. මුතුමාලි මෙනෙවිය		
ශ්‍රේණි උසස්වීම්		
ඊ. පී. සුමතිපාල මහතා	තොරතුරු සහකාර i ශ්‍රේණිය	2017.01.01
එච්. කේ. එන්. එස්. කුමාරි මහත්මිය	කළමනාකරණ සහකාර ii ශ්‍රේණිය	2016.07.03

2019.12.31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

තනතුර	**සේවයේ යෙදී සිටි සංඛ්‍යාව**	**පුරප්පාඩු සංඛ්‍යාව**
අධ්‍යක්ෂ ජනරාල්	01	--
අධ්‍යක්ෂ (මුදල් හා පාලන)	01	--
අධ්‍යක්ෂ	02	--
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	01	--
නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෘත්තීය)	--	03
සහකාර අධ්‍යක්ෂ (මුදල්)	01	--
සහකාර අධ්‍යක්ෂ	09	--
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	01	--
සහකාර අධ්‍යක්ෂ (සංරක්ෂණ)	01	--
අභ්‍යන්තර විගණක	01	--

ප්‍රකාශන නිලධාරි	01	--
පාලන ලේකම්	--	01
පරිපාලන නිලධාරී	01	--
සංරක්ෂණ නිලධාරී	--	01
පර්යේෂණ නිලධාරී	01	--
ව්‍යාප්ති නිලධාරී	--	01
අලෙවි ප්‍රවර්ධන නිලධාරී	01	--
පුහුණු කිරීමේ නිලධාරී	01	--
පද්ධති විශ්ලේෂක	--	01
පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරි	03	06
නඩත්තු නිලධාරී	01	--
ගිණුම් නිලධාරී	--	01
පුස්තකාල සංවර්ධන සහකාර	03	09
තොරතුරු තාක්ෂණ සහකාර	01	--
තොරතුරු සහකාර	45	05
ලේඛන සංරක්ෂක	01	01
කළමනාකරණ සහකාර	29	07
රියදුරු	05	01
විදුලි කාර්මික	01	--
පොත් බැඳුම්කරු	04	02
පුස්තකාල සහායක	13	03
කාර්යාල සහායක	20	06
එකතුව	**149**	**48**

කාර්ය මණ්ඩල පුහුණුවීම්

දේශීය පුහුණුවීම් සම්මන්ත්‍රණ/වැඩමුළු/පාඨමාලා (කෙටිකාලීන)				
පුහුණුව /සම්මන්ත්‍රණය/ වැඩමුළුව	**නිලධාරියාගේ /නිලධාරින්ගේ නම්**	**ස්ථානය**	**කාලය/ දිනය**	**සම්මන්ත්‍රණ ගාස්තුව(රු.)**
නියැදිකරණ විධික්‍රම පිළිබඳ දෙදින පාඨමාලාව	උදිත ගුණසේකර මහතා (පර්යේෂණ නිලධාරී) පර්යේෂණ අංශය	කොළඹ විශ්වවිද්‍යාලය	2019.01.20 සහ 27	5000.00
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	නුවන් විජේරත්න මහතා (සහකාර අධ්‍යක්ෂ) මුදල් අංශය	නිපුනතා සංවර්ධන අරමුදල	2019.01.25 දින සිට සිකුරාදා දින 10ක්	45,000.00
ප්‍රසම්පාදන විගණනය පිළිබඳ	වාසනා එල්ලාවල මහත්මිය (අභ්‍යන්තර විගණක) සහ එච්. දිල්රුක්ෂි ශාමලී	"Distance Learning	2019.02.25 සහ 28	18,400.00

පුහුණුව	මහත්මිය (තොරතුරු සහකාර) අභ්‍යන්තර විගණන අංශය	Centre Ltd.” ආයතනය		
“Microsoft Office” පාඨමාලාව	කේ. මේනකා කුමාරි පෙරේරා මහත්මිය (ලේඛන සංරක්ෂක) සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය	2019 මාර්තු මස සිට අගෝස්තු මස දක්වා	13,000.00
සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	බී. ඒ. එන්. අයේෂාන් මහතා (කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය) මුදල් අංශය	සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය	2019.05.05 සිට එක් වසරක්	75,000.00
සන්නිවේදනය සහ මහජන සම්බන්ධතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව	පී. එල්. සී. සඳරුවන් මහතා, (තොරතුරු සහකාර i) ව්‍යාප්ති සේවා අංශය	කැලණිය විශ්වවිද්‍යාලය	2019.09.15 සිට එක් වසරක්	32,125.00
Workshop on Effective Research Proposal Writing	උදිත ගුණසේකර මහතා (පර්යේෂණ නිලධාරි) පර්යේෂණ අංශය	ජාතික විද්‍යා පදනම	2019.07.27	3,000.00
ULA-ICULA-2019 අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය	ජී. එච්. මංගල මහතා (පුස්තකාල සංවර්ධන සහකාර) පර්යේෂණ අංශය	විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය	2019.08.09	6,000.00
KDUIRC-2019 ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය	උදිත ගුණසේකර මහතා (පර්යේෂණ නිලධාරි) පර්යේෂණ අංශය	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	2019.09.11-12	3,000.00
ඵලදායී රාජ්‍ය සේවයක් සඳහා ගිණුම් ක්‍රම පුහුණු වැඩසටහන	චමිලා ගුණසේකර මහත්මිය, (කළමනාකරණ සහකාර iii) මුදල් අංශය	නිපුනතා සංවර්ධන අරමුදල ආයතනය	2019.08.15-16	8,500.00
වර්ගීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ නිලධාරීන්	ජා. පු. හා ප්‍ර. සේ. ම.	2019.08.06	5,625.00
ආයතනික කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	කාර්යාල කාර්ය සහායකවරුන් (අලුතින් බඳවාගත්)	ජා. පු. හා ප්‍ර. සේ. ම.	2019.10.08	3,990.00
Outbound Training Programme	මණ්ඩලයීය නිලධාරීන් 49 දෙනෙක්	සීගිරිය විලේජ් හෝටලය	2019.12.06-07	456,505.00
සාමාන්‍ය කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන	නව පත්වීම් ලද තොරතුරු සහකාර/කළමනාකරණ සහකාර හා සේවා උසස්වීම් ලද නිලධාරීන්	ජා. පු. හා ප්‍ර. සේ. ම.	2019.12.30	3630,00

දේශීය දිගුකාලීන පාඨමාලා

පුහුණුව /සම්මන්ත්‍රණය වැඩමුළුව	නිලධාරියාගේ /නිලධාරින්ගේ නම්	ස්ථානය	කාලය/දිනය	සම්මන්ත්‍රණ ගාස්තුව (රු.)
මානව සම්පත් කළමනාකරණ වෘත්තීය සුදුසුකම් ලබාගැනීමේ පාඨමාලාව	ප්‍රියන්ත අබේගුණවර්ධන මහතා කළමනාකරණ සහකාර ii ශ්‍රේණිය	ශ්‍රී ලංකා මානව සම්පත් කළමනාකරණ ආයතනය	2019.01.16 සිට මාස 08ක කාලයක්	28,000.00 (මුළු මුදලින් 50%)

විදේශීය පුහුණුවීම්/ සම්මන්ත්‍රණ වැඩමුළු

පුහුණුව /සම්මන්ත්‍රණය වැඩමුළුව	නිලධාරියාගේ /නිලධාරින්ගේ නම්	රට	කාලය /දිනය	මණ්ඩලයන් වැය වූ මුදල (රු.)
ඩිජිටල් ප්‍රකාශන හා ඩිජිටල් පුස්තකාල සම්මන්ත්‍රණය	ඩබ්ලිව්. සුනිල් මහතා, (අධ්‍යක්ෂ ජනරාල්)	චීනය	2019.08.07 සිට 2019.08.12 දක්වා	49,920.00
ISSN ජාතික මධ්‍යස්ථාන අධ්‍යක්ෂවරුන්ගේ 44 වන සමුළුව	සේනානි බණ්ඩාර මහත්මිය, (අධ්‍යක්ෂ)	ඉන්දියාව	2019.11.12 සිට 2019.11.16 දක්වා	182,192.49
UNESCO International Symposium on Knowledge Engineering for Digital Library Design – 2019	උදය කබ්රාල් මහතා (සහකාර අධ්‍යක්ෂ ii)	ඉන්දියාව	2019.12.09 සිට 2019.12.12 දක්වා	38,108.00

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ විවිධ අංශවල කාර්යභාරය හා ප්‍රගතිය - 2019

ප්‍රතිග්‍රහණ අංශය

ප්‍රතිග්‍රහණ අංශයේ වගකීම හා කාර්යභාරය වනුයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට සුදුසු පොත්පත්, විද්‍යුත් මාධ්‍ය මුලාශ්‍ර සහ වෙනත් වර්ගවල තොරතුරු මූලාශ්‍ර අත්පත් කර ගැනීමයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියට අනුව (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන ප්‍රකාශන, (ii) ශ්‍රී ලංකාව පිළිබඳ විදේශ රටවල පළවන ප්‍රකාශන, (iii) ශ්‍රී ලාංකිකයින් විසින් විදේශ රටවල පළ කරන ප්‍රකාශන (iv) ප්‍රධාන විමර්ශන ග්‍රන්ථ (v) වෙනත් පුස්තකාලවලට ලබාගත නො හැකි එහෙත් පර්යේෂණ සඳහා අත්‍යවශ්‍ය විමර්ශන මූලාශ්‍ර සහ (vi) පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අයත් ප්‍රකාශන ලබාගැනීම කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ. මීට අමතරව ISBN, ISSN හා ISMN අංක ලබාදෙන ප්‍රකාශන තැන්පතු පිටපත් සේ ලබා ගැනෙයි. ඉහත (i), (ii), (iii) සහ (vi) වර්ගවලට අයත් ප්‍රකාශනවලින් පිටපත් දෙක (02) බැගින් ද, විමර්ශන ග්‍රන්ථවලින් එක් පිටපතක් බැගින් ද ලබාගැනීමට කටයුතු කෙරේ. විමර්ශන ග්‍රන්ථ ලබාගැනීමේ දී ඒවායේ නව සංස්කරණ කාලානුරූපව මිල දී ගනු ලැබේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කිරීමේ දී ප්‍රධාන ක්‍රම 04 ක් අනුගමනය කරනු ලැබේ.

(i) නීත්‍යානුකූල තැන්පතු පිටපත් ක්‍රමය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් පිටපත් ලබාගැනීම

(ii) මිල දී ගැනීම්

(iii) පරිත්‍යාග

(iv) හුවමාරු සේවා ක්‍රම (Exchange Services) යටතේ ප්‍රකාශන ලබාගැනීම

නීත්‍යානුකූල තැන්පතු පිටපත් ක්‍රමය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් පිටපත් ලබාගැනීම

1885 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනතේ 1976 වසරේ සංශෝධනයට අනුව ශ්‍රී ලංකාවේ පළවන සෑම ප්‍රකාශනයක ම පිටපතක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුවට නීත්‍යානුකූලව හිමි වේ. ශ්‍රී ලංකාවේ මෙම නීතිය ක්‍රියාත්මක කරන ආයතනය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වේ. මුද්‍රණකරුවන් විසින් එහි තැන්පත් කරනු ලබන පිටපත්වලින් එක් පිටපතක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට ලබා දීම සිදුවේ. මෙම වසර තුළ දී තැන්පතු පිටපත් ක්‍රමය යටතේ පොත්, වාර සඟරා, රජයේ ප්‍රකාශන, කුඩා ප්‍රමාණයේ පුවත්පත් (Tabloid Sheet ප්‍රමාණයේ) හා පත්‍රිකා සහ රජයේ ප්‍රකාශන යටතේ ගැසට්, පනත්, පනත් කෙටුම්පත් ඇතුළත්ව ප්‍රකාශන 15,712 ක් ද, පුවත්පත් 7,278 ක් ද ජාතික පුස්තකාලය වෙත අත්පත්කර ගැනීමට කටයුතු කර තිබේ.

මිල දී ගැනීම්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට අවශ්‍ය තොරතුරු හා ප්‍රකාශන අත්පත්කර ගන්නා එක් ප්‍රධාන මාර්ගයක් වන්නේ මිල දී ගැනීමේ ක්‍රමයයි. දේශීය ප්‍රකාශන අතරින් තැන්පතු ක්‍රමය යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට නොලැබෙන ප්‍රකාශන, තැන්පතු ක්‍රමය යටතේ ලැබෙන ප්‍රකාශනවල අමතර පිටපත් ද මිල දී ගනු ලබයි. එසේ ම විදේශීය ප්‍රකාශන හා මූලික විමර්ශන ග්‍රන්ථ මිල දී ගැනීමේ දී දේශීය හා විදේශීය ග්‍රන්ථ නාමාවලී, පොත් ලැයිස්තු, පුවත්පත්, වාර සඟරා, අන්තර්ජාලය වැනි විවිධ මූලාශ්‍ර උපයෝගී කර ගනී. මිල දී ගැනීම් යටතේ 2019 වර්ෂය තුළ දී ජාතික පුස්තකාලය සඳහා පොත් සහ වෙනත් පුස්තකාල තොරතුරු මූලාශ්‍ර මිල දී ගැනීම වෙනුවෙන් රු.3,278,669.35 ක මුදලක් වැය කර තිබේ.

මෙම වර්ෂය තුළ දී මිල දී ගත් ප්‍රකාශන.

ප්‍රකාශන වර්ගය		**ලබාගත් සංඛ්‍යාව**
පොත්	-	2195
පශ්චාද් උපාධි නිබන්ධන	-	03
දේශීය හා විදේශීය වාර සඟරා	-	06
සංයුක්ත තැටි DVD	-	18
මුළු ප්‍රකාශන සංඛ්‍යාව		2222

පරිත්‍යාග

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුව වර්ධනය කර ගැනීම පිණිස පුද්ගලයන් සහ විවිධ ආයතනවලින් ලැබෙන පරිත්‍යාග බෙහෙවින් ඉවහල් වේ. පරිත්‍යාග වශයෙන් 2019 වසරේ දී දේශීය හා විදේශීය වශයෙන් කතුවරුන් සහ විවිධ ආයතනවලින් අත්පත් කර ගත් ප්‍රකාශන සංඛ්‍යාව 481කි. මේ යටතේ පොත් 273ක්, ISBN ව්‍යාපෘතිය යටතේ කුඩා පුවත්පත් 08ක්, kiyawamu.lk ව්‍යාපෘතිය සඳහා කෘති 36ක්, ප්‍රවෘත්ති පත්‍රිකා 115ක්, සංඛ්‍යාංකකරණය කරන ලද ගැසට් 11ක්, කුඩා ප්‍රමාණයේ පුවත්පත් 33ක් සහ වාර සඟරා 169ක් ලැබී තිබේ.

හුවමාරු සේවා

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත ප්‍රකාශන අත්පත්කර ගන්නා තවත් ක්‍රමයක් වන්නේ හුවමාරු සේවා (Exchange Services) ක්‍රමයයි. මේ යටතේ දේශීය හා විදේශීය ආයතන සමඟ ගිවිසුම්ගත වී තිබෙන අතර මණ්ඩලය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රකාශන එම ආයතනවලටත්, එම අයතනවල ප්‍රකාශන ජාතික පුස්තකාලය වෙත ලබාගැනීමත් සිදු වේ. මේ යටතේ විදේශීය වාර සඟරා 117ක් සහ විදේශීය කෘති 05ක් අත්පත් කර ගෙන තිබේ.

ජාතික පුස්තකාලයට ලබා ගන්නා ප්‍රකාශන අතර මිල සඳහන් නොවූ ප්‍රකාශනවල මිල තීරණය කිරීමට අදාළ පොදු මිල ප්‍රතිපත්තියක් සකස් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත අත්පත් කර ගනු ලබන මිල සඳහන් නොවූ ප්‍රකාශනවල මිල තීරණය කිරීම සඳහා වන පොදු ප්‍රතිපත්තියේ මූලික කෙටුම්පත සකස් කර තිබේ. කෙසේ වුව ද

මෙම ප්‍රතිපත්තිය ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් මෙරට සියලු ම පුස්තකාලවලට බලපාන පරිදි සකස් කිරීමට කටයුතු කරන බැවින් ඉදිරියේ දී මෙහි කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මෙම වසර තුළ කමිටු රැස්වීම් 04ක් පවත්වා තිබේ.

Koha පුස්තකාල මෘදුකාංගය මඟින් ප්‍රතිග්‍රහණ කටයුතු සිදු කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක සුචිකරණ කටයුතු සඳහා Koha පුස්තකාල මෘදුකාංගය භාවිත කරනු ලැබේ. මෙම වර්ෂය තුළ Koha පරිගණක මෘදුකාංගය භාවිතයෙන් පරිගණක සුචිය සඳහා ප්‍රකාශන 14312ක් ඇතුළත් කර තිබේ.

පරිග්‍රහණ කටයුතු සඳහා RFID-Tag ක්‍රමය භාවිතයට ගැනීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පොතපත ආරක්ෂා කර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් මෙන් ම සංගණන කටයුතු පහසු කර ගැනීම සඳහා RFID -Tag ක්‍රමය හඳුන්වා දී තිබේ. මෙම ක්‍රමවේදය සම්පූර්ණ වීම සඳහා ජාතික පුස්තකාලයේ පිවිසුම් හා පිටවීමේ දොරටුව සඳහා විද්‍යුත් ගේට්ටු (e.gates) ක්‍රමය ද ස්ථාපිත විය යුතු වේ. ශ්‍රී ලංකාවේ මෙන් ම ලොව ප්‍රමුඛ පෙළේ පුස්තකාලවල මෙම ක්‍රමය භාවිතයට ගැනේ. ප්‍රතිග්‍රහණ කටයුතු සඳහා RFID -Tag ක්‍රමය භාවිතයට ගැනීම 2019.05.27 දින ආරම්භ කරන ලදී. මෙම වර්ෂය තුළ ප්‍රකාශන 4000කට ආසන්න ප්‍රමාණයකට RFID -Tag ඇතුළත් කර තිබේ.

ප්‍රතිග්‍රහණ කටයුතු පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීම.

ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ කටයුතු පිළිබඳව ප්‍රතිග්‍රහණ අංශයේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා 2019 ඔක්තෝබර් 18 දින වැඩමුළුවක් පවත්වා තිබේ.

ජාතික පුස්තකාලයේ එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම

ජාතික පුස්තකාලයේ එකතු සංවර්ධන ප්‍රතිපත්තිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් කෙටුම්පත් කර ඇති අතර එහි සංශෝධන කටයුතු සිදු කරමින් පවතී.

පාඨක සේවා අංශය

ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති පොත්පත් සහ අනෙකුත් තොරතුරු මූලාශ්‍ර පරිශීලනය කිරීමට පාඨකයින්ට අවස්ථාව සලසාදීම මෙම අංශයේ මූලික කාර්යභාරය වේ. ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු මධ්‍යයේ වූව ද පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය මඟින් වැඩි පාඨක පිරිසකට සේවය සපයා තිබේ. මෙම වසර තුළ ජාතික පුස්තකාල එකතුව පරිහරණය සඳහා ප්‍රධාන වශයෙන් ම උසස් අධ්‍යාපන ආයතන ඇතුළු වෙනත් පර්යේෂණ ආයතනවලට සම්බන්ධ පර්යේෂකයින්, පශ්චාද් උපාධි හා සාමාන්‍ය උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයින්, ජනමාධ්‍යවේදීන් ඇතුළු විවිධ ක්ෂේත්‍රවල පාඨකයින් පැමිණ තිබේ. ඔවුන්ගේ අවශ්‍යතා සඳහා මහල් තුනක ප්‍රධාන කියවීම් ශාලා තුනක් ද, බිම් මහලේ විශේෂ තොරතුරු කවුන්ටරයක් ද (Information Counter) පාඨක සේවා අංශය තුළ පවත්වාගෙන යනු ලැබේ. ආයතනයේ නවීකරණ කටයුතු ආරම්භ කිරීමත් සමඟ පළමු, දෙවන හා තෙවන මහල්වල නවීකරණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබා දීමට කටයුතු කර තිබේ. ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු හේතුවෙන් මෙම මහල්වල පොත් එකතු පවත්වාගෙන යාම සහ පාඨක සේවා පවත්වාගෙන යාම දුෂ්කර වී තිබේ.

ජාතික පුස්තකාලය නැරඹීම

ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු හේතුවෙන් ජාතික පුස්තකාලය නැරඹීමේ අවස්ථා සීමා කළ ද මෙම වසර තුළ 2019.08.22 වන දින ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ගාල්ල ශාඛාවේ සිසුන් 14ක් හා ගුරුභවතුන් දෙදෙනෙක් ද, 2019.08.29 වන දින මහනුවර ශාඛාවේ සිසුන් 14ක් හා ගුරුභවතුන් දෙදෙනෙක් ද, 2019.08.26 දින අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 26 නමක් සහ එක් කථිකාචාර්ය හිමි නමක් ද, 2019.09.26 දින නාරාහේන්පිට වෘත්තීය පුහුණු ආයතනයේ සිසුන් 50 දෙනෙකු ද ජාතික පුස්තකාලය නැරඹීම හා ජාතික පුස්තකාල සම්පත් හා සේවා පිළිබඳ දැනුවත්වීමේ වැඩසටහන් සඳහා සහභාගී වී තිබේ. සහභාගී වූ පිරිස් සඳහා තොරතුරු ගවේෂණ ක්‍රමවේදය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ද ලබාදෙන ලදී.

විමර්ශන සේවා හා තොරතුරු සැපයීමේ සේවාව

මෙම වසර තුළ ජාතික පුස්තකාලයේ විවිධ තොරතුරු මූලාශ්‍ර මඟින් පාඨකයින් සඳහා විමර්ශන සේවා (Reference Services) හා තොරතුරු සේවා (Information Services) සපයා තිබේ. වැඩි වශයෙන් පරිහරණය කරනු ලබන තොරතුරු මූලාශ්‍ර වශයෙන් පුවත්පත්, වාර සඟරා, රජයේ ප්‍රකාශන ආදි ය හැඳින්විය හැකි ය. ජාතික පුස්තකාලයේ එකතුවෙන් පාඨක පරිශීලනය සඳහා 2019 වසරේ මූලාශ්‍ර 151959ක් ලබා දී තිබේ.

පාඨක ලියාපදිංචිය

මෙම වසරේ දී පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගෙන තිබේ.

සාමාජික කාණ්ඩය		සාමාජික සංඛ්‍යාව
යාවජීව සාමාජිකත්වය	-	26
වාර්ෂික සාමාජිකත්වය	-	101
ත්‍රෛ මාසික සාමාජිකත්වය	-	274
ෙනික සාමාජිකත්වය	-	3794

ප්‍රතිරූපන පිටපත් සේවය

ජාතික පුස්තකාලයේ විවිධ එකතුවල අන්තර්ගත තොරතුරු ප්‍රතිරූපන පිටපත් ක්‍රමය යටතේ පාඨකයින්ට ලබා ගැනීමට පහසුකම් සලසා තිබේ. මෙම වසරේ මෙලෙස පිටපත් ලබා දීමෙන් රු. 1,174,887.00 ක ආදායමක් උපයාගෙන තිබේ.

විමසීම් සේවය

විවිධ විෂයයන් සම්බන්ධයෙන් තොරතුරු විමසා පුද්ගලයන්ගෙන් ලැබෙන විමසීම්වලට පිළිතුරු සැපයීම ද මෙම අංශය ඉටුකරන තවත් සේවාවකි. මේ යටතේ ලිපි, විද්‍යුත් තැපැල්, දුරකථන මගින් හා පැමිණ කළ විමසීම්වලට පිළිතුරු සපයා තිබේ. මෙම වසර තුළ විමර්ශන සේවාව යටතේ පාඨකයින් 9,378 ක් වෙනුවෙන් තොරතුරු ලබා දී තිබේ.

පුවත්පත් ලිපි කැපුම් එකතුව

විවිධ විෂය මාතෘකා යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් ලිපි 3466ක් සහිත ගොනු 348ක් එකතුවට ඇතුළත් කොට තිබේ.

තොරතුරු ප්‍රතිඇසුරුම් සේවාව

මේ යටතේ ත්‍රිපිටකය පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රතිඇසුරුම් කට්ටලයක් පාඨක පරිශීලනය සඳහා සකස් කර තිබේ.

ඩිජිටල් පුස්තකාල සේවා පහසුකම් පුළුල් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මඟින් පාඨකයින් වෙත ලබා දෙන සේවා පුළුල් කිරීමේ අරමුණෙන් ඩිජිටල් පුස්තකාල පහසුකම් ද පුළුල් කිරීමට පියවර ගෙන තිබේ. ඩිජිටල් පුස්තකාල ඒකකය මඟින් සිදු කෙරෙන සේවාවලට අමතරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අනුග්‍රහය යටතේ අවශ්‍ය පරිගණක පහසුකම්, ප්‍රතිරූපන පිටපත් සේවා ආදිය පුළුල් කිරීමට පියවර ගෙන තිබේ. ඊට අමතරව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත අවශ්‍යතාවක්ව පැවැති ළමා අංශය සඳහා අවශ්‍ය මේස, පුටු ආදී උපකරණ මෙන්ම ටැබ් යන්ත්‍ර පහසුකම් ද එක් කිරීමට පියවර ගෙන තිබේ.

අන්තර් පුස්තකාල පිරුළු සේවාව

අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ මෙම වසර තුළ ද ප්‍රධාන පුස්තකාල සමඟ මෙම සේවාව පවත්වා තිබේ. ඒ අනුව 2019 වසරේ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශන 06ක් අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ ලබා දී තිබේ. ඊට අමතරව විශේෂ පරිත්‍යාග ලෙස ශ්‍රී ලංකාවේ නිදහස් දින සැමරුමට සමගාමීව ලෙබනන් ජාතික පුස්තකාලයෙහි (Beirut) පවත්වන ලද ප්‍රදර්ශනයක් සඳහා ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ඉල්ලීම මත ශ්‍රී ලංකාවේ සාහිත්‍ය, ඉතිහාසය හා සංස්කෘතික අංග පිළිබඳ රචිත ග්‍රන්ථ, මූර්ති හා පෝස්ටර් පරිත්‍යාග කිරීම සිදු කර තිබේ.

පාඨක අධ්‍යාපන වැඩසටහන් සංවිධානය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පරිහරණය කරනු ලබන පාඨකයින් සඳහා තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබාදීම සහ අවශ්‍ය පුහුණුව ලබාදීම අඛණ්ඩව සිදුවේ. ඒ අනුව මෙම වසර තුළ පාඨකයින් 259 දෙනෙකු ඉලක්ක කර ගනිමින් පාඨක අධ්‍යාපන වැඩසටහන් පවත්වා තිබේ.

ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හා එහි සේවාවන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණෙන් ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය පිහිටුවා ගෙන තිබේ. මෙම සංවිධානයේ දායකත්වය යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක සේවා සහ පුස්තකාල ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු තාක්ෂණය යොදාගැනීමට අදාළ කටයුතුවල මෙන් ම මෙම ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ උපදේශක සේවා සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ඊට අමතරව ජාතික ඩිජිටල් පුස්තකාලයේ කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම, දැනුම වර්ධනය උදෙසා ඩිජිටල් පුස්තකාල සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම ඇතුළු ක්ෂේත්‍රයට අදාළ මෘදුකාංග සංවර්ධනය කිරීම මෙම අංශය යටතේ සිදු වේ

ජාතික පුස්තකාලයේ වෙබ් සර්වරය (web server) හා මේල් සර්වරය (mail server) පවත්වාගෙන යාම.

ආයතනයේ Web සහ Mail server පවත්වාගෙන යාම, පරිගණක දත්ත පදනම් පවත්වාගෙන යාම සහ පවතින දත්ත පදනම් යාවත්කාලීන කිරීම මෙන්ම ගැටලු නිරාකරණය කිරීම සිදුකර තිබේ.

මණ්ඩලයීය Facebook පිටුව යාවත්කාලීන කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් හා සේවා පිළිබඳ තොරතුරු පුළුල් ග්‍රාහක පිරිසක් වෙත රැගෙන යෑමේ අරමුණෙන් මණ්ඩලයීය Facebook පිටුව පවත්වාගෙන යන අතර, මෙම වසර තුළ Facebook පිටුව පරිහරණය කර ඇති සංඛ්‍යාව 6380 කි.

මණ්ඩලයීය නිවහන් පිටුව යාවත්කාලීන කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් හා සේවා පිළිබඳව මණ්ඩලයීය නිවහන් පිටුව (www.natlib.lk) ඔස්සේ අවශ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලැබේ. මේ මඟින් දුරස්ථව ජාතික පුස්තකාල සේවා සඳහා ප්‍රවිශ්ඨ වීමට අවස්ථාව සලසා දී තිබේ. ජාතික පුස්තකාල සූචියට (OPAC) අමතරව විවිධ දත්ත පදනම්, මණ්ඩලයීය ප්‍රකාශන, ඡායාරූප, දැන්වීම් පුස්තකාල ක්ෂේත්‍රයේ කාලීන සිදුවීම්වලට අදාළ තොරතුරු ආදිය මේ සඳහා ඇතුළත් කරනු ලැබේ.

Koha දත්ත පදනම යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සූචිය Koha පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය (Koha Library Management Software) යටතේ ක්‍රියාත්මක අතර කාලීනව සිදු කෙරෙන යාවත්කාලීන කිරීම්වලට අමතරව වාර සඟරාවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් එක්කර තිබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා YouTube නාලිකාව පවත්වාගෙන යාම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සම්බන්ධයෙන් සකස් කරන කෙටි ප්‍රචාරාත්මක වීඩියෝ පට අන්තර්ජාලය ඔස්සේ විකාශනය කිරීම සඳහා මණ්ඩලය වෙනුවෙන් YouTube නාලිකාවක් පවත්වාගෙන යනු ලැබේ. මණ්ඩලයේ අලෙවි ප්‍රවර්ධන නිලධාරීගේ දායකත්වය යටතේ සකස් කරනු ලබන මෙම වීඩියෝ පට අන්තර්ජාලය ඔස්සේ මුදා හැරීම මඟින් ආයතනය හා එහි සේවාවන් පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා ගැනීමට අපෙක්ෂා කෙරේ. මෙම වසර තුළ ඉදිරිපත් කළ එවැනි වීඩියෝ වැඩසටහන් පහත සඳහන් සේවාවන් සඳහා සම්පාදනය කර තිබේ.

- මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන "දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුවට සාහිත්‍ය පාලමක්" යන තේමාව යටතේ ක්‍රියාත්මක ග්‍රන්ථ පරිවර්තන වැඩසටහනට අදාළ වීඩියෝ පටයක් සැකසීම
- පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුවට අදාළව SPSS මෘදුකාංගය භාවිතය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩසටහන
- කෑගල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල පැවති කියවීමේ කඳවුරුවලට (Reading Camps) අදාළ වීඩියෝ වැඩසටහන

- සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පැවැති පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන
- කුලියාපිටිය මධ්‍ය විද්‍යාලයේ පැවැති 19 + ප්‍රදර්ශනයට අදාළ ප්‍රචාරණ වීඩියෝ පටය සකස් කිරීම

පරිගණක අධ්‍යාපන හා පුහුණු කටයුතු

ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්වල දී තොරතුරු තාක්ෂණ කටයුතුවලට අදාළ සහාය ලබා දීම තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදු වේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව අම්පාර දිස්ත්‍රික්කයේ පුස්තකාලයාධිපතිවරු දැනුවත් කිරීම සඳහා 2019.09.25 සිට 27 යන දින දක්වා අම්පාර පරිගණක සම්පත් මධ්‍යස්ථානයේ දී පැවැත්වූ වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය ලබා දී තිබේ.

පුස්තකාලවල භාවිතය සඳහා නව පරිගණක මෘදුකාංග හඳුන්වාදීම

පොළොන්නරුව නව නගරයේ අභිනවයෙන් ඉදිකළ පුරාණ තාක්ෂණ කෞතුකාගාර පුස්තකාලයට අවශ්‍ය සර්වර් පහසුකම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සේවාවක් ලෙස ලබාගැනීම සහ එම සර්වරයෙහි Koha පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය ස්ථාපිත කිරීම ඇතුළු තොරතුරු තාක්ෂණ පහසුකම් ලබා දීමට කටයුතු කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තු පුස්තකාලයෙහි Koha පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය ස්ථාපිත කිරීමට අවශ්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා පිරිවිතර සකස් කර එම ආයතනයට ලබාදීමට කටයුතු කිරීම හා මෙම වසරේ මණ්ඩලය මඟින් ස්ථාපිත සෝමා ජයකොඩි ආදර්ශ පුස්තකාලය සඳහා Koha පුස්තකාල කළමනාකරණ මෘදුකාංගය ස්ථාපිත කර සර්වර් පහසුකම් ලබාදීමට පියවර ගෙන තිබේ.

ආයතනයේ සියලු ම අංශවල පරිගණක කටයුතු අධීක්ෂණය කිරීම

මණ්ඩලයේ සියලු ම පරිගණක දෘඩාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ඇතිවන ගැටලු සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම මෙම අංශය මඟින් සිදුවේ. මණ්ඩලයේ පර්යේෂණ අංශය මඟින් සිදු කරනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යා පර්යේෂණ පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලිය 2018 ට අදාළ පරිගණක වැඩසටහන් සැකසීමට ද පියවර ගෙන තිබේ. තොරතුරු තාක්ෂණ අංශයේ ස්ථාපිත කර ඇති සර්වර් පරිගණකය අලුතින් සකස් කරන ලද සර්වර් කාමරයෙහි ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සහ ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබාදීමට ද කටයුතු කර තිබේ.

ග්‍රන්ථ විඥාපන පාලන අංශය

ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ජාතික වශයෙන් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය, සාධිකාරී ලේඛන සම්පාදනය හා විශේෂ ග්‍රන්ථ නාමාවලි හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රලේඛන ව්‍යාපෘති වැඩිදියුණු කොට පවත්වාගෙන යාම මූලික වේ.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම ජාතික පුස්තකාලය සතු ප්‍රධාන වගකීමකි. ජාතික ග්‍රන්ථ නාමාවලිය යනු රට තුළ පළවන සියලු ම ප්‍රකාශනවල තොරතුරු ඇතුළත් සාධිකාරී ප්‍රකාශනයකි. මෙම කාර්යය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 1974 වර්ෂයේ සිට ඉටු කරනු ලබයි. 1962 සිට 1973 දක්වා මෙම කාර්යය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2018 ජූලි කලාපයේ සිට 2019 පෙබරවාරි කලාපය දක්වා කලාප 08ක සම්පාදන කටයුතු නිම කර තිබේ. මෙයට අමතරව අදාළ කලාප සඳහා ලැබුණු සියලු ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ග්‍රන්ථ වර්ග කිරීම සිදුකර පාඨක ප්‍රයෝජනය උදෙසා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය වෙත යොමුකර තිබේ. ප්‍රකාශිත සියලු ම ජාතික ග්‍රන්ථ නාමාවලිවල අඩංගු තොරතුරු ජාතික ඩිජිටල් පුස්තකාලය (National Digital Library) වෙත පිවිසීමෙන් පරිශීලනය කළ හැකිය.

ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ නාමාවලිය පිළිබඳ විද්වත් සම්මන්ත්‍රණය

ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශවල ව්‍යවහාරික නාම විවිධ අවස්ථාවල දී සංශෝධනයට ලක්වීම සුලභ ලක්ෂණයක් වී තිබේ. ඒ ඒ කාල පරිච්ඡේදවල භාවිත කළ අමාත්‍යාංශ නාමය හඳුනාගැනීම නිවැරදි තොරතුරු ගවේෂණයට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම අවශ්‍යතාව සපුරාලීමේ අරමුණෙන් ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශවල නාම වෙනස් වූ ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් පිටු 537කින් යුත් ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ නාමාවලිය (Directory of Ministries in Sri Lanka) මණ්ඩලය මඟින් සම්පාදනය කර තිබේ. ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ ක්‍රමය ආරම්භ වූ 1931 වසරේ සිට 2018 වසර දක්වා කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශ නාම වෙනස්වීම්වලට අදාළ තොරතුරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. මෙම නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම නිමිත්තෙන් **ශ්‍රී ලාංකේය රාජ්‍ය පාලනයේ ව්‍යුහාත්මක ඵලදායීතාවය සහ අමාත්‍යාංශ නාමකරණය** මැයෙන් විශේෂ සම්මන්ත්‍රණයක් 2019 දෙසැම්බර් මස 16 වන දින ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණයේ දී පහත සඳහන් විද්වතුන් විසින් දේශන පවත්වන ලදී.

උදිත අලහකෝන් මහතා ස. පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය	ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ නාමාවලිය ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීමක්
ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා ජ්‍යෙ. කථිකාචාර්ය, ඉතිහාසය අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය	රාජ්‍ය සංකල්ප ගොඩනැගීම සඳහා අමාත්‍යාංශ වෙන් කිරීමේ දේශපාලන මුහුණුවර
ගාමිණී විජේසිංහ මහතා හිටපු විගණකාධිපති	රාජ්‍ය පාලනයේ ව්‍යුහාත්මක ඵලදායීතාවය සඳහා රාජ්‍ය සේවකයාගේ වගකීම සහ වගවීම
ජී. හෙට්ටිආරච්චි මහතා හිටපු අතිරේක ලේකම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය	රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාව සඳහා අමාත්‍යාංශ වෙන් කිරීම බලපා ඇති ආකාරය

මෙම සම්මන්ත්‍රණය සඳහා විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, පර්යේෂකයින් ඇතුළු විද්වතුන් රැසක් සහභාගී වූහ.

ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරනු ලබන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වාර සඟරාවල ඇතුළත් ලිපි පිළිබඳ තොරතුරු පාඨකයන්හට පහසුවෙන් සොයාගැනීම සඳහා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය කෙරේ. මෙය ත්‍රෛමාසික ප්‍රකාශනයක් වන අතර 2018-01 සහ 2018-02 කලාපවල සම්පාදන කටයුතු නිම කර තිබේ. මෙම තොරතුරු මණ්ඩලයීය වෙබ් පිටුවට (www.natlib.lk) ඇතුළත් කර තිබේ.

ජාතික පුස්තකාලයේ තොරතුරු මූලාශ්‍ර සූචිගත කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට අත්පත්කර ගනු ලබන පුස්තකාල සම්පත්වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කොට Koha පුස්තකාල පරිගණක මෘදුකාංගය ඇසුරෙන් පරිගණකගත සූචිය සකස් කිරීමත්, ජාතික පුස්තකාල සූචිය පවත්වාගෙන යාමත් මෙම අංශයේ තවත් කාර්යයක් වේ. ජාතික පුස්තකාල එකතුව පිළිබඳ තොරතුරු පාඨකයින්ට ලබාගැනීමේ එක ම මාර්ගය ජාතික පුස්තකාල සූචිය වේ. එබැවින් ජාතික පුස්තකාල සූචිය විද්‍යාත්මකවත්, පහසුවෙන් තොරතුරු ලබාගත හැකි ආකාරයෙනුත් සකස් කෙරේ. ජාතික පුස්තකාලය සඳහා අත්පත් කරගන්නා සියලුම පුස්තකාල සම්පත් අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුගත වන පරිදි සූචිගත කිරීම, වර්ග කිරීම හා කොන්ග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ යෙදීම මෙන් ම පරිගණකගත කිරීමේ කටයුතු ද සිදු වේ. 2019 වර්ෂය තුළ පුස්තකාල තොරතුරු මූලාශ්‍ර 15,833 ක් Koha දත්ත පදනමට ඇතුළත් කර තිබේ.

ඊට අමතරව 2011-2018 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකික විද්වතුන් විසින් තම පශ්චාද් උපාධි සඳහා විශ්වවිද්‍යාලවලට ඉදිරිපත් කරන ලද පශ්චාද් උපාධි නිබන්ධන 461ක තොරතුරු ද මෙම දත්ත පදනමට ඇතුළත් කර තිබේ.

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම

ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue) සම්පාදනය කිරීම හා පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයක් වෙත පැවරෙන ප්‍රධාන කාර්යයක් වේ. මෙම සූචිය මාර්ගගත සූචියක් ලෙස පවත්වාගෙන යන අතර, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පුස්තකාල රැසක පවත්නා පොතපත පිළිබඳ තොරතුරු මෙම ඒකාබද්ධ සූචිය ඔස්සේ ගවේෂණය කළ හැකිය. ජාතික ඒකාබද්ධ සූචිය සඳහා දිවයිනේ ප්‍රමුඛ පෙළේ පුස්තකාල රැසක් දායක වී තිබේ.

ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය කිරීම

ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව පරිගණක දත්ත පදනමක් වශයෙන් පවත්වාගෙන යනු ලබන අතර මෙම වසරේ දී ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්වල ලිපි 344ක තොරතුරු ඇතුළත් කර තිබේ.

ප්‍රකාශනගත සූචිකරණ දත්ත Cataloguing in Publication Data (CIP)

දිවයිනේ පුස්තකාලවල සූචිකරණය හා වර්ගීකරණ කටයුතුවල සමරූපි බවක් ඇති කිරීම සඳහා කිසියම් ප්‍රකාශනයකට අදාළ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එම කෘතියෙහි ම මුද්‍රණය කිරීම මෙමඟින් සිදු වේ. ඒ අනුව 2019 වර්ෂයේ දී කර්තෘවරුන් හා ප්‍රකාශකයින් විසින් කෘති (සිංහල 188ක්, දෙමළ 18ක් හා ඉංග්‍රීසි 48ක් වශයෙන්) 254ක් සඳහා ප්‍රකාශනගත සූචිකරණ දත්ත ලබාගෙන තිබේ.

පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතිය ඇසුරෙන් ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පිළිබඳ පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම

පරිගණක සූචිකරණය සඳහා MARC 21 ආකෘතිය ඇසුරෙන් ශ්‍රී ලංකාවට ගැලපෙන පරිදි පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු යොදා තිබේ. මේ සඳහා පුස්තකාල ක්ෂේත්‍රයේ විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ගෙන තිබෙන අතර මෙම කමිටුව අවස්ථා තුනකදී රැස්වී මෙහි මූලික සම්පාදන කටයුතු සිදු කර තිබේ. මෙම ආකෘතිය ශීඝ්‍ර සූචිකරණ ආකෘතිය (Fast Add Framework) නමින් හඳුන්වා දී තිබේ.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ මුද්‍රණකරුවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය

ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ පොත් ප්‍රකාශකයන්, ලේඛකයන් මෙන්ම ග්‍රන්ථ කර්තෘවරුන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් 2019 ජූලි මස 11 දින මහනුවර කුණ්ඩසාලේ පිහිටි මධ්‍යම පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. මෙම සම්මන්ත්‍රණයේ තේමාව වූයේ "ශ්‍රී ලාංකේය

සාහිත්‍ය කෂේත්‍රය පෝෂණය කිරීමෙහිලා ඵලදායී කෘතියක් බිහිකිරීමට ලේඛකයින්, ප්‍රකාශකයින් හා මුද්‍රණකරුවන්ගේ දායකත්වය" යන්නයි. මෙම සම්මන්ත්‍රණයේ විශේෂ ආරාධිත දේශනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ සම්මානිත මහාචාර්ය පියසීලි විජේමාන්න මහත්මිය විසින් පැවැත් වූ අතර ඩබ්ලිව් සුනිල්, සේනානි බණ්ඩාර, උදිත අලහකෝන් යන මහත්ම මහත්මීන් විසින් දේශන පවත්වන ලදී. මේ සඳහා මධ්‍යම පළාතේ ලේඛකයින්, පොත් ප්‍රකාශකයින්, මුද්‍රණකරුවන් ඇතුළු 83 දෙනෙක් සහභාගී වූහ.

සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය

ජාතික පුස්තකාල එකතුවට අයත් පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම මෙන් ම දිවයිනේ වෙනත් පුස්තකාලවල පොත් එකතු සංරක්ෂණය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම අංශයේ කාර්යභාරය වේ. මේ යටතේ ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා නිරතුරුව ම පවිත්‍ර කිරීම්, ධූමායනය කිරීම, පොත් බැඳීම, අලුත්වැඩියා කිරීම් වැනි කටයුතු මෙම අංශය යටතේ සිදු වේ.

පොත් බැඳුම්හල

ජාතික පුස්තකාලයේ පොත් සංරක්ෂණය කර බැඳුම් කටයුතු කිරීම පොත් බැඳුම්හලේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව 2019 වසරේ දී පොත් බැඳුම්හල මඟින් පහත සඳහන් කාර්යයන් ද සිදු කරන ලදී.

- ❖ සූචි පත්‍රිකා 95,200 සකස් කිරීම.
- ❖ බණ්ඩාරගම සෝමා ජයකොඩි පුස්තකාලයේ පොත් 146ක් බැඳීම.
- ❖ විවෘත පුස්තිකා පෙට්ටි 82ක් හා සංවෘත පුස්තිකා පෙට්ටි 162ක් සකස් කිරීම.
- ❖ විවිධ අංශවල අවශ්‍යතා අනුව ලේඛන සහ පොත්වල බැඳුම් කටයුතු සිදුකිරීම.
- ❖ ජාතික පුස්තකාල එකතුවේ පොත් 313ක බැඳීම් කටයුතු සිදු කිරීම

ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා මනාව පවත්වාගෙන යාම.

ජාතික පුස්තකාල එකතුවේ ආරක්ෂාව සඳහා නිරතුරුව ම පවිත්‍ර කිරීම්, අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර තිබේ. අවශ්‍ය අවස්ථාවල දී ජාතික පුස්තකාලයේ සංරක්ෂණ කටයුතු සඳහා උපදෙස් ලබාදීම සිදුකර තිබේ. තොරතුරු මූලාශ්‍ර ආරක්ෂා කිරීමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා උපදේශක කමිටු රැස්කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ද පියවර ගෙන තිබේ.

ධූමායනය

ජාතික පුස්තකාලයේ පොත් සංරක්ෂණය කිරීමේ එක් ක්‍රියාමාර්ගයක් වශයෙන් පොත් ධූමායනය කිරීමේ කටයුතු කරගෙන යනු ලැබේ. මේ යටතේ මෙම වසර තුළ පොත් 797ක් පොස්පින් ධූමායන හා පොත් 62ක් තයිමෝල් ධූමායන ක්‍රම මඟින් සංරක්ෂණය කරන ලදී.

ලේඛන ප්‍රතිසංස්කරණ කටයුතු

මේ යටතේ ජාතික පුස්තකාල එකතුවට අයත් පොත් 24ක පිටු 2697ක් නිරාමිලීකරණය කර තිබෙන අතර පිටු 3066ක් ටිෂු යොදා සකස් කරන ලදී. එසේම කළු මැදීම යටතේ පුස්කොළ පොත් 26ක පත්ඉරු 2048ක් කළු මැදීම සිදු කර තිබේ.

ලෝකයේ මතකය සුරැකීම පිළිබඳ වැඩසටහන (MOW)

ත්‍රිපිටක ග්‍රන්ථය ලෝක උරුමයක් බවට පත් කිරීමේ වැඩසටහන

- ත්‍රිපිටක ග්‍රන්ථය ලෝක උරුමයක් බවට පත් කිරීමේ කාර්යය සඳහා ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබූ විද්වත් කමිටුවේ සාමාජිකයෙකු ලෙස සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයේ අංශ ප්‍රධාන, උදය කබ්රාල් මහතා පත් වී තිබේ. ත්‍රිපිටක ග්‍රන්ථයට අදාළ තොරතුරු එක්රැස් කිරීම සඳහා 2019.06.01 සහ 02 දිනවල කුරුණෑගල ප්‍රදේශයේ විහාරස්ථානවල ක්ෂේත්‍ර චාරිකාවක නියැලී තිබේ.

මහාවංශය පුස්කොළ පොත ලෝක උරුමයක් බවට පත් කිරීමේ වැඩසටහන

- ලෝකයේ මතකය පිළිබඳ ලේඛනයට මහාවංශය පුස්කොළ පොත ඇතුළත් කිරීමට අදාළ නාම යෝජනා පත්‍රය සකස් කිරීම සඳහා ඊට අවශ්‍ය මූලාශ්‍ර පරීක්ෂා කිරීමට 2019 ජූනි 21 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හා දළදා මාළිගාවේ පුස්තකාලය වෙත ක්ෂේත්‍ර චාරිකාවක නිරත වී තිබේ. ඊට අමතරව හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ පවත්නා මහාවංශය පුස්කොළ පොත් පරීක්ෂා කිරීම සඳහා 2019.10.17 දින ක්ෂේත්‍ර චාරිකාවක නිරත වී තිබේ. මෙම පරීක්ෂා කිරීම් සඳහා ලෝකයේ මතකය සුරැකීමේ වැඩසටහනේ ජාතික කමිටුවේ සාමාජිකයින් කිහිප දෙනෙකු ද සහභාගී වී තිබේ.

අස්පර්ශනීය සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීමේ වැඩසටහන (ICH)

ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නාභිගත මධ්‍යස්ථානය (National Focal Point) ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කරනු ලැබේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පත්කර තිබෙන ජාතික කමිටුවේ සාමාජිකයන් ලෙස මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සහ සංරක්ෂණ අංශයේ අංශ ප්‍රධාන ද කටයුතු කරනු ලබයි.

නූල් රූකඩ කලාව ලෝක උරුම ලේඛනයට ඇතුළත් කිරීම

ශ්‍රී ලංකාවට ආවේණික අස්පර්ශණීය සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම යටතේ මෙරටට උරුම සාම්ප්‍රදායික කලාංගයක් වන නූල් රූකඩ කලාව (String Puppets) පිළිබඳ නාම යෝජනා සහිත වාර්තාව 2017 වසරේ දී යුනෙස්කෝ සංවිධානය වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර ඒ අනුව නූල් රූකඩ කලාව මෙරට ආවේණික හා සුරැකිය යුතු කලාංගයක් ලෙස යුනෙස්කෝ සංවිධානය විසින් පිළිගෙන එය අස්පර්ශණීය සංස්කෘතික උරුමය පිළිබඳ මානව සංහතියේ නියෝජිත ලේඛනයට (UNESCO Representative List of the Intangible Cultural Heritage of

Humanity) ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ විෂය විශේෂඥයන්ගේ සහාය ලබා ගනිමින් මෙම ලේඛන සකස් කිරීම සඳහා මණ්ඩලය මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී.

ජාතික ජනකතා සංග්‍රහයේ සංස්කරණ කටයුතු

අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරැකීමේ වැඩසටහන යටතේ මෙරටට ආවේණික ජනකතා ඒකරාශී කර ගනිමින් **ජාතික ජනකතා සංග්‍රහය** නමින් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන තිබේ. මේ සඳහා විශේෂ සංස්කාරක මණ්ඩලයක් පත්කර ජනකතා ඒකරාශී කිරීමේ කටයුතු සිදුකර තිබෙන අතර එය මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.

පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ මහජන පුස්තකාල වෙතින් එවන ලද සංරක්ෂණ පසුවිපරම් සමීක්ෂණ පත්‍රිකා පරීක්ෂා කිරීම සඳහා කමිටු රැස්වීම් පවත්වා අවසන් වාර්තාව සැකසීමට කටයුතු කර තිබේ. හොඳම සංරක්ෂණ මධ්‍යස්ථාන ලෙස තේරී පත්වූ මහජන පුස්තකාල 23ක් සඳහා සම්මාන හා සහතිකපත් පිරිනැමීමට කටයුතු කර තිබේ.

IFLA PAC මධ්‍යස්ථානයේ කටයුතු

යුනෙස්කෝ සංවිධානය මඟින් ඉන්දියාවේ ජාතික ඩිජිටල් පුස්තකාලය හා නවදිල්ලියේ ඉන්දියානු තාක්ෂණ ආයතනය එක්ව සංවිධානය කළ NDLI – UNESCO International Sysmposium on Knowledge Engineering for Digital Library Design 2019 නමින් 2019 දෙසැම්බර් 09-11 කාල සීමාව තුළ ඉන්දියාවේ නවදිල්ලි නගරයේ පැවැති සම්මන්ත්‍රණය සඳහා ආසියානු කලාපයේ සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන මධ්‍යස්ථාන (IFLA-PAC) නියෝජනය කරමින් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයේ අංශ ප්‍රධාන සහකාර අධ්‍යක්ෂ උදය කබ්රාල් මහතා සහභාගී වී තිබේ.

පුහුණු පාඨමාලා

සංරක්ෂණ අංශය මඟින් පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳව පුස්තකාල හා වෙනත් ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.

පුහුණු පාඨමාලාවේ නම	ස්ථානය	කා සඳහා ද?	සහභාගි වූ සංඛ්‍යාව	කාල සීමාව
ලේඛන සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව අදියර 1	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය	ලේඛනාගාර භාර නිලධාරීන් ලේඛනාගාර භාර නිලධාරීන්	11 12	2019.01.30 හා 31 2019.02.27 හා 28
ලේඛන සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	ගාල්ල වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය	ලේඛනාගාර භාර නිලධාරීන් ලේඛනාගාර භාර නිලධාරීන්	40	2019.05.21 හා 22 2019.08.05 හා 16
සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව අදියර 1	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය	මහජන පුස්තකාල නිලධාරීන්	11	2019.07.02, 03 සහ 04
සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලා	බියගම ප්‍රාදේශීය සභාව	මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා	19	2019.08.02
පොත් බැඳීමේ පුහුණු වැඩමුළුව	උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය	මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා	42	2019.09.26 සහ 27
සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව	නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය	උපාධි අපේක්ෂකයින්	08	2019.11.21
සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලා	පොළොන්නරුව බැඳිවැව මහජන පුස්තකාල ශ්‍රවණාගාරය	මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා	22	2019.12.03 සහ 04

පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා දුම්මල තෙල් නිස්සාරණය කිරීම

පුස්කොළ පොත් කළු මැදීම හා එහි සංරක්ෂණ කටයුතු සඳහා දුම්මල තෙල් භාවිතයට ගනු ලබන අතර මණ්ඩලය මඟින් දුම්මල තෙල් නිස්සාරණ කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව අවශ්‍යතාවය පරිදි දුම්මල තෙල් බෝතල් 23 ක් මෙම වසර තුළ නිස්සාරණය කර තිබේ.

පුස්තකාල ආපදා කළමනාකරණ කටයුතු

ජාතික පුස්තකාල ආපදා කළමනාකරණ සැලැස්මට අනුව සිදුවිය හැකි ආපදාවන් පිළිබඳව නිරන්තරව අවධානය යොමු කරනු ලබන අතර සුදුසු අවස්ථාවල දී ආපදා කළමනාකරණ කමිටුව කැඳවා අවශ්‍ය උපදෙස් ලබා දීම සිදුවේ. 2019 අප්‍රේල් මස 21 දින සිදු වූ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයත් සමගම ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ආරක්ෂාව සඳහා විශේෂ ආරක්ෂක වැඩපිළිවෙළක් ද සංවිධානය කරන ලදී . මීට අමතරව ජාතික පුස්තකාල සංරක්ෂණ උපදේශක කමිටුවේ උපදෙස් මත පොත් එකතුවේ ආරක්ෂාව සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සිදු කරන ලදී.

උපදේශක සේවා සැපයීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පොත් එකතුවේ ආරක්ෂාවට අවශ්‍ය සංරක්ෂණ උපදෙස් සැපයීමට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවලට අයත් පුස්තකාලවල මතුවන සංරක්ෂණ ගැටලු සම්බන්ධයෙන් අවස්ථානුකූලව උපදෙස් ලබාදීම සිදුවේ. මෙම උපදේශක සේවා යටතේ Link Natural Products (Pvt) Ltd ආයතනයට අයත් පුස්තකාලයේ පොත් සංරක්ෂණය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකර තිබේ. 2019 ජනවාරි මාසයේ ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ඇති වූ ගංවතුර තත්වය හේතුවෙන් හානියට පත් කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය සභාවට අයත් වට්ටකච්චි මහජන පුස්තකාලයේ පොත්පත් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට මණ්ඩලයීය නිලධාරීන් විසින් කටයුතු කර තිබේ.

පුස්තකාල පර්යේෂණ අංශය

පළාත් මට්ටමින් පුස්තකාල සමීක්ෂණ කටයුතු සිදු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ කටයුතු සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක තොරතුරු රැස් කිරීම, පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ තෝරාගත් මාතෘකා පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා එම තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, පුස්තකාල කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීම හා පර්යේෂණ වැඩමුළු පැවැත්වීම සහ පර්යේෂණ සම්මන්ත්‍රණ පැවැත්වීම මෙම අංශයේ මුඛ්‍ය කාර්යභාරය වේ.

ජාතික මට්ටමේ සමීක්ෂණ

i. ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත පාඨකයින්ගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත පාඨකයින්ගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමේ දී මුහුණපාන ගැටලු පිළිබඳ සමීක්ෂණයට අදාළව 2019.06.29 දින දෘශ්‍යාබාධිත සිසුන් 50ක් ශ්‍රී ලංකා අන්ධ ජන සේවා මණ්ඩලය වෙත කැඳවා ප්‍රශ්නාවලී ආශ්‍රයෙන් සම්මුඛ සාකච්ඡා පවත්වා තොරතුරු ලබා ගැනීමේ වැඩසටහනක් පවත්වා තිබේ. එම දත්ත ඇතුළත් කිරීම සඳහා SPSS මෘදුකාංගය ඇසුරින් දත්ත පදනමක් නිර්මාණය කර එම දත්ත විශ්ලේෂණ කටයුතු අවසන් කර වාර්තාව සම්පාදනය කිරීමට පියවර ගෙන තිබේ.

ii. කියවීමේ රුචිය පිළිබඳ ජාතික සමීක්ෂණය.

කියවීමේ රුචිය පිළිබඳ ජාතික සමීක්ෂණය සම්බන්ධව රැස්කර ගන්නා ලද දත්ත අදාළ දත්ත පදනමට ඇතුළත් කරන ලද අතර එම දත්ත විශ්ලේෂණය කර වාර්තා පිළියෙල කර ගැනීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ විශේෂඥ උපදෙස් ලබා ගැනීම සඳහා කටයුතු කර තිබේ.

iii. ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන විද්‍යායතන පුස්තකාල පිළිබඳ සමීක්ෂණය

ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ පුස්තකාල පිළිබඳ සමීක්ෂණයට අදාළ වාර්තා සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර අමතර තොරතුරු ලබා ගැනීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨ 06ක සහ ගුරු විද්‍යාල 04ක ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කර සමීක්ෂණ වාර්තාව සකස් කර තිබේ.

iv. ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියක් (Annotated Bibliography) සම්පාදනයට අදාළව තොරතුරු රැස් කිරීම.

මේ යටතේ දැනට රැස්කර ඇති උපාධි නිබන්ධනවල (ඉංග්‍රීසි මාධ්‍ය) ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු දත්ත පදනමකට ඇතුළත් කිරීමට කටයුතු කර තිබේ.

v. ශ්‍රී ලංකාවේ පුස්තකාල පිළිබඳ තොරතුරු නාමාවලිය (Directory of Libraries in Sri Lanka) යාවත්කාලීන කිරීම.

ශ්‍රී ලංකාවේ පුස්තකාල පිළිබඳ තොරතුරු නාමාවලිය යාවත්කාලීන කිරීම සිදු කරනු ලබන අතර ලබාගත් තොරතුරු ඇසුරෙන් පුස්තකාල 1033ක තොරතුරු දත්ත පදනමට ඇතුළත් කර තිබේ.

vi. වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය (Annual Research Symposium)

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වාර්ෂිකව සංවිධානය කරනු ලබන පර්යේෂණ සම්මන්ත්‍රණය NATLIB SYMPO -2019 නමින් 2019 ඔක්තෝබර් මස 31 දින ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙවර සම්මන්ත්‍රණයේ තේමාව වූයේ “Library Information and Documentation in the context of Transformation” යන්නයි. මෙම පර්යේෂණ සම්මන්ත්‍රණයේ මුඛ්‍ය දේශනය “Transformation of Library Services” තේමාව යටතේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති මහාචාර්ය රොහාන් සමරජීව මහතා විසින් පවත්වන ලදී. සම්මන්ත්‍රණය සඳහා පර්යේෂණ පත්‍රිකා 21ක් (සිංහල 08ක්, දෙමළ 02ක් සහ ඉංග්‍රීසි 11ක්) ඉදිරිපත් වූ අතර පත්‍රිකා ඇසුරෙන් පර්යේෂණ වෙළුමක් ද (Conference Proceedings) ප්‍රකාශයට පත් කරන ලදී. මෙම පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) අනුග්‍රාහකත්වය සපයා තිබේ.

පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

පශ්චාද් උපාධි පාඨමාලා හාදාරණ විද්‍යාර්ථීන්ගේ ප්‍රයෝජනය උදෙසා පර්යේෂණ ක්‍රමවිද්‍යා පිළිබඳ වැඩමුළු සංවිධානය කිරීම මණ්ඩලයේ පර්යේෂණ අංශය මඟින් සිදු කෙරේ. පර්යේෂණවල දත්ත විශ්ලේෂණය සඳහා SPSS මෘදුකාංගය භාවිතය සම්බන්ධයෙන් දෙදින වැඩමුළු දෙකක් (02) මෙම වසර තුළ පවත්වා තිබේ. එහි පළමු සහ දෙවන වැඩමුළු පිළිවෙළින් 2019 අගෝස්තු 08-09 දිනවල සහ 2019 සැප්තැම්බර් 18-19 යන දිනවල මණ්ඩලයීය

ශ්‍රවණාගාරයේ දී පවත්වා තිබේ. මෙම වැඩමුළු සඳහා සම්පත්දායකත්වය කොළඹ විශ්වවිද්‍යාලයේ සම්මානිත මහාචාර්ය කේ. ඒ. පී. සිද්ධිසේන මහතා විසින් ලබා දී තිබේ.

වෙනත් සේවා

පර්යේෂණ අංශය මඟින් සම්පාදනය කරනු ලබන පුස්තකාල පිළිබඳ සංඛ්‍යාලේඛන අත්පොත යාවත්කාලීන කර මණ්ඩලයීය වෙබ් අඩවිය වෙත ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ. මෙම සංඛ්‍යාලේඛන මහ බැංකු වාර්තාවට ඇතුළත් කිරීම සඳහා ද අවශ්‍ය කටයුතු යොදා තිබේ. ඊට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ශ්‍රී ලංකා ආර්ථික දත්ත 2019 ප්‍රකාශනයට ද මෙම තොරතුරු ඇතුළත් කිරීමට පියවර ගෙන තිබේ.

ඩිජිටල් පුස්තකාල ඒකකය

ජාතික පුස්තකාලයේ ඩිජිටල් පුස්තකාල කටයුතු පවත්වාගෙන යාමේ අරමුණෙන් ඩිජිටල් පුස්තකාල ඒකකය ස්ථාපිත කර තිබේ. මෙම ඩිජිටල් පුස්තකාල ඒකකය මඟින් ඩිජිටල්කරණය සඳහා තොරතුරු සම්පත් හඳුනා ගැනීම, ජාතික පුස්තකාල එකතුවේ හඳුනාගත් කෘති ඩිජිටල්කරණයට ලක් කිරීම, ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා දැනට එක්රැස් කර ඇති තොරතුරු Dspace දත්ත පදනමට ප්‍රවේශ කිරීම, kiyawamu.lk ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික සහාය ලබාදීම, පාඨකයින් සඳහා ඩිජිටල් තොරතුරු සේවා සැපයීම, ආදී කටයුතු මෙම ඒකකයෙන් සිදු කෙරේ.

ජාතික ඩිජිටල් පුස්තකාලය සඳහා විවෘත ප්‍රවේශ ප්‍රතිපත්තිය සැකසීම

ජාතික ඩිජිටල් පුස්තකාලයේ කාර්යයන් නියමිත ප්‍රතිපත්ති රාමුවක් ඔස්සේ පවත්වාගෙන යාමේ අරමුණෙන් ඩිජිටල් පුස්තකාල ප්‍රතිපත්තිය සකස් කර තිබේ. මෙම ප්‍රතිපත්තියට අමතරව ජාතික ඩිජිටල් පුස්තකාල තොරතුරු පාඨක ප්‍රජාව වෙත ලබා දීමේ දී එම තොරතුරු වෙත ප්‍රවේශ විය යුතු ආකාරය පිළිබඳව පොදු ප්‍රතිපත්ති රමුවක් ද සකස් කර තිබේ. මෙම ප්‍රතිපත්තිය විවෘත ප්‍රවේශ ප්‍රතිපත්තිය (Open Access Policy) ලෙස නම් කර තිබෙන අතර එම ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු අවසන් කර ඩිජිටල් පුස්තකාල වෙබ් පිටුවට ද ඇතුළත් කර තිබේ.

ජාතික පුස්තකාල එකතුව ඩිජිටල්කරණය කිරීම

මේ යටතේ ජාතික පුස්තකාලයේ පැරණි ගැසට් එකතුවේ 1956 ඔක්තෝබර් සිට 1975 අප්‍රේල් මාසය දක්වා ගැසට් පිටු 235,000ක් ඩිජිටල්කරණය කර තිබේ. ඊට අමතරව 2016 වසරේ ප්‍රකාශිත ගැසට්, පනත් හා පනත් කෙටුම්පත් ඩිජිටල්කරණයට ලක්කර ඩිජිටල් එකතුවට එක්කර තිබේ.

Kiyawamu.lk ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා මණ්ඩලයේ ප්‍රකාශන අංශය මඟින් විද්‍යුත් පොත් (e-pub) බවට පත් කරන ලද පොත් 99ක් දත්ත පදනමට ප්‍රවේශ කිරීම සහ ඒවා සකස් කර Kiyawamu.lk වෙබ් අඩවිය වෙත එක් කිරීමට පියවර ගෙන තිබේ. මෙම වෙබ් අඩවිය වෙත ප්‍රවේශවීම මඟින් පාඨකයින් වෙත මෙම පොත් පරිශීලනය කිරීමේ හැකියාව පවතී.

ව්‍යාප්ති සේවා අංශය

මෙම අංශයේ කාර්යභාරය වනුයේ රට තුළ විසිරී පවත්නා විවිධ වර්ගයේ පුස්තකාල සංවර්ධනය සඳහා අනුග්‍රහය දැක්වීම, උපදේශක සේවා සැපයීම, කියවීමේ රුචිය වර්ධනය කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරු දිරිමත් කිරීම, "ජාතික කියවීමේ මාසය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම, පුස්තකාල ශ්‍රේණිගත කිරීම, දුෂ්කර හා ග්‍රාමීය ප්‍රදේශවල පුස්තකාල සඳහා පොත් ආධාර ලබා දීම හා පුස්තකාලවල භෞතික පහසුකම් සංවර්ධනය කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම, පුස්තකාල සඳහා සුදුසු පොත් නිර්දේශ කිරීම, ඩිජිටල් පුස්තකාල සංවර්ධන ව්‍යාෘතිය ක්‍රියාත්මක කිරීම වැනි සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ. මීට අමතරව පුස්තකාල සඳහා අවශ්‍ය පුස්තකාල ලිපි ද්‍රව්‍ය හා උපකරණ මෙන් ම පොත්පත් සහනදායී මිල ගණන් යටතේ අලෙවි කිරීමේ අරමුණෙන් ජාතික පුස්තකාල පොත්හල පවත්වාගෙන යාම ද මෙම අංශය මඟින් සිදු කෙරේ.

ජාතික කියවීමේ මාසය වැඩසටහන

පාඨක ප්‍රජාව අතර පොතපත කියවීම දිරිගැන්වීමේ අරමුණෙන් 2004 වසරේ සිට සෑම වසරකම එළඹෙන ඔක්තෝබර් මාසය "ජාතික කියවීමේ මාසය "ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. මෙම වසරේ ජාතික කියවීමේ මාසය ට අදාළ චක්‍රලේඛය මුද්‍රණය කර ආයතන 385ක් වෙත යෙමු කරන ලද අතර ජාතික කියවීමේ මාසය 2019 යටතේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා එක්වී මිහිර පුවත්පත ඔස්සේ "මතක ද පොත" තේමාව යටතේ සිසු දරු දැරියන් සඳහා මෙතෙක් තමන් විසින් කියවන ලද පොතක තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. මෙම වසරට යෙදී තිබූ ජාතික කියවීමේ මාසය වැඩසටහනේ 15 වන සංවත්සරය නිමිත්තෙන් පුවත්පත් දැන්වීම් අතිරේකයක් පළ කරන ලදී. ජාතික කියවීමේ මාසයේ ජාතික උත්සවය 2019.12.19 දින ගරු අධ්‍යාපන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයේ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ අතර මෙවර සම්මාන ප්‍රදානෝත්සවයේ මුඛ්‍ය දේශනය ප්‍රවීන ලේඛක ආචාර්ය ඩබ්ලියූ. ඒ. අබේසිංහ මහතා විසින් "දරුවොත් එක්ක කියවමු" මැයෙන් සිදු කරන ලදී. ජාතික කියවීමේ මාසය වැඩසටහන යටතේ 2018 වර්ෂයේ ප්‍රශස්ත මට්ටමේ වැඩසටහන් සංවිධානය කළ පුස්තකාල ඇගයීම මෙම උළෙලට සමගාමීව සිදු වූ අතර එහි පළමු ස්ථානය මිනුවන්ගොඩ ප්‍රාදේශී සභාවට අයත් සිරිවර්ධන මහජන පුස්තකාලයට ද, දෙවන ස්ථානය යාපනය ප්‍රාදේශීය සභාවට අයත් කොකුවිල් මහජන පුස්තකාලයට සහ තෙවන ස්ථානය වැල්ලවාය ප්‍රාදේශීය සභාවට අයත් වැල්ලවාය මහජන පුස්තකාලයට ද හිමි විය. ඊට

අමතරව ප්‍රශස්ත මට්ටමේ කියවීමේ වැඩසටහන් සංවිධානය කළ දිවයින පුරා විසිරී තිබෙන පුස්තකාල 78කට ද සම්මාන ප්‍රදානය කිරීම සිදු විය.

මෙවර ජාතික කියවීමේ මාසයට සමගාමීව දිවයින පුරා ප්‍රාදේශීය කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කර තිබේ. ඒ අනුව 2019.07.06 දින මාරවිල මහජන පුස්තකාලය මඟින් සංවිධානය කර තිබූ කියවීම් කඳවුරු වැඩසටහනට සම්පත්දායකත්වය ලබාදීමට කටයුතු කර තිබේ. 2019.08.20-21 දිනවල කෑගල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික් ආවරණය වන පරිදි පුස්තකාල නිලධාරීන් හා ප්‍රජා සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් කියවීම් කඳවුරු පැවැත්වීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 02ක් සහ රසවින්දන වැඩසටහන් 04ක් පැවැත්වීමට කටයුතු කර තිබේ. හෝමාගම ප්‍රාදේශීය සභාවට අයත් හෝමාගම බණ්ඩාරනායක පුස්තකාලය සහ වෑතර කණිෂ්ඨ විද්‍යාලය මඟින් සංවිධානය කරන ලද කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් 02ක් 2019.11.22 දින සංවිධානය කරන ලදී. අයගම ප්‍රාදේශීය සභාව සංවිධානය කරන ලද කියවීම් ප්‍රවර්ධන වැඩසටහන සඳහා සම්පත්දායකත්වය ලබාදීමට කටයුතු කර තිබීම සහ පාදුක්ක සුනීත බන්ධනාගාර පාසලේ දරුවන් සඳහා රසවින්දන වැඩසටහනක් පැවැත්වීමට ද කටයුතු කර තිබේ.

ග්‍රාමීය පුස්තකාල සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ දුෂ්කර හා ග්‍රාමීය ප්‍රදේශවල සීමිත පහසුකම් යටතේ පවත්වාගෙන යනු ලබන පුස්තකාල සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ. මේ යටතේ පුස්තකාල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, පොත්පත් සහ ලී බඩු උපකරණ ලබා දීම, කාර්ය මණ්ඩල පුහුණු කිරීම ආදිය මණ්ඩලයේ අනුග්‍රහය යටතේ සිදු කෙරේ. ඒ අනුව 2019 වසරේ ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය යටතේ කුරුණෑගල හා නුවරඑළිය දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි පුස්තකාල 02ක් තෝරා ගන්නා ලදී. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවට අයත් ඇහැටුවැව මහජන පුස්තකාලය හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ මස්කෙළිය ප්‍රාදේශීය සභාවට අයත් මස්කෙළිය මහජන පුස්තකාලය සංවර්ධනය කිරීම සඳහා තෝරා ගන්නා ලදී. මෙම පුස්තකාල දෙක සඳහා පුස්තකාල උපකරණ සහ පොත් මිල දී ගැනීමට අදාළව කටයුතු සිදු කරන ලදී.

පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාර පුස්තකාලය සංවර්ධන වැඩසටහන

පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහනට සමගාමීව පොළොන්නරුව නව නගරයේ ඉදි කළ පුරාණ තාක්ෂණ කෞතුකාගාරය හා ඊට අනුබද්ධිත පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය 2019 ජූලි මස 03 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් විවෘත කරන ලදී. ගොඩනැගිල්ලේ දෙවන මහලේ ස්ථාපිත මෙම පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය රජරට ප්‍රදේශය පිළිබඳ රචිත පොත්, ශ්‍රී ලංකාවේ පැරණි තාක්ෂණික ක්‍රම හා දේශීය දැනුම පිළිබඳ තොරතුරුවලින් සමන්විත පොතපත, සඟරා ආදිය මෙන්ම නවීන තොරතුරු තාක්ෂණ පහසුකම්වලින් යුත් අංග සම්පූර්ණ පුස්තකාලයකි. මෙම පුස්තකාලය ස්ථාපිත කිරීමේ දී ඒ සඳහා වන සියලු අභ්‍යන්තර සැලසුම්, පොත්පත් තේරීම මෙන්ම

පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයට අවශ්‍ය සියලු තාක්ෂණික පහසුකම් සඳහා අවශ්‍ය උපදෙස් මණ්ඩලය මඟින් ලබා දී තිබේ.

මෙම පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වේ.

කළණ මිතුරු පොත් සුමිතුරු වැඩසටහන

පාසල් සිසුන් අතර පොතපත කියවීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් මෙම වැඩසටහන ආරම්භ කර තිබේ. 2019.05.23 හා 24 දෙදින කළණ මිතුරු පොත් සුමිතුරු සංශෝධිත චක්‍රලේඛය සැකසීමේ වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු කර තිබේ. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් ඇතුලු මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙකු සහභාගී වී තිබේ.

පුස්තකාල සඳහා උපදේශක සේවා සැපයීම

දිවයිනේ විවිධ පුස්තකාලවල විවිධ අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය උපදේශක සේවා සැපයීම මණ්ඩලයේ එක් ප්‍රධාන කාර්යභාරයක් වේ. මේ යටතේ පහත සඳහන් පුස්තකාල/ආයතන සඳහා මෙම වසර තුළ උපදේශක සේවා සපයා තිබේ.

පුස්තකාලයේ/ආයතනයේ නම	සපයන ලද සේවා
නාවින්න දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනය	මෙම ආයතනයෙහි නව පුස්තකාල ගොඩනැගිල්ල සැලසුම් කිරීමට අදාළ උපදෙස් ලබාදීම
දිවුලපිටිය ප්‍රාදේශීය සභාවට අයත් දූනගහ මහජන පුස්තකාලය	නව පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා උපදෙස් ලබාදීම
ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට අයත් ගොඩකවෙල මහජන පුස්තකාලය	පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා මූලික උපදෙස් සහිත වර්තාවක් ලබාදීම හා මූලික වශයෙන් පොත් බාර්කෝඩ් කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබාදීම
මහරගම තරුණ සේවා සභා පුස්තකාලය	පුස්තකාලයේ ඇති ගැටළු විසඳා ගැනීම සඳහා උපදෙස් ලබාදීම
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	අවිධිමත් පුස්තකාලය ක්‍රමවත්ව සකස් කර ගැනීම සඳහා වෘත්තීමය උපදෙස් ලබාදීම
කුලියාපිටිය ආදර්ශ මධ්‍ය පුස්තකාලය ඉදිකිරිම	පුස්තකාලය ඉදිකිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සැලසුම් සකස් කිරීම
ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පුස්තකාලය	උපදේශක කමිටුව නියෝජනය කිරීමට කටයුතු කිරීම
බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව	පුස්තකාල ඇගයීම් නිර්ණායක සංශෝධනය කිරීම සඳහා උපදෙස් ලබාදීම

පොත් ආධාර සැපයීමේ ව්‍යාපෘතිය

දිවයිනේ පුස්තකාලවල එකතු සංවර්ධනය කිරීමේ එක් මාර්ගයක් ලෙස පුස්තකාල වෙත පොත් ආධාර ලබා දීමේ වැඩසටහනක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළ පහත පරිදි පුස්තකාල සඳහා පොත් ආධාර ලබා දීම සිදු කරන ලදී. මේ යටතේ පාසල් පුස්තකාල 64ක්, මහජන පුස්තකාල 13ක්, දහම් පාසල් පුස්තකාල 22ක්, අමාත්‍යාංශ පුස්තකාල 03ක්, ආරක්ෂක අංශයේ පුස්තකාල 13ක් හා වෙනත් ආයතන පුස්තකාල 10ක් වශයෙන් පුස්තකාල 125ක් සඳහා රු.1,381,374.25ක් වටිනා පොත් 6947ක් පරිත්‍යාග කර තිබේ.

ප්‍රදර්ශන පැවැත්වීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් විවිධ ව්‍යාපෘති යටතේ අත්පත් කර ගනු ලබන පොත්පත් වලට අමතරව මණ්ඩලය මඟින් ප්‍රකාශිත පොත් හා පුස්තකාල ලිපි ද්‍රව්‍ය ප්‍රදර්ශනය හා අලෙවි කිරීමේ අරමුණෙන් වාර්ෂිකව විවිධ පොත් ප්‍රදර්ශන සඳහා සහභාගී වේ. ඒ අනුව 2019 වසරේ සහභාගී වූ ප්‍රදර්ශන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

ප්‍රදර්ශනය	**පැවති ස්ථානය**	**දිනය**
මහනුවර පොත් ප්‍රදර්ශනය 2019	මහනුවර සිටි සෙන්ටර්	2019.06.26 - 30
කොළඹ මහජන පුස්තකාල පොත් ප්‍රදර්ශනය 2019	කොළඹ මහජන පුස්තකාලය	2019.07.23 - 29
උතුරු මැද පළාත් පොත් ප්‍රදර්ශනය	සල්ගාදු ක්‍රීඩාංගනය, අනුරාධපුර	2019.07.25 - 28
කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (BMICH)	2019.09.20 - 29

පුස්තකාල ශ්‍රේණිගත කිරීම

පිළිගත් පුස්තාකල ප්‍රමිතිවලට අනුව පුස්තකාල ශ්‍රේණිගත කිරීම මණ්ඩලය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයකි. ඒ අනුව මෙම වසර තුළ දී මහජන පුස්තකාල 03ක් පළමුවන ශ්‍රේණියටත්, 08ක් දෙවන ශ්‍රේණියටත්, 02ක් තුන්වන ශ්‍රේණියටත් වශයෙන් මහජන පුස්තකාල 19ක් ශ්‍රේණිගත කරන ලදී.

පුස්තකාලයේ නම	අධිකාරි ආයතනය	ලබා දුන් ශ්‍රේණිය	ශ්‍රේණිගත කළ දිනය
වවුනියා මහජන පුස්තකාලය	වවුනියාව නගර සභාව	i ශ්‍රේණිය	2019.02.26
බුත්තල මහජන පුස්තකාලය	බුත්තල ප්‍රාදේශීය සභාව		
සෙනරත් පරණවිතාන මහජන පුස්තකාලය	බදුල්ල මහනගර සභාව		
කින්නියා මහජන පුස්තකාලය	කින්නියා නගර සභාව	ii ශ්‍රේණිය	2019.02.26
දඹගල්ල මහජන පුස්තකාලය	මඩුල්ල ප්‍රාදේශීය සභාව		
ගොඩකවෙල මහජන පුස්තකාලය	ගොඩකවෙල ප්‍රාදේශීය සභාව		
පල්ලේපොල මහජන පුස්තකාලය	පල්ලේපොල ප්‍රාදේශීය සභාව		
අලවතුගොඩ මහජන පුස්තකාලය	අකුරණ ප්‍රාදේශීය සභාව		
නාරංවල මහජන පුස්තකාලය	මහර ප්‍රාදේශීය සභාව		
මාරවිල මහජන පුස්තකාලය	නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව		
හංවැල්ල මහජන පුස්තකාලය	සීතාවක ප්‍රාදේශීය සභාව		
බණ්ඩාරවෙල මහජන පුස්තකාලය	බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව		2019.05.16
බියගම මහජන පුස්තකාලය	බියගම ප්‍රාදේශීය සභාව		2019.11.07
වෙන්නප්පුව මහජන පුස්තකාලය	වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව		
මහරූන්නගර් මහජන පුස්තකාලය	කින්නියා නගර සභාව	iii ශ්‍රේණිය	2019.01.08
ගල්නෑව මහජන පුස්තකාලය	ගල්නෑව ප්‍රාදේශීය සභාව		2019.01.30
ඇතිලිවැව මහජන පුස්කතාලය	වැල්ලවාය ප්‍රාදේශීය සභාව		2019.02.26
පුන්සිසිගම මහජන පුස්තකාලය	බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව		2019.05.16
තොටිල්ලගහවත්ත මහජන පුස්තකාලය	දිවුලපිටිය ප්‍රාදේශීය සභාව		

පුස්තකාල ප්‍රමිති සංශෝධනය

ශ්‍රී ලංකාවේ සියලුම මහජන පුස්තකාල, පාසල් හා පිරිවෙන් පුස්තකාල සහ දෙපාර්තමේන්තු හා ආයතනික පුස්තකාල නියමිත ප්‍රමිතිවලට අනුව ශ්‍රේණිගත කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සිදු කෙරේ. මෙහි අරමුණ වන්නේ අන්තර්ජාතික ප්‍රමිතිවලට අනුව ඒ ඒ පුස්තකාල මඟින් තම පාඨක ප්‍රජාව වෙත උසස් පුස්තකාල සේවාවක් ලබාදීම සඳහා පුස්තකාල පෙළ ගැස්වීමයි. පුස්තකාල ක්ෂේත්‍රයේ මෙන්ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කාලීනව සිදුවන වෙනස්වීම්වලට අනුව පුස්තකාල සඳහා අවශ්‍ය ප්‍රමිති ද සංශෝධනය කිරීම සිදු විය යුතුය. ඒ අනුව මහජන පුස්තකාල ප්‍රමිති සඳහා කෙටුම්පත සකස් කොට උපදේශක අනුකමිටුව වෙත

යොමු කිරීමට කටයුතු කර තිබේ. මේ අතර පාසල් පුස්තකාල ප්‍රමිති සංශෝධනය කිරීම සඳහා ද අවශ්‍ය පියවර ගෙන තිබේ.

ජාතික පුස්තකාල පොත් අලෙවිහල

ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ බිම් මහලේ ජාතික පුස්තකාල පොත්හල පවත්වාගෙන යනු ලබන අතර එය පවත්වාගෙන යාමේ මූලික අරමුණ වන්නේ සහනදායී මිල ගණන් යටතේ පොත්පත් ඇතුළු පුස්තකාල ලිපි ද්‍රව්‍ය සහ පුස්තකාල සඳහා අවශ්‍ය අනෙකුත් උපකරණ අලෙවි කිරීමයි. මෙම වසරේ පොත්පත් සහ සෙසු ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් ලද ආදායම රු. 3,749,509.80 කි

පුස්තකාල පොත් නිර්දේශ කිරීමේ ව්‍යාපෘතිය

පුස්තකාලවල පාඨක පරිහරණය සඳහා සුදුසු පොත් නිර්දේශ කිරීමේ ව්‍යාපෘතිය මඟින් පාඨකයින් සඳහා කියවීමට සුදුසු පොතපත පිළිබඳ මඟ පෙන්වීමක් සිදු කරනු ලබන අතර මෙම වසර තුළ පොත් 65ක් සඳහා නිර්දේශ ලබා දී තිබේ.

ගෘහස්ථ පුස්තකාල ලියාපදිංචි කිරීම

ගෘහස්ථව මෙන්ම රාජ්‍ය නොවන හා ආයතනගතව පවත්වාගෙන යනු ලබන පුස්තකාල නිසි ක්‍රමවේදයක් යටතේ ලියාපදිංචි කිරීම මණ්ඩලය මඟින් සිදු කෙරේ. මේ යටතේ පහත සඳහන් පුස්තකාල ලියාපදිංචි කර තිබේ.

පුස්තකාලයේ නම	ලිපිනය
Light of the World Library	නො ඒ/04, මහල් නිවාස, 80 වත්ත, ලුණාව, මොරටුව
සණස මහර නුගේගොඩ මහජන පුස්තකාලය	සණස මහර ආදර්ශ පුස්තකාලය මහර, නුගේගොඩ, කඩවත
ඩී. එන්. රාජපක්ෂ දහම් පුස්තකාලය	මිහිඳු දහම් පාසල, ඉහලගම, ගම්පහ
උගව අඹේවෙල සුබසාධක සමිති පුස්තකාලය	උගව අඹේවෙල සුබසාධක සමිතිය, උගව අඹේවෙල, හෙවනකුඹුර
ලාවුළුපිටිය ග්‍රාම සංවර්ධන සමිති මහජන පුස්තකාලය	ලාවුළුපිටිය ග්‍රාම සංවර්ධන සමිති, ලාවුළුපිටිය, වතුරුගම

මණ්ඩලයීය ප්‍රකාශන දායකත්වය ලබාදීම

මණ්ඩලය මඟින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන අලෙවිකර ගැනීමේ උපක්‍රමයක් වශයෙන් ආයතන සඳහා වාර්ෂික දායකත්වය ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබේ. ඒ අනුව පහත සඳහන් ප්‍රකාශන සඳහා වාර්ෂික දායකත්වය ලබා දී තිබේ.

ප්‍රකාශනයේ නම	ආයතන සංඛ්‍යාව
01. ජාතික ග්‍රන්ථ නාමාවලිය	75
02. ප්‍රලේඛා සඟරාව	61
03. ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව	31

විශේෂ දින සැමරීම

ලෝක ළමා පොත් දිනය සැමරීම වෙනුවෙන් 2019.04.02 දින කොළඹ මහජන පුස්තකාලයේදී පාසල් සහ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ 2019.10.29 දින අන්තර්ජාතික පාසල් පුස්තකාල දිනය සැමරීමේ වැඩසටහනක් බොරැල්ල සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලයේ දී පැවැත්වීමට කටයුතු කර තිබේ.

Library News කෙටි පණිවුඩ සේවාව (SMS) ආරම්භ කිරීම

ආයතනික සන්නාම ප්‍රවර්ධනය මූලික කරගනිමින් මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව විවිධ පිරිස් වෙත අවබෝධයක් ලබාදීම සඳහා මෙම කෙටි පණිවුඩ සේවාවා (SMS) ආරම්භ කර තිබේ. මෙම කෙටි පණිවුඩ සේවාව යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මඟින් සිදු කරනු ලබන විවිධ සේවා පිළිබඳ ප්‍රචාරයක් ලබාදීම සිදු වේ.

අධ්‍යාපන හා පුහුණු අංශය

අධ්‍යාපන හා පුහුණු අංශයේ මූලික කාර්යභාරය වන්නේ දැනට සේවයේ නියුතු පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩමුළු පැවැත්වීම මඟින් ඔවුන් වෙත අඛණ්ඩ වෘත්තීය පුහුණුවක් ලබාදීම වේ. මේ යටතේ මහජන, පාසල්, පිරිවෙන් ආදී විවිධ වර්ගවලට අයත් පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. ඊට අමතරව පුස්තකාල ක්ෂේත්‍රයේ කාලීන ප්‍රවණතා පිළිබඳව පුස්තකාලයාධිපතිවරු මෙන්ම විවිධ වෘත්තියවේදීන් දැනුවත් කිරීම සිදුවේ.

මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා වැඩමුළු / සම්මන්ත්‍රණ

මහජන පුස්තකාල සේවාවේ ගුණාත්මකභාවය වර්ධනය උදෙසා කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය සභා මට්ටමින් සිදු වේ. මේ සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ද සහාය ලබාගෙන අදාළ වැඩමුළු පවත්වා තිබේ. 2019 වසරේ දී පහත සඳහන් ප්‍රදේශවල මහජන පුස්තකාල වෙනුවෙන් වැඩමුළු පවත්වා තිබේ.

- වැල්ලවාය ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ Koha පුස්තකාල කළමනාකරණ මෘදුකාංගයේ අඩුපාඩු හා පුස්තකාලයේ අංශ වෙන් කිරීම, වෙනත් සේවා කටයුතු පිළිබඳව උපදෙස් ලබාදීමට කටයුතු කිරීම.

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) එක්ව සිදු කරනු ලබන ඩිජිටල් පුස්තකාල සංවර්ධන වැඩසටහනට අදාළව වැලිගෙපොල ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ නවීකරණ කටයුතු සඳහා උපදෙස් ලබාදීම සහ මඩකලපුව මහජන පුස්තකාලයේ පරිගණක දත්ත පදනම සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම, ව්‍යාප්ති සේවා හා ළමා අංශයේ ප්‍රතිසංවිධාන කටයුතු පිළිබඳ උපදෙස් ලබාදීම
- 2020 තිරසර පුස්තකාල සංවර්ධන වැඩසටහනේ පළමු වැඩසටහන නුවරඑළිය දිස්ත්‍රික්කය කේන්ද්‍රකර ගනිමින් 2019.06.25, 26 සහ 27 යන දිනයන්හි දී නුවරඑළිය මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පවත්වා තිබේ. මේ සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සාමාජිකයින් 75 දෙනෙක් සහභාගී වූහ. මෙහි දෙවන වැඩසටහන 2019.09.09, 10, සහ 11 යන දිනයන්හි දී යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික් මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා යාපනය මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා තිබේ. පුස්තකාල කළමනාකරණයට අමතරව සංරක්ෂණ හා පොත් බැඳුම්කරණය පිළිබඳව ද පුහුණු වැඩසටහන් සංවිධානය කර තිබේ.

පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩමුළු/ සම්මන්ත්‍රණ

දිවයිනේ පාසල් පුස්තකාල සඳහා ස්ථීර වෘත්තීය පුස්තකාලයාධිපතීන් සීමිත සංඛ්‍යාවක් සේවයේ නිරතවන බැවින් මෙම ගැටලුව මඟහරවා ගනු වස් පාසල් පුස්තකාල භාරව කටයුතු කිරීම සඳහා ඒ ඒ පාසල්වල ගුරුභවතුන් පුස්තකාලවල සේවය සඳහා අනුයුක්ත කරනු ලැබේ. මෙම පිරිස වෙත පුස්තකාල කටයුතු පිළිබඳ අවබෝධයක් ලබාදීමේ අරමුණෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පුහුණු වැඩමුළු සංවිධානය කරනු ලැබේ. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව පාසල් පුස්තකාලවල සේවය කරනු ලබන පුස්තකාල සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන සඳහා පුහුණු මොඩියුලයක් සකස් කිරීමට කටයුතු තර තිබේ. මෙම පුහුණු මොඩියුලය භාවිත කරමින් පහත සඳහන් ප්‍රදේශවල පුහුණු වැඩසටහන් සංවිධානය කර තිබේ.

අධ්‍යාපන කලාපය	**ස්ථානය**	**සහභාගී වූ සංඛ්‍යාව**	**කාලසීමාව**
ගාල්ල අධ්‍යාපන කලාපය	ගාල්ල කලේගාන පියතිස්ස විද්‍යාලය	45	2019.05.24
කින්නියා අධ්‍යාපන කලාපය	කින්නියා කලාප අධ්‍යාපන කාර්යාලයීය ශ්‍රවණාගාරය	64	2019.08.06-07
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව	බත්තරමුල්ල රන්මඟපාය ශ්‍රවණාගාරය	56	2019.07.04-05 සහ 2019.11.21

ගාල්ල සහ උඩුගම අධ්‍යාපන කලාප	නොවිධිමත් අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය, කලේගාන, ගාල්ල	86	2019.08.19-21
දෙනියාය අධ්‍යාපන කලාපය	දෙනියාය මධ්‍ය මහා විද්‍යාලය	54	2019.09.17-19
නුවරඑළිය අධ්‍යාපන කලාපය	නුවරඑළිය පේන්ටර් අනුස්මරණ විද්‍යාලය	70	2019.11.06
වලපනේ අධ්‍යාපන කලාපය	වලපනේ කලාප අධ්‍යාපන කාර්යාලය	46	2019.11.07

පිරිවෙන් පුස්තකාල හා ආගමික පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩමුළු/ සම්මන්ත්‍රණ

- කොළඹ දිස්ත්‍රික් ඉස්ලාම් ආගමික පාසල් පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහනක් 2019.06.18 සහ 19 යන දිනයන්හි දී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර තිබුණ ද රටේ පැවැති වාතාවරණය හේතුවෙන් (පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයේ බලපෑම මත) මෙම වැඩසටහන පැවැත්වීම පසුවට කල් තබා තිබේ.
- ගාල්ල දිස්ත්‍රික් පිරිවෙන් පුස්තකාලයාධිපතිවරුන් සඳහා පුහුණු වැඩසටහනක් 2019.10.10 සහ 11 යන දිනයන්හි ගාල්ල කරන්දෙණිය මඩකුඹුර මහා පිරිවෙන් පරිශ්‍රයේ දී පවත්වන ලද අතර ඒ සඳහා ගිහි පැවිදි සම්පත්ලාභීන් 58 දෙනෙකු සහභාගී වී තිබේ.

පුස්තකාල මෘදුකාංග පිළිබඳ තාක්ෂණික සේවා වැඩමුළු

- 2019.09.25, 26 හා 27 යන දිනයන්හි අම්පාර දිස්ත්‍රික් මහජන පුස්තකාලයාධිපතිවරුන් සඳහා කොහා (Koha) මෘදුකාංගය පිළිබඳ පුහුණු වැඩමුළුවක් අම්පාර පරිගණක සම්පත් මධ්‍යස්ථානයේ දී පැවැත්වූ අතර ඒ සඳහා සම්පත්ලාභීන් 28 දෙනෙකු සහභාගී වී තිබේ.

සේවාස්ථ පුහුණු වැඩමුළු

මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙතින් පුහුණුව ලබාගැනීමට අපේක්ෂා කරන පිරිස් සඳහා කෙටිකාලීනව සේවයේ යෙදෙමින් දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් පුහුණුව ලබාදීම සිදු වේ. එක් සේවාස්ථ පුහුණු වැඩසටහනක උපරිම කාලසීමාව දින පහකි. සේවාස්ථ පුහුණු වැඩමුළු සම්බන්ධයෙන් විධිමත් පුහුණු මොඩියුලයක් ද මණ්ඩලය විසින් සකස් කරන ලදී.

පුහුණු ක්ෂේත්‍රය	**කා සඳහා ද**	**කාල සීමාව**
පුස්තකාල කළමනාකරණය	පෞද්ගලික අයදුම්කරුවන්	2019.03.11 - 15
හඬපට සංරක්ෂණය	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පුස්තකාලයේ නිලධාරීන්	

පුස්තකාල කළමනාකරණය	ජාතික බෝ නොවන රෝග විද්‍යායතනය සහ ජාතික ශිල්ප සභාවට අයත් පුස්තකාල නිලධාරීන්	2019.06.17 - 21
පුස්තකාල කළමනාකරණය	පනාගොඩ හමුදා කඳවුරේ පුස්තකාලය භාර නිලධාරීන් සහ ශ්‍රී ලංකා පළාත් පාලනය පිළිබඳ ආයතනයේ පුසත්කාලය භාර නිලධාරීන්	2019.10.28 - 2019.11.01
පුස්තකාල කළමනාකරණය සහ පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණුව	මරදාන කාර්මික විද්‍යාලයීය පුස්තකාලයේ නිලධාරීන්	2019.12.02-06
Koha මෘදුකාංගයට දත්ත ප්‍රවිශ්ට කිරීම	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු පුස්තකාලයේ නිලධාරීන්	2019.12.23-24

කියවීමේ රුචිය වර්ධනය පිළිබඳ වැඩමුළු

- 2020 තිරසර පුස්තකාල සංවර්ධන වැඩසටහනට සමගාමීව 2019.06.27 වන දින නුවරඑළිය ගාමිණී ජාතික පාසලේ සිසුන් 150 දෙනෙකු සඳහා සාහිත්‍ය රසාස්වාදය, ළමා ලේඛකයන් බිහිකර ගැනීම හා පාසල් සිසුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා තිබේ.

වෙනත්

- ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට අයත් ලේඛන හා තොරතුරු කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව අදාළ නිරීක්ෂණ සිදු කිරීමෙන් පසු ලේඛන කළමනාකරණය පිළිබඳ ව්‍යාපෘති සැලැස්මක් සකස් කර දීමට කටයුතු කර තිබේ.
- කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ අධ්‍යයන කටයුතුවල නිරත සිසුන් සඳහා සීමාවාසික පුහුණුව ලබා දීමට අදාළව අවබෝධතා ගිවිසුමකට එළඹීමට 2019 අගෝස්තු මස 30 දින සිදු විය.

ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලුම ප්‍රකාශන ආධාර ව්‍යාපෘති මෙහෙයවීම හා පවත්වාගෙන යාම, මණ්ඩලයේ සියලු ම ප්‍රකාශන පළ කිරීම, සම්භාව්‍ය සාහිත්‍ය කෘති සංස්කරණය, පරිවර්තනය හා ප්‍රකාශයට පත් කිරීම මෙම අංශයේ මූලික කාර්යභාරය වේ. ඊට අමතරව අන්තර්ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘතිය යටතේ ISBN/ISSN/ISMN අංක නිකුත් කිරීම හා විවිධ මට්ටමින් ලේඛක ප්‍රජාව වෙත ප්‍රකාශන කටයුතු පිළිබඳව උපදෙස් හා අනුග්‍රහය දැක්වීම ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය යටතේ සිදුවේ.

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකික ලේඛක ප්‍රජාවට ග්‍රන්ථකරණය සඳහා අනුග්‍රහය දැක්වීමේ අරමුණෙන් 1984 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය සඳහා අත්පිටපත් ඉදිරිපත් කිරීමට ලේඛක ලේඛිකාවන්ට අවස්ථාව ලබා දෙනු ලබන අතර ඉදිරිපත් කරනු ලබන අත්පිටපත් සඳහා අනුග්‍රහය ලබාදීම සිදු වේ. මෙම ව්‍යාපෘතිය සඳහා අත්පිටපත් ඉදිරිපත් කිරීමට පසුගිය වසර කිහිපය තුළ වර්ෂය පුරාම අවස්ථාව ලබා දුන්න ද ව්‍යාපෘතිය කළමනාකරණය කිරීමේදී එම ක්‍රමවේදය බාධාවක් වූ බැවින් මෙම වසරේ සිට වසරේ අවසාන කාර්තුව තුළ පමණක් අත්පිටපත් ඉදිරිපත් කිරීමට මණ්ඩලය තීරණය කර තිබේ. ඒ අනුව අත්පිටපත් භාර ගැනීම 2019 සැප්තැම්බර් මස 16 දින සිට දෙසැම්බර් 16 දින දක්වා ක්‍රියාත්මක විය. එම අත්පිටපත් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

විෂය ක්ෂේත්‍රය	සිංහල	දෙමළ	ඉංග්‍රීසි	එකතුව
ශාස්ත්‍රීය සහ පර්යේෂණ කෘති	32	01	02	35
නිර්මාණාත්මක කෘති (ස්වතන්ත්‍ර හා පරිවර්තන)	47	02	02	51
යොවුන් සාහිත්‍ය කෘති	14		01	15
ළමා ප්‍රබන්ධ	18		04	22
එකතුව				123

මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර පසුගිය වසර කිහිපය (2015, 2016, 2017 සහ 2018 වසරවල) විසඳුම් ලබාදීමට නොහැකිව ඉතිරි වූ අත්පිටපත් ප්‍රකාශන උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කොට සුදුසු විසඳුම් ලබා ගැනීමට කටයුතු කර තිබේ. ඒ අනුව 2019 වසරේ දී ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක කෘති 47ක් සහ ළමා හා යොවුන් සාහිත්‍ය කෘති 11ක් සඳහා අනුග්‍රහය ලබාදීමට කටයුතු කර තිබේ. අනුග්‍රහය ලද කෘති පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ 2019 වසරේ අනුග්‍රහය ලද කෘති

යොමු අංකය	ග්‍රන්ථ නාමය	විෂය	කර්තෘ
2015/95	Marmageethangal	නවකතා	A.C. Jereena
2016/J/14	එකැස් බෙරේ කතන්දරේ	ළමා ප්‍රබන්ධ	ඉරංගා සමින්දනී වීරක්කොඩි
2016/J/15	අපි මෙහෙමයි බේරෙන්නේ	ළමා ප්‍රබන්ධ	තුසිත රණසිංහ
2016/J/16	Poems of young minds	පද්‍ය	ලලිතා සෝමතිලක
2016/J/27	අපූරු මිනිසෙක්	යොවුන් සාහිත්‍ය	කේ. ඒ. කුසුම් කාරියප්පෙරුම
2016/J/65	සුදු පැංචා	ළමා ප්‍රබන්ධ	කුමාරි නේරංජනා
2016/02	ටිකිරිබණ්ඩා පානබොක්කේ	චරිත කතා	යසපාල වනසිංහ
2016/43	Etnirvisaranal	කෙටි කතා	T. Malarchelvan
2016/111	සමගියේ පාලම	නවකතා	ප්‍රේමරත්න සෙනරත්පතිරණ
2016/123	නිති රැකවරණය ඔබයි අම්මේ	කෙටි කතා	නීතා කුමුදුනී මහවත්ත
2016/139	කරුවල ගෙදර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්	පර්යේෂණ ශාස්ත්‍රීය කෘති	එස්. අයි. සී. රණසිංහ
2016/158	මැදියම අග	නවකතා	එම්. එම්. සුජිත් ප්‍රසංග
2016/166	පවුල් සංස්ථාවේ බිඳ වැටීම්	සමාජ විද්‍යාව	සුරේෂ් මිහිර බණ්ඩාර
2016/172	Buddhist Nikayas in Sri Lanka	Buddhism	Prof. T. G. Kulathunga
2016/173	දසදිග සැරිය	නවකතා	එල්. ජී. එස්. එම්. ධර්මරත්න
2016/174	හච්කෝ හමුවීම	කෙටි තකා	හද්‍රා ඉන්ද්‍රානි අමරකෝන්
2016/178	පඤ්චතන්ත්‍රය ලබ්ධ ප්‍රනාම	පර්යේෂණ ශාස්ත්‍රීය කෘති	පූජ්‍ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි
2016/181	නයිජීරියානු ජනකතා	ජනකතා	අතුල ආර් පෙරේරා
2016/182	Ennpparuweli	ශාස්ත්‍රීය	Rameez Abdullah
2017/Y/008	අක්බාර් මිජබල් කතා	ළමා ප්‍රබන්ධ	අතුල ආර්. පෙරේරා
2017/J/07	මේ අවුරුදු කාලේ	ළමා ප්‍රබන්ධ	ජයතිස්ස බොරළුගොඩ
2017/J/23	ලෝකෙට ලොක්කා මං තමයි	ළමා ප්‍රබන්ධ	කේ. ද. එස්. සුදසිංහ
2017/J/27	ගජ මිතුරා	ළමා ප්‍රබන්ධ	පියසිරි මාතරගේ
2017/J/34	රන්පියුම	ළමා ප්‍රබන්ධ	ආරියපාල රත්නායක
2017/J/55	රිදී පැංචි	ළමා ප්‍රබන්ධ	කුමාරි අබේගුණවර්ධන
2017/07	ජයග්‍රාහී පාසල් නාට්‍ය සමඟ සරළ නාට්‍ය විග්‍රහය	නාට්‍ය	එල්. බී. වීරසිංහ
2017/15	කරළිය මත භූමිකා	නාට්‍ය	උදේනි චන්ද්‍රසිරි
2017/18	දහඅට මසක් අඟහරු මත	විද්‍යා ප්‍රබන්ධ	රංජිත් ඉලුප්පිටිය
2017/19	සුද්දීගේ මළගම	නවකතා	එම්. එන්. පෙරේරා
2017/24	ජාතක කතා අද්භූතය හා යථාර්ථය	සිංහල ශාස්ත්‍රීය	ගිහාන් මධුසංඛ
2017/26	හතරැස් මුහුණ රවුම්	නවකතා	ධර්මසේන රණසිංහආරච්චි
2017/27	Kothumalikknai	Novel	U. Nesar
2017/35	අළු කුමාරයාගේ කතාව	නවකතා	ඩී. රංග සමන් විජේසිංහ
2017/42	Wonder of our Forest	Environment	Douglas B. Ranasinghe

2017/47	Realities in life	Poetry	Lalitha Somathilaka
2017/47	19th Century Political Work and Social Institutions	පර්යේෂණ ශාස්ත්‍රීය කෘති	Rev. Dr. Olaganwatte Chandrasiri
2017/50	මීගමු දූව ආශ්‍රිත ජනමාධ්‍ය	ජන සන්නිවේදනය	පී. එම්. එස්. ආර්. කේ. පී. රත්නායක
2017/52	අන්තිම ඉල්ලීම	කෙටි කතා	ගුණරත්න ඒකනායක
2017/62	සංක්‍රාන්තිය	නවකතා	හේමලතා රාජගුරු
2017/68	සිහල ජනවහර	භාෂාව	කේ. බී. මානෑව
2017/72	වහරමු හොඳින් විමසා	භාෂාව	යසවර්ධන රුද්‍රිගු
2017/79	එලීසා	නවකතා	නන්දදාස වික්‍රමාරච්චි
2017/83	මහාමානව	පර්යේෂණ ශාස්ත්‍රීය කෘති	ඩී. පී. ඒ. සමරනායක
2017/84	ජීවාංකුර	පද්‍ය	ජී. හසාන් වීරංග
2017/86	හත්කෝරළය ආශ්‍රිත ජනකතා	ජනකතා	එච්.එම්. සෝමරත්න
2017/89	Journalism in Sri Lanka	Journalisum	Thevathas
2017/91	Kanavulsgam	පද්‍ය	R.M.M.Sherif
2017/Y/03	බෝසත් කතන්දරේ	ගද්‍ය	අනුරසිරි හෙට්ටිගේ
2017/Y/10	Delhi Tiger	Poetry	M. M. B. G. Karunarathna
2017/Y/16	ඒ දණ්ඩෙන් එගොඩට	යොවුන් සාහිත්‍ය	සි. කොඩිතුවක්කු
2017/Y/22	20 Jataka Stories	Poetry	K.Samaranayake
2017/94	මිනිස්සු කිඹුල්ලු හා නිල්වලා ගඟ	පර්යේෂණ ශාස්ත්‍රීය කෘති	ජයතිස්ස තෙන්නකෝන්
2017/102	යක්කලේ වාහෙලා	නවකතා	ඥානසේන පතිරණ
2017/111	අනගිදරුවෝ	නවකතා	සුසිලා නන්දනී මායාගොඩ
2017/115	සහෝදර මුහුණුවර	පද්‍ය	රංජිත් මල්ලියාවඩු
2017/124	පස් පංගුවේ පංගුකාරයෝ	ආයුර්වේදය	මහාචාර්ය පියසිරි අමිලසිත් යාපා
2018/J/03	මේ නිල් අහස හා අපි	ළමා ප්‍රබන්ධ	පී. ධර්මසේන
2018/J/09	කාගෙද බෙර හඬ	ළමා ප්‍රබන්ධ	වනිතා රත්නායක

(J ළමා කෘති) (Y යොවුන් සාහිත්‍ය කෘති)

නව ප්‍රකාශන මිල දී ගැනීමේ ව්‍යාපෘතිය

පොත් ප්‍රකාශන ක්ෂේත්‍රයේ නියැලෙන ලේඛක ලේඛිකාවන්ට අනුග්‍රහයක් දැක්වීමේ අරමුණෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මේ යටතේ මිල දී ගැනීමේ කටයුතු සිදු කෙරෙන වසරට සාපේක්ෂව එම වසරේ හෝ ඊට ආසන්න වසර දෙකකට පෙර මුද්‍රිත කෘති ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන අතර තෝරා ගන්නා කෘතිවලින් පිටපත් ප්‍රමාණයක් මිල දී ගෙන ලේඛකයන්ට අනුග්‍රහය දැක්වීම සිදු වේ. ඒ අනුව 2019 වසරේ දී ග්‍රන්ථ නාම 134කින් රු. 502,593.00ක් වටිනා පොත් මිල දී ගැනීමට කටයුතු කර තිබේ. භාෂාව අනුව මිල දී ගත් ග්‍රන්ථ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

මාධ්‍යය	ග්‍රන්ථ සංඛ්‍යාව
සිංහල	81
දෙමළ	14
ඉංග්‍රීසි	09

සම්භාව්‍ය කෘති සංස්කරණයෙන් ප්‍රකාශයට පත් කිරීම

පන්සිය පනස් ජාතක පොත

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සම්භාව්‍ය කෘති සංස්කරණයෙන් ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ **පන්සිය පනස් ජාතක පොතේ** සංශෝධිත දෙවන මුද්‍රණය සිදුවෙමින් පවතී. වෙළුම් පහකින් (05) සමන්විත මෙම ග්‍රන්ථයේ ප්‍රස්ථාවනාව සමඟ i, ii, iii සහ iv වශයෙන් කාණ්ඩවලට වෙන් කර තිබේ. මෙම වෙළුම් අතුරින් ප්‍රස්ථාවනාව සමඟ i, සහ ii කාණ්ඩවල මුද්‍රණ කටයුතු පසුගිය වසරේ දී නිම කර තිබේ. මෙහි iii වන කාණ්ඩයේ මුද්‍රණ කටයුතු 2019 වසරේ දී නිම කර තිබෙන අතර iv වන කාණ්ඩයේ සෝදුපත් පරීක්ෂාව සිදු කරමින් පවතී. මෙහි එක් වෙළුමකින් පිටපත් දහසක් බැගින් මුද්‍රණය කරනු ලැබේ.

බුත්සරණ ග්‍රන්ථය

මණ්ඩලයේ සම්භාව්‍ය කෘති සංස්කරණයෙන් ප්‍රකාශයට පත් කිරීමේ වැඩසටහන යටතේ **බුත්සරණ** ග්‍රන්ථය සංස්කරණය කර ප්‍රකාශයට පත් කිරීමට මෙම වසරේ කටයුතු කර තිබේ. මෙම සංස්කරණ කාර්යයේ මූලික කටයුතු 2009 වසරේ ආරම්භ කළ අතර සංස්කරණ කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය වෙත පැවරිණි. සංස්කරණ කටයුතුවල දී එම අධ්‍යයන අංශයේ මහාචාර්ය රෝහිණී පරණවිතාන, මහාචාර්ය ආනන්ද තිස්ස කුමාර සහ ආචර්ය ප්‍රේමසිරි නාගසිංහ යන මහත්ම මහත්මීන්ගේ දායකත්වය ලැබී තිබේ. මෙම කෘතිය ජනගත කිරීම 2019 ජූලි මස 30 දින ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. මෙම උත්සවයේ දී සම්මානිත මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස, මහාචාර්ය රෝහිණී පරණවිතාන යන මහත්ම මහත්මීන් විසින් බුත්සරණ ග්‍රන්ථය පිළිබඳ ඇගයුම් දේශන පවත්වන ලදී.

පුස්තකාල විද්‍යා ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම

පුස්තකාල විද්‍යා විෂය ක්ෂේත්‍රයේ දැනුම පුළුල් කිරීමේ අරමුණෙන් මෙම විෂය ක්ෂේත්‍රයට අදාළව නව කෘති මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කිරීම හෝ වෙනත් භාෂාවලින් රචිත කෘති සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කර ප්‍රකාශයට පත් කිරීම සිදු වේ. ඒ යටතේ අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය මඟින් ප්‍රකාශිත Guidelines for Libray Services to Prisoners - 3rd Edition උපදෙස් සංග්‍රහය **සිරකරුවන් සඳහා පුස්තකාල සේවා පිළිබඳ මාර්ගෝපදේශ 3 වන සංස්කරණය** නමින් පරිවර්තනය කර ප්‍රකාශයට පත් කිරීමට කටයුතු යොදා තිබේ. මෙම

පරිවර්තනය ආචාර්ය ප්‍රමිලා ගමගේ සහ සුනිල් වලිමුනි විසින් පරිවර්තනය කර තිබෙන අතර එහි සියලු සංස්කරණ කටයුතු අවසන් කර මුද්‍රණය සඳහා සූදානම් කර තිබේ.

වෙනත් මණ්ඩලයීය ප්‍රකාශන

ප්‍රලේඛා සඟරාව

මණ්ඩලය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන **ප්‍රලේඛා** ත්‍රෛමාසික සඟරාවේ 2019 ජනවාරි මාර්තු සහ අප්‍රේල් ජූනි කලාප ‘‘දේශපාලන සාහිත්‍ය’’තේමා කර ගනිමින් ද, ජූලි සැප්තැම්බර් කලාපය ‘‘පරිවර්තන සාහිත්‍ය’’තේමාව යටතේ ද 2019 ඔක්තෝබර් - දෙසැම්බර් කලාපය ’’කවිය’’තේමා කර ගනිමින් ද ප්‍රකාශයට පත් කර තිබේ.

ජාතික පුස්තකාල විමර්ශන සඟරාව

අර්ධ වාර්ෂික සඟරාවක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන මෙම සඟරාවේ 2019 ජනවාරි ජූනි කලාපයේ සංස්කරණ කටයුතු අවසන් කර මුද්‍රණයට සූදානම් කර තිබේ.

NATNET LANKA **පුවත් හසුන**

පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් ඒකරාශී කර මෙම පුවත් හසුන NATNET LANKA නමින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම වසරේ පළමු කලාපය ප්‍රකාශයට පත් කළ අතර 2019 ජූලි - දෙසැම්බර් කලාපයට අදාළව ප්‍රවෘත්ති සංස්කරණ කටයුතු සිදු කර තිබේ.

මණ්ඩලයීය ප්‍රකාශන මුද්‍රණය කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් කාලීනව ප්‍රකාශයට පත් කරනු ලබන විවිධ ප්‍රකාශන මණ්ඩලයීය රිසෝග්‍රාෆ් යන්ත්‍රය මඟින් මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කරනු ලැබේ. මේ යටතේ මුද්‍රණය කරනු ලබන ප්‍රකාශන කිහිපයකි.

- **ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය හා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව මුද්‍රණය**
  ශ්‍රී ලංකාවේ පළවන ප්‍රකාශනවල තොරතුරු ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය මාසිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2019 වසර තුළ 2019 වසරේ අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා කලාප 09ක් මුද්‍රණය කර තිබේ.
- ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව වාරික ප්‍රකාශනයක් වන අතර වසරකට කලාප 04ක් ප්‍රකාශයට පත් කෙරේ. 2019 වසර තුළ 2018 දෙවන කලාපයේ සිට සිව්වන කලාපය දක්වා කලාප 03ක් මුද්‍රණය කර තිබේ.

ළමා කෘති සම්පාදනය පිළිබඳ මූලික ප්‍රමිති සම්පාදනය

ළමා ග්‍රන්ථ සැකසීමේ ප්‍රමිති ඇතුළත්ව සිංහල බසින් සම්පාදනය කරන ලද උපදෙස් සංග්‍රහය දෙමළ භාෂාවට පරිවර්තනය කර තිබේ. දෙමළ බසින් ළමා ග්‍රන්ථකරණයේ නියැලෙන ලේඛකයින්ට මෙය ප්‍රයෝජනවත් මූලාශ්‍රයකි.

අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය (ISBN/ISSN/ISMN)

ශ්‍රී ලංකාව තුළ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන පොතපත ඇතුළු සියලු ප්‍රකාශන සඳහා අන්තර් ජාතික ප්‍රමිති අංක නිකුත් කිරීමේ ජාතික මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරනු ලබන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයයි. ඒ අනුව සියලු ම පොත් සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN) ද, සියලු ම වාර ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති මාලික අංකය (ISSN) ද, ප්‍රස්තාර සහිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකය (ISMN) ද නිකුත් කෙරේ.

අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය (ISBN)

ISBN අංක ක්‍රමය යටතේ පොත් සඳහා අංක ලබා ගත් ප්‍රකාශකයන් පිළිබඳ තොරතුරු ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සිදුවේ. 1986 වර්ෂයේ සිට මෙතෙක් ශ්‍රී ලංකාවට හිමිව තිබූ කලාපීය හැඳුණුම් අංකය වන 955 අංකය වෙනුවට 2019 ජනවාරි මස සිට කලාපීය හැඳුණුම් අංකය 624 ලෙස ISBN ජාත්‍යන්තර මධ්‍යස්ථානය මඟින් ප්‍රකාශයට පත් කර තිබේ. 2019 වසර තුළ ISBN අංක 11627ක් නිකුත් කර ඇත. ISBN සඳහා අලුතින් ලියාපදිංචි වූ ප්‍රකාශකයින් 516 දෙනෙකුගේ තොරතුරු ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ. අංක ලබාගත් ප්‍රකාශකයින් විසින් ස්වේච්ඡාවෙන් ලබා දුන් මුද්‍රිත කෘති 1503 ක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත භාර දී තිබේ. ප්‍රකාශකයින් සඳහා ISBN අංක නිකුත් කිරීමෙන් ලද වාර්ෂික ආදායම රු.1,162,700.00කි.

අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක ක්‍රමය (ISSN)

මෙම අංක ක්‍රමය 1993 වර්ෂයේ දී මෙරටට හඳුන්වා දී තිබෙන අතර මේ මඟින් ශ්‍රී ලංකාවේ පළවන සියලු ම මාලික ප්‍රකාශනවලට ප්‍රමිති අංක නිකුත් කෙරේ. මීට ඉහතින් සඳහන් කළ අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය යටතේ පොත්වලට ලැබෙන සියලු ම වරප්‍රසාද හා පහසුකම් මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ පළවන වාර ප්‍රකාශනවලට ද හිමි වේ. 2019 වසරේ දී මාලික ප්‍රකාශන 201ක් සඳහා ISSN අංක නිකුත් කර තිබේ. ඉන් ලද වාර්ෂික ආදායම රු. 20,100.00කි. ISSN අංක නිකුත් කිරීම යටතේ ප්‍රකාශකයින් විසින් ලබා දුන් වාරික ප්‍රකාශන 135ක් ජාතික පුස්තකාලය වෙත ලබා දීමට කටයුතු කර තිබේ. 2019 නොවැම්බර් මස 12 සිට 16 දක්වා කාලය තුළ ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැති ISSN අධ්‍යක්ෂවරුන්ගේ 44 වන සැසිවාරය සඳහා අධ්‍යක්ෂිකා සේනානි බණ්ඩාර මහත්මිය සහභාගී වී තිබේ.

අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක ක්‍රමය (ISMN)

අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක ක්‍රමය යටතේ ප්‍රස්තාර සහිත සංගීත ප්‍රකාශන සඳහා අංක නිකුත් කෙරේ. මෙම වසර තුළ දී ලබාදුන් ISMN අංක සංඛ්‍යාව 83කි. ප්‍රකාශකයන් සඳහා මෙම අංක නිකුත් කිරීම මඟින් ලද ආදායම රු. 8,300.00කි. අංක ලබාගත් ප්‍රකාශකයින් විසින් ස්වේච්ඡාවෙන් ලබා දුන් මුද්‍රිත කෘති 09ක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත භාර දී තිබේ.

ප්‍රකාශක වර්ගය	ග්‍රන්ථ නාම සංඛ්‍යාව		
	ISBN	**ISSN**	**ISMN**
වාණිජ මට්ටමේ ප්‍රකාශකයින්	5366	53	33
රජයේ සහ රජයේ නොවන ආයතනික ප්‍රකාශකයින්	3838	140	10
කර්තෘ/පෞද්ගලික ප්‍රකාශකයින්	2423	08	40
එකතුව	11627	201	83

ISBN/ ISSN/ ISMN නිකුත් කිරීම සඳහා අන්තර්ජාලය ඔස්සේ ගෙවීම් ක්‍රමවේදයක් සැකසීම

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සිට අන්තර්ජාලය ඔස්සේ මුදල් ගෙවීම් සිදුකර ප්‍රමිති අංක ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීමේ ක්‍රමයක් ලෙස මෙම ක්‍රමවේදය යෝජනා කර තිබේ. මේ මඟින් පොත් ප්‍රකාශයින්ට හෝ ලේඛකයින්ට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පැමිණීමෙන් තොරව පහසුවෙන් අංක ලබා ගැනීම සඳහා පහසුකම් සැලසේ. මාර්ගගත පද්ධතිය මඟින් ජාත්‍යන්තර ප්‍රමිති අංක ලබා ගැනීම සඳහා සකස් කිරීමට නියමිත දත්ත පද්ධතිය නිර්මාණය කිරීම සඳහා මිල ගණන් කැඳවීමෙන් අනතුරුව Nekfa Australia නැමැති ආයතනය තෝරාගත් අතර එම ආයතනය මණ්ඩලයේ නිලධාරීන් සමඟ අවස්ථා කිහිපයක දී සාකච්ඡා සිදු කර ISBN, ISSN සහ ISMN අංක නිකුත් කිරීමට සුදුසු දත්ත පදනමක් සකස් කිරීමට කටයුතු කර තිබේ. එම දත්ත පදනමේ මූලික සැකැස්ම මෙම වසර තුළ දී සකස් තිබේ.

දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුවට සාහිත්‍ය පාලමක් ග්‍රන්ථ පරිවර්තන ව්‍යාපෘතිය

ජාතීන් අතර සුහදතාව වර්ධනය කිරීමේ අරමුණෙන් සහ ඒ ඒ භාෂාවලින් රචිත නිර්මාණාත්මක සාහිත්‍ය පිළිබඳ එකිනෙක ජාතීන් අතර අවබෝධයක් ඇති කිරීමේ අරමුණෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙහි පළමු අදියර යටතේ වසර 2000න් පසුව රචිත තෝරාගත් කෙටිකතා 14ක් මෙම ව්‍යාපෘතිය සඳහා පාදක කර ගනු ලැබේ. තෝරාගත් කෙටිකතා 14න් 07ක් සිංහල බසින් රචිත සහ 07ක් දෙමළ බසින් රචිත කෙටිකතා වේ. මෙම කෙටිකතාවල හිමිකරුවන් සඳහා නියමිත කර්තෘභාගය ගෙවීම සිදුකොට ඔවුන්ගේ එකඟතාවය ලබාගැනීමට ද මණ්ඩලය කටයුතු කර තිබේ. මෙම වැඩසටහනේ නිල සමාරම්භක උත්සවය ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් 2019 මාර්තු මස 28 දින අධ්‍යාපන අමාත්‍යාංශ

ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. මෙම පරිවර්තන ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා සිංහල හා දෙමළ බසින් රචිත තෝරාගත් කෙටිකතාවලින් සමන්විත කෘතියක් සම්පාදනය කිරීමට ද පියවර ගෙන තිබේ.

Kiyawamu.lk ව්‍යාපෘතිය මුද්‍රිත කෘති විද්‍යුත් කෘති බවට පත් කිරීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා එක්ව ක්‍රියාත්මක කරනු ලබන Kiyawamu.lk වෙබ් පිටුව වෙත යොමු කිරීම සඳහා නව කෘති 63ක් විද්‍යුත් කෘති (e-pub)බවට පත් කර තිබේ.

ග්‍රන්ථ නාමය	කර්තෘ
01. රත්තරන් පුතෙක්	සුමනසිරි පන්නිලහෙට්ටි
02. අසබැඳි සබැඳි	හංසනී ප්‍රමුදිතා
03. මඩුවන්වලට පියමන්	ශාන්ත දුනුකාර
04. දෘශ්‍ය විද්‍යාත්මක මානව විද්‍යාව	සුමින්ද කිත්සිරි ගුණරත්න
05. මාදනා	බෝධි විද්‍යාරත්න
06. දෙලොවක් අතර දෙදෙනෙක්	සඳරුවන් පනාකඩුව
07. Rose Gutter	Mr. W. A. N. A. Wijesuriya
08. ගාන්ධර්වයා අශ්වයා සහ මහල්ලා	තනුජා එන්. අයගම
09. ජෛවගතික කෘෂිකර්මය	විමලා දේවනාරායන
10. නාග මාණික්‍යය	සෝමරත්න හරස්ගම
11. චෞර ප්‍රපාත	එම්. ඩබ්ලිව්. ජනදාස
12. මේ නිවාඩු කාලයයි	සෝමලතා වෛද්‍යරත්න
13. අහස් වියන	සෝමලතා වෛද්‍යරත්න
14. නැවුම් සුළඟ	අයිරින් නානායක්කාර
15. ජෝර්ජ් කීට්	එච්. බී. ගුණරත්න
16. රත්නපුර දිස්ත්‍රික්කයේ අභිලේඛන සහ පැරණි ස්මාරක	එච්. එම්. ජයන්ත විජේරත්න
17. අවෛදික දර්ශන හා ජෛන විඥාන විභාගය	මහාචාර්ය දයා එදිරිසිංහ
18. වසන්ත සිරිත	තුසිත ජයසුන්දර
19. නෙලා	ඉන්ද්‍රානි රත්නසේකර
20. එලිසා	නන්දදාස වික්‍රමආරච්චි
21. පියවරු සහ පුත්තු	නන්දදාස වික්‍රමආරච්චි
22. භව පුෂ්ප	දික්ඇල්ලේ විජයතිලක
23. මහා මානව	ප්‍රේමරත්න සමරනායක
24. ජන සංගීත විමර්ශන	ඉරංගා සමින්දනී වීරක්කොඩි
25. අස්තංගත	ජයන්ත වීරක්කොඩි
26. දඬුලේනා	කීර්ති වැලිසරගේ
27. මායා තීර්ථ	කීර්ති වැලිසරගේ
28. කාල සර්ප	කීර්ති වැලිසරගේ

29. අත් මිදුම	කීර්ති වැලිසරගේ
30. දෙබරු	රාජා කරුණාදාස
31. චෝරකර්ම සහ තවත් කතා	විජය මිහිඳුකුලසූරිය
32. හත්කෝරළය ආශ්‍රිත හේන් ගොවිතැන	සෝමරත්න බෝගස්වැව
33. පස් පංගුවේ පංගුකාරයෝ	මහාචාර්ය පියසිරි අමිලසිත් යාපා
34. බයිස්කෝප් උන්මාදය	පියසේන වික්‍රමගේ
35. කුටුම්බ චක්‍ර	වනිතා රත්නායක
36. ශ්‍රී ලාංකේය මහනුවර සම්ප්‍රදායේ විහාර බිතුසිතුවම් කලාව සහ එහි නව ප්‍රවණතා	ඩබ්ලිව්.එම්.පී. සුදර්ශන බණ්ඩාර
37. බින්තැන්නේ වැදි බස	සඳරුවන් ලොකුහේවා
38. රොබට් බේඩන් පවල්	උදිත අලහකෝන්
39. මහත්මා ගාන්ධි	උදිත අලහකෝන්
40. සිංහබාහු එනකං	අනුරසිරි හෙට්ටිගේ
41. දිමියා	අනුරසිරි හෙට්ටිගේ
42. හිතුවක්කාරී	එච් බී ගුණරත්න
43. මධුලෝලීත්වය සුව කිරීමේ පහසු මග	ධනුෂ්ක නිරංග දිසානායක
44. අකාල යාත්‍රා	කැතලීන් ජයවර්ධන
45. දාදු කැටය	කැතලීන් ජයවර්ධන
46. ධාරා	කැතලීන් ජයවර්ධන
47. සත්‍යකාම	කැතලීන් ජයවර්ධන
48. බලන්කඩතුරා හැර දෑසේ	කැතලීන් ජයවර්ධන
49. වැද්දා	චන්ද්‍ර ශ්‍රී රණසිංහ
50. රතු ලොව වසන්තය	පී. එම්. ප්‍රීති ශ්‍රීකාන්ත
51. සුපිරි මතකය	අසෝක මහේන්ද්‍ර පලිහවඩන
52. සිද්ධාර්ථ	ආචාර්ය ඩබ්ලියූ. ඒ. අබේසිංහ
53. සමාජය නිරුවත් කළ ගැහැනිය	ආචාර්ය ඩබ්ලියූ. ඒ. අබේසිංහ
54. ගාන්ධි ආදර්ශය	ආචාර්ය ඩබ්ලියූ. ඒ. අබේසිංහ
55. වෙස් මුහුණු	මහාචාර්ය ආරියරත්න ඇතුගල
56. සංජානනය හා සන්නිවේදනය	මහාචාර්ය ආරියරත්න ඇතුගල
57. ඊශ්වර විංසතිය	අරුණ ලොකුලියන
58. ශාන්තිකර්ම හා සන්නිවේදනය	අරුණ ලොකුලියන
59. සිංදුගෙදර ළමයි	නිලන්ති ප්‍රනාන්දු
60. මහ සමයම හා එෆික් නාට්‍යවේදය	මහාචාර්ය ආරියරත්න ඇතුගල
61. ඒදණ්ඩෙන් එගොඩ	චන්ද්‍රසේන කොඩිතුවක්කු
62. සන්නිවේදනය	මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස
63. පුස්තකාල හා විඥාපන විද්‍යාව සංකල්ප හඳුන්වාදීම සාමාන්‍ය අවබෝධය	ජූඩ් මුතුකුඩ සහ මෛත්‍රී ජයසුන්දර

සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය මඟින් ග්‍රන්ථකරණයේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේද සම්බන්ධයෙන් මෙන්ම අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN, ISSN, ISMN) පිළිබඳව ලේඛකයින්, ප්‍රකාශකයින් මෙන්ම මෙම ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරනු ලබන පිරිස් වෙත අවබෝධයක් ලබාදීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. 2019 වසරේ සිදු කරන ලද එවැනි වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- **ග්‍රන්ථ සංස්කරණයේ දී හා ප්‍රකාශනයේ දී අනුගමනය කළ යුතු මූලික ක්‍රමවේද පිළිබඳ සම්මන්ත්‍රණය**

  ග්‍රන්ථ සංස්කරණයේ දී හා ප්‍රකාශනයේ දී අනුගමනය කළ යුතු මූලික ක්‍රමවේදය පිළිබඳ දෙදින වැඩමුළුවක් 2019 දෙසැම්බර් මස 17 - 18 දිනවල ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. මෙම දෙදින සම්මන්ත්‍රණයේ දී ප්‍රකාශන හා මුද්‍රණ ශිල්පයට අදාළව මහාචාර්ය ජේ.බී. දිසානායක, මහාචාර්ය ජයදේව උයන්ගොඩ, මහාචාර්ය රත්නසිරි අරංගල, ගමගේ සුමනසේකර, ඩබ්ලිව්. සුනිල් සහ සේනානි බණ්ඩාර යන මහත්ම මහත්මීන් විසින් දේශන පවත්වන ලදී.
- ග්‍රන්ථ සැකසීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් මධ්‍යම පළාතේ ලේඛක ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 ජූලි මස 11 දින මහනුවර පල්ලේකැලේ පිහිටි මධ්‍යම පළාත් සභා ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. මේ සඳහා මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්ක නියෝජනය කරමින් ලේඛක ලේඛිකාවන් රැසක් සහභාගී වූහ.
- ලේඛන කුසලතා හා ප්‍රකාශන ප්‍රමිති පිළිබඳ රත්මලාන ප්‍රදේශයේ පාසල් සිසු දරු දැරියන් දැනුවත් කිරීමේ එක්දින වැඩසටහනක් 2019 ඔක්තෝබර් මස 24 දින රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ.

පුස්තකාල සහයෝගිතා අංශය

දේශීය හා විදේශීය පුස්තකාල සමඟ අන්තර්සහයෝගිතාව පවත්වාගෙනයාම මෙම අංශයේ මූලික කාර්යභාරය වේ. ඒ යටතේ ලෝකයේ විවිධ රටවල ජාතික පුස්තකාල හා වෙනත් ක්ෂේත්‍රයන්ට අයත් පුස්තකාල මෙන්ම අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය, යුනෙස්කෝ සංවිධානය ආදි සංවිධාන සමඟ සබඳතා පැවත්වීම සහ දේශීය වශයෙන් විවිධ පුස්තකාල, පුස්තකාල සංවිධාන හා සංගම් සමඟ සබඳතා පැවත්වීම ද පුස්තකාල සහයෝගිතා අංශයේ කාර්යභාරය වේ.

හුවමාරු සේවාව

ප්‍රකාශන හුවමාරු සේවාව යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මඟින් සම්පාදිත ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ සහ NATNET LANKA පුවත් හසුනෙහි පිටපත් සාක් කලාපීය

රටවල් ඇතුළු රටවල් 27ක ජාතික පුස්තකාල වෙත යොමු කර තිබේ. ඊට අමතරව චීනය, ජපානය, දකුණු කොරියාව හා සිංගප්පූරුව යන රටවල ජාතික පුස්තකාල මඟින් කරන ලද ඉල්ලීම්වලට අනුව මෙරට ප්‍රකාශිත තෝරාගත් ප්‍රකාශන එම ජාතික පුස්තකාල වෙත යොමු කිරීමට ද පියවර ගෙන තිබේ.

මීට අමතරව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා හා වෙනත් කාලීන ප්‍රකාශන මෙරට තෝරාගත් පුස්තකාල හා ආයතන වෙත හුවමාරු සේවා යටතේ නොමිලයේ ලබාදීමට කටයුතු කරනු ලැබේ.

හුවමාරු සේවා යටතේ මෙරට විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් ප්‍රකාශිත කෘති ද ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත ලබා ගැනීම සිදු වේ. මේ යටතේ මෙම වසර තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතනවලින් ද ප්‍රකාශන ලබා ගැනීමට කටයුතු කර තිබේ.

ආයතනික සාමාජිකත්වය යාවත්කාලීන කිරීම

- 2019 වසරේදී අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) වාර්ෂික දායකත්වය අලුත් කිරීමට පියවර ගත් අතර ඒ සඳහා රු.102,116.00ක මුදලක් වැය කරන ලදී. IFLA සංවිධානය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන IFLA සඟරාවෙහි (IFLA Journal) 2019 දෙසැම්බර් කලාපය අත්පත් කර ගැනීමට පියවර ගෙන තිබේ.

පුස්තකාල ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ජාල (Network) යාවත්කාලීන කිරීම

- සිංගප්පූරුවේ මේරි මාර්ටින්ස් (Mary Martins) සමාගම මඟින් පවත්වාගෙන යනු ලබන Law Lanka Annual Access ජාලයේ සාමාජිකත්වය යාවත්කාලීන කිරීමට පියවර ගෙන තිබේ. මේ මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරනු ලබන පනත්, පනත් කෙටුම්පත්, නීති වාර්තා, නව නීති වාර්තා ආදිය භාෂා තුනෙන්ම ගවේෂණය සඳහා පහසුකම් සලසා තිබේ.
- නවදිල්ලියේ ඉන්දියානු ජාත්‍යන්තර මධ්‍යස්ථානය (India International Centre) මඟින් පවත්වාගෙන යනු ලබන DELNET (Development of Library Network) ජාලයේ සාමාජිකත්වය ලබාගෙන තිබෙන අතර, මෙම තොරතුරු ජාලය තුළ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයට අදාළ ලිපි ඇතුළත් වේ. 2019 වසර සඳහා මෙම ජාලයේ වාර්ෂික දායකත්වය අලුත් කිරීම සහ දත්ත පදනම සඳහා ප්‍රවේශ පහසුකම් ලබාගැනීමට කටයුතු කර තිබේ.
- දේශීය වශයෙන් සංවිධානගත ජාල සේ සැලකෙන Agrinet (කෘෂි ක්ෂේත්‍රය හා සම්බන්ධ තොරතුරු ජාලය), HeLLIS (සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ තොරතුරු ජාලය) වැනි තොරතුරු ජාල සමඟ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිරන්තර වශයෙන්

සම්බන්ධතා පවත්වනු ලැබේ. මෙම තොරතුරු ජාල මඟින් ඒ ඒ ක්ෂේත්‍රවල විද්‍යාර්ථීන් සඳහා නවතම තොරතුරු පහසුවෙන් සොයා ගැනීමට පහසුකම් සැලසේ. HeLLIS තොරතුරු ජාලයේ වාර්ෂික සම්මන්ත්‍රණය සඳහා මෙම අංශයේ අංශ ප්‍රධාන සහභාගී වී තිබේ.

දත්ත පදනම් යාවත්කාලීන කිරීම

- "Proquest" ආයතනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන පුස්තකාල හා විඥාපන විද්‍යා ජාලයේ පූර්ණ පෙළ LISA (Library and Information Science Full Text) අන්තර්ජාලය ඔස්සේ ගවේෂණය කළ හැකි දත්ත පදනමක් වන අතර මේ මඟින් පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රකාශයට පත් වී තිබෙන බොහෝ ලිපිවල පූර්ණ පෙළ ගවේෂණය කිරීමේ පහසුව හිමි වේ. පුස්තකාල විද්‍යාව හදාරන විද්‍යාර්ථීන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් දත්ත පදනමකි. මෙම දත්ත පදනම පරිශීලනය කිරීම සම්බන්ධයෙන් පාඨක සේවා අංශයෙන් නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව මෙහි පූර්ණ පෙළ ප්‍රවේශය ලබා ගැනීම සුදුසු බව තීරණය කර තිබේ.

ජාත්‍යන්තර සඟරා සඳහා දායකත්වය අලුත් කිරීම

ජාත්‍යන්තර භූගෝල විද්‍යා සංගමය (National Geographic Society) මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන "National Geographic" සඟරාව සඳහා වාර්ෂික දායකත්වය ලබා ගැනීමට කටයුතු කර තිබේ. මාසිකව ප්‍රකාශයට පත්වන මෙම සඟරාවේ පිටපත් ජාතික පුස්තකාලයේ පාඨක පරිහරණය සඳහා එක් කෙරේ.

පළාත් පුස්තකාල සේවා මණ්ඩල සඳහා දායකත්වය

ශ්‍රී ලංකාවේ දැනට සබරගමුව, මධ්‍යම, උඟව සහ උතුරුමැද යන පළාත් සභා ආශ්‍රිතව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ක්‍රියාත්මක වේ. මේ අතරින් සබරගමුව, මධ්‍යම හා උඟව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ආශ්‍රිතව උසස් මට්ටමේ පළාත් මධ්‍ය පුස්තකාල ද ආරම්භ කර තිබේ. පළාත් පුස්තකාල සේවා මණ්ඩල කටයුතු සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබා දෙන අතර මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සියලුම අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනය කරනු ලබයි. පළාත් පුස්තකාල සේවා මණ්ඩල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වාර්ෂිකව පවත්වනු ලබන සමුළුව 2019 අගෝස්තු මස 23 දින මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ දී පවත්වන ලදී. මෙම සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මධ්‍යම පළාත් ආණ්ඩුකාර කීර්ති තෙන්නකෝන් මහතා සහභාගී විය. සමුළුවේ මුඛ්‍ය දේශනය "නූතන සාහිත්‍යය ප්‍රබෝධය හා ලංකා විශ්වවිද්‍යාලයේ දායකත්වය"යන මැයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සම්මානිත මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස මහතා විසින් සිදු කරන ලදී. පළාත් පුස්තකාල සේවා මණ්ඩලය නියෝජනය කරමින් සභාපතිවරු, අධ්‍යක්ෂවරු ඇතුළු නිලධාරිහු රැසක් සහභාගී වූහ. මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස මහතාගේ දේශනය ඇසුරෙන් සකස් කළ කුඩා ග්‍රන්ථය ද බෙදා හැරීමට කටයුතු කරන ලදී.

පුස්තකාල ක්ෂේත්‍රයේ වෘත්තීය සංගම් සමඟ සහයෝගිතාව

ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය සංගම් කිහිපයක් පවත්වාගෙන යනු ලැබේ. විශේෂයෙන් රාජ්‍ය සහ පළාත් පුස්තකාල සේවාවට අදාළව මෙන්ම මහජන හා පාසල් පුස්තකාල ක්ෂේත්‍ර නියෝජනය කරමින් වෘත්තීය සංගම් පවත්වා ගෙන යනු ලැබේ. මෙම වෘත්තීය සංගම් විසින් ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා යෝජනා සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ. මෙම වර්ෂයේ ද එවැනි ඉල්ලීම් රාශියක් මණ්ඩලය වෙත යොමු වූ අතර එම ඉල්ලීම් සඳහා අවශ්‍ය විසඳුම් ලබා දීමට පියවර ගෙන තිබේ.

ක්‍රමෝපාය සැලසුම් අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලු ම අංශවල කටයුතු සැලසුම් කිරීමට දායකවීම, අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම ක්‍රමෝපාය සැලසුම් අංශය මඟින් ඉටු කෙරේ. මීට අමතරව පාලන කටයුතු විධිමත් කරගෙන යාම සඳහා අවශ්‍ය සහාය ලබාදීම ද මෙම අංශයේ වගකීම වේ. ආයතනයේ විවිධ අංශවල ප්‍රගති වාර්තා ඇසුරෙන් වාර්ෂික, අර්ධ වාර්ෂික හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම, මාසිකව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම ද අංශයේ කාර්යභාරය වේ. ඊට අමතරව විදේශගතවන මණ්ඩලයීය නිලධාරීන් සඳහා අවශ්‍ය ගුවන් ප්‍රවේශ පත්‍ර, වීසා ලබා ගැනීම ආදී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම ද ක්‍රමෝපාය සැලසුම් අංශය මඟින් සිදු කෙරේ.

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම

සියලු ම අංශ ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් ඒ ඒ අංශවල ප්‍රගතිය විමසා බැලීම සඳහා මාසිකව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීම් සංවිධානය කරනු ලැබේ. ඒ අනුව 2019 වසරේ මාසික රැස්වීම් 12ක් සංවිධානය කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ද මාසිකව සංවිධානය කෙරෙන අතර 2019 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් සංවිධානය කර තිබේ.

ප්‍රගති වාර්තා හා වාර්ෂික වාර්තා සම්පාදනය

2018 වසරේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ප්‍රගති වාර්තා ඇතුළු 2019 වසරේ සියලු ම අංශවල ප්‍රගතිය නිරූපනය වන පරිදි මාසික ප්‍රගති වාර්තා සම්පාදනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යොමු කිරීමට පියවර ගෙන තිබේ.

වාර්ෂික වාර්තාව 2014 සංශෝධනය කර මුද්‍රණය සඳහා භාර දී තිබේ. මුද්‍රණයෙන් පසු අදාළ ආයතන වෙත පිටපත් ලබාදීම සහ ඉන් පිටපත් 20ක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් සකස් කර 2019.04.25 දින අධ්‍යාපන අමාත්‍යාංශයට භාරදීමට පියවර ගෙන තිබේ. 2012, 2013 සහ 2014 වර්ෂවලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ නැවත සංශෝධනය කර අධ්‍යාපන අමාත්‍යාංශයට භාරදීම සහ එක් එක් වසර සඳහා මුද්‍රිත පිටපත් 45ක් සංයුක්ත තැටි 352ක් බැගින් අධ්‍යාපන අමාත්‍යාංශයට

භාරදීම සිදු කර තිබේ. 2017 වාර්ෂික වාර්තාව කෙටුම්පත් කර සෝදුපත් පරීක්ෂා කොට නැවත සංශෝධනය කිරීම හා 2015 වසරේ වාර්ෂික වාර්තාව මුද්‍රණය සඳහා සූදානම් කර ඉන් පිටපත් 100ක් මුද්‍රණය කර අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා පිටපත් 20ක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාරදී තිබේ. 2016 වසරේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත නැවත සංශෝධනය කර මුද්‍රණය කිරීම සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කර අමාත්‍ය මණ්ඩලය වෙත යැවීම සඳහා ඉන් පිටපත් 20ක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාරදී තිබේ. 2018 වාර්ෂික වාර්තාව සැකසීම සඳහා මූලික පියවර ගෙන තිබේ.

විදේශ පුහුණුවීම් හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් යොමු කිරීම

- 2019.08.07 - 12 දක්වා චීනයේ පැවැති ඩිජිටල් ප්‍රකාශන හා ඩිජිටල් පුස්තකාල සම්මන්ත්‍රණයට අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ සභාපතිතුමා සහභාගී කරවීමට අදාළ කටයුතු සංවිධානය කිරීම (නොවැලැක්විය හැකි හේතුවක් මත සභාපතිතුමා මේ සඳහා සහභාගී නොවීය)
- 2019.11.12 - 16 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර දී ISSN අධ්‍යක්ෂවරුන්ගේ 44 වන සැසිවාරය සඳහා අධ්‍යක්ෂිකා සේනානි බණ්ඩාර මහත්මිය සහභාගී කරවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ඉන්දියානු ජාතික ඩිජිටල් පුස්තකාලය හා නවදිල්ලියේ ඉන්දියානු තාක්ෂණ ආයතනය එක්ව සංවිධානය කළ UNESCO International Symposium on Knowledge Engineering for Digital Library Design 2019 සමුළුවට සහකාර අධ්‍යක්ෂ උදය කබ්රාල් මහතා සහභාගී කරවීම සඳහා අදාළ කටයුතු සිදු කරන ලදී. මෙම සමුළුව 2019.12.09 - 12 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර දී පැවැත්විණ.

2020 වසර සඳහා මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම සහ 2019 වසරේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සැකසීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සඳහා වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ඒ ඒ අංශවලින් ඉටු කෙරෙන කාර්යයන් සැලසුම් කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව 2018 වසරට අදාළ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම හා 2019 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ආයතන හා පුද්ගලයින් වෙත යොමු කර තිබේ.
2019 වසර සඳහා ද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සහ 2020 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මට අදාළ මූලික කටයුතු සිදු කර තිබේ.

වෙනත්

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද තොරතුරු පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ උපදෙස් මාලාව සැකසීම සඳහා 2019.01.18 දින පැවැති වැඩමුළුවට සහකාර අධ්‍යක්ෂ විජය ප්‍රේමදර්ශන මහතා සහභාගී වී තිබේ.

පරිපාලන අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලු ම පරිපාලන කටයුතු පරිපාලන අංශය යටතේ සිදු වේ. මේ යටතේ සේවක බඳවා ගැනීම්, සේවක නිවාඩු, වැටුප්, ණය හා අත්තිකාරම් ලබාදීම, වාහන පාලනය, ගබඩා කටයුතු පාලනය, ආරක්ෂක කටයුතු සංවිධානය හා අධීක්ෂණය, ලේඛනාගාර කළමනාකරණය (Record Room Management), වාර්ෂික තොග සමීක්ෂණ ආදිය සිදු කෙරේ.

සේවක බඳවා ගැනීම් / උසස් කිරීම් / විශ්‍රාම ගැනීම්

මෙම වසරේ මණ්ඩලයේ නව බඳවා ගැනීම් යටතේ අධ්‍යක්ෂ (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය) 01, සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය තනතුරු 01, තොරතුරු සහකාර iii ශ්‍රේණිය 04, කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය 03, කාර්යාල සහායක iii ශ්‍රේණිය 03 සඳහා නිලධාරීන් බඳවා ගැනීමට පියවර ගෙන තිබේ. අභ්‍යන්තර උසස්වීම් යටතේ සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය 01, පරිපාලන නිලධාරි ii ශ්‍රේණිය 01, තොරතුරු සහකාර iii ශ්‍රේණිය 03, පුස්තකාල සහායක ii ශ්‍රේණිය 02ක්, බඳවාගෙන තිබේ. ශ්‍රේණි උසස්වීම් යටතේ තොරතුරු සහකාර i ශ්‍රේණිය 01, කළමනාකරණ සහකාර ii ශ්‍රේණිය 01 සිදු කර තිබේ. සේවක විශ්‍රාම ගැනීම් යටතේ මෙම වසර තුළ සේවකයින් 03 දෙනෙක් විශ්‍රාම ගොස් තිබෙන අතර, සේවකයින් 10 දෙනෙකු සේවයෙන් ඉවත්ව ගොස් තිබේ.

ආයතනයේ ව්‍යුහමය තත්වයන් වර්ධනය කිරීම - විභාග කටයුතු

වාර්ෂිකව පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම යටතේ මෙම වසර තුළ තනතුරු කිහිපයක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා තිබේ.

තනතුර	කාර්යක්ෂමතා කඩඉම	පෙනී සිටි සංඛ්‍යාව
පුස්තකාල සහායක i (සිංහල)	iii	02
පුස්තකාල සහායක ii (සිංහල)	ii	02
කළමනාකරණ සහකාර i (සිංහල)	iii	01
තොරතුරු සහකාර iii (දෙමළ මාධ්‍ය)	iii	01
තොරතුරු සහකාර iii (සිංහල හා දෙමළ මාධ්‍ය)	i	03
පුහුණු කිරීමේ නිලධාරී ii (සිංහල)	i	01
සහකාර අධ්‍යක්ෂ ii (සිංහල)	i	06

පුරප්පාඩු පිරවීම

මණ්ඩලයේ පුරප්පාඩු වී තිබෙන තනතුරු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර තිබේ. එම තනතුරු වන්නේ පාලන ලේකම් (ii), පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරී (ii), තොරතුරු සහකාර (iii), කළමනාකරණ සහකාර (iii), පුස්තකාල සහායක (ii) හා කාර්යාල සහායක (ii) තනතුරු වේ. මෙම තනතුරු ද ඇතුළත්ව පුරප්පාඩුව පැවැති පහත තනතුරු සඳහා බඳවා ගැනීම වෙනුවෙන් බාහිර හා විවෘත වශයෙන් අයදුම්පත් කැඳවීමට කටයුතු කර තිබේ. එම තනතුරු වන්නේ අධ්‍යක්ෂ (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය), සහකාර අධ්‍යක්ෂ (ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන), සහකාර අධ්‍යක්ෂ (ක්‍රමෝපාය සැලසුම්), සහකාර අධ්‍යක්ෂ (ප්‍රතිග්‍රහණ), සංරක්ෂණ නිලධාරී (ii), පද්ධති විශ්ලේෂක (ii), ගිණුම් නිලධාරී (ii). තොරතුරු සහකාර (iii), ලේඛන සංරක්ෂක (iii), කළමනාකරණ සහකාර (iii) හා පොත් බැඳුම්කරු (iii) යන තනතුරු වේ.

තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ලබාදීම

තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් වූ අයදුම්පත් දෙකකට අදාළව අවශ්‍ය තොරතුරු ලබාදීමට කටයුතු කර තිබේ.

මණ්ඩලයීය චක්‍රලේඛ නිකුත් කිරීම

මණ්ඩලයේ අභ්‍යන්තර අවශ්‍යතා අනුව විවිධ අවස්ථාවල දී චක්‍රලේඛ නිකුත් කිරීම සිදු කරනු ලැබේ. ඒ අනුව 2019 වසරේ නිකුත් කරන ලද මණ්ඩලයීය චක්‍රලේඛ පහත පරිදි වේ.

(i) 1/2019 මණ්ඩලයීය නිලධාරීන් සේවයෙන් ඉවත්වයාම අවම කර ගැනීම

(ii) 2/2019 මණ්ඩලයීය නිලධාරීන් අවිධිමත් ලෙස නිවාඩු ලබා ගැනීම

(iii) 3/2019 දුරකථන ඇමතුම් සඳහා පිළිතුරු ලබා නොදීම

(iv) 4/2019 පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය ලබාදීම

(v) 5/2019 රජයේ නිලධාරීන්ගේ නිල ඇඳුම්

(vi) 6/2019 ආයතනික විද්‍යුත් ලිපිනය රාජකාරී කටයුතු සඳහා පමණක් භාවිත කිරීම

සාමාන්‍ය පරිපාලන කටයුතු

මණ්ඩලයේ සාමාන්‍ය පරිපාලන කටයුතු යටතේ අවශ්‍යතා සහිත නිලධාරීන් සඳහා දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබා දීමට කටයුතු කිරීම, ආරක්ෂක සේවා කටයුතු අධීක්ෂණය හා පවත්වාගෙන යාම, විදේශ පාර්සල් නිරවුල් කිරීම, සේවක සුබසාධනය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය, නිවාඩු ලේඛන යාවත්කාලීන කිරීම, සාමාන්‍ය / ලියාපදිංචි ලිපි තැපෑලට යොමු කිරීම, තොග සමීක්ෂණය, ගබඩා පාලනය, විනය පිළිබඳ කටයුතු ඇතුළු ආයතනයේ සියලු ම පරිපාලන කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාමට පියවර ගෙන තිබේ.

නඩත්තු අංශය

ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදු වන බැවින් එම කටයුතු අධීක්ෂණය කිරීම හා අදාළ රැස්වීම් පැවැත්වීමට කටයුතු කර තිබේ.

කාර්යාල උපකරණ සඳහා නඩත්තු ගිවිසුම් අත්සන් කිරීම හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම, භාවිතයට ගත නොහැකි උපකරණ අපහරණය සඳහා යොමු කිරීම සහ මෝටර් රථ නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු අවශ්‍යතාවන් පරිදි සිදුකර තිබේ.

උද්‍යාන නඩත්තු කටයුතු සිදු කිරීම සහ ඊට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීමට කටයුතු කිරීම හා මණ්ඩලයීය ගොඩනැගිල්ල අදාළ බාහිර ආයතනය මගින් දිනපතා පිරිසිදු කිරීමට පියවර ගෙන තිබේ. දුරකථන බිල්පත්, විදුලි බිල්පත්, ජල බිල්පත්, අන්තර්ජාල බිල්පත් ගෙවීමට කටයුතු කිරීම සහ වසර අවසානයේ දේපළ රක්ෂණය සඳහා අදාළ කටයුතු යොදා තිබේ.

ප්‍රධාන ශ්‍රවණාගාරයේ අලුත්වැඩියාව හේතුවෙන් කුළියට ලබා දී නොමැති අතර, සම්මන්ත්‍රණ ශාලාව කුළියට ලබාදීම මගින් රු.489,500.00ක ආදායමක් උපයා ගෙන තිබේ.

මණ්ඩලයීය ඉඩම නිදහස් දීමනා බලපත්‍රයක් මඟින් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම. අභ්‍යන්තර නවීකරණ කටයුතු සිදු වන බැවින් අවස්ථානුකූලව ගොඩනැගිල්ලේ ඇතිවන නඩත්තු කටයුතු සිදු කිරීම. නවීකරණ කටයුතුවල දී අපහරණය කළ යුතු භාණ්ඩ, මිල ගණන් කැඳවා වෙන්දේසි කිරීම නවීකරණ කටයුතු සිදු කිරීමේ දී අවශ්‍යතා පරිදි කමිටු රැස් කොට අලුත්වැඩියා සඳහා අවශ්‍ය ස්ථානවලින් බඩු භාණ්ඩ ඉවත්කර අලුත්වැඩියා කටයුතු සඳහා ඉඩ පහසුකම් ලබාදීම සිදු කිරීම සහ සිදු කළ යුතු නවීකරණ කටයුතු සාකච්ඡා කිරීමට අවශ්‍ය රැස්වීම් පැවැත්වීම හා එහි වාර්තා තබා ගැනීමට කටයුතු කර තිබේ. මණ්ඩලයීය නව ගොඩනැගිල්ල සැකසීම සඳහා සැලසුම් හා ප්‍රමාණ බිල්පත් සැකසීම හා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සැලසුම් ලබා ගැනීම නවීකරණය කරන ලද කොටස සඳහා අවශ්‍ය ලී බඩු ලබාගැනීමට ප්‍රමාණ බිල්පත් සැකසීම හා ඊට අදාළ කටයුතු මේ වසරේදී විශේෂයෙන් සිදු කර තිබේ.

මුදල් අංශය

මෙම වසර තුළ 2019 වර්ෂයට අයත් අයවැය ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීමත්, මාසිකව පිළියෙල කළ මුදල් ප්‍රගතිකථන වාර්තා, ලැබීම් හා ගෙවීම් විස්තර ඇතුළත් කර අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමත් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් නියමිත වේලාවට ලබාගැනීම සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් විස්තර ද ඇතුළත් කර පිළියෙල කරන ලද මුදල් ප්‍රගතිකථන වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. මෙයට අමතරව මණ්ඩලයේ ලැබීම් හා ගෙවීම්, මුදල් පොත් පරිගණක ගත කරන ලද අතර මාසික වාර්තා හා අවසන් ගිණුම් වාර්තා පිළියෙල කිරීමේ පහසුව පිණිස විශ්ලේෂණ වාර්තා පිළියෙල කර තිබේ. මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලද මුදල් හා මණ්ඩලයේ ඉපයීම් ද අයවැයගත සීමාවන් යටතේ

ගෙවීම් කිරීම සඳහා ද උපයෝගි කර ගන්නා ලද අතර රජයේ විගණන අංශයෙන් ලැබුණු විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමත්, සියලු ම බැංකු ගිණුම්වලට අදාළ ලැබීම් හා ගෙවීම් මුදල් පොත් මාසිකව යාවත්කාලීනව පවත්වාගෙන යාමට ද කටයුතු කර තිබේ.

සේවක වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් දීමනා යනාදි ගෙවීම් කටයුතු නියමිත දිනවල දී සිදු කරන ලදී. පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් නිසි වේලාවට නො ලැබුණු අවස්ථාවල දී මණ්ඩලය විසින් උපයන ලද මුදල් ද අයවැයගත සීමාවන් යටතේ ගෙවීම් සඳහා යොදාගෙන තිබේ.

ලැබීම් ගෙවීම් පිළිබඳ විස්තර සහිතව මුදල් පුරෝකථන වාර්තාව පිළියෙල කර අමාත්‍යාංශ ලේකම් මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට මාසිකව ඉදිරිපත් කර මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ලබාගැනීමට කටයුතු කරන ලදී. මණ්ඩලයට ලැබෙන අනෙකුත් ආදායම් නිසි පරිදි ලබාගැනීමට පියවර ගෙන ඇති අතර, මාසික ගිණුම් වාර්තා සකස්කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර තිබේ. මෙයට අමතරව ලැබීම් හා ගෙවීම් මුදල් පොත් පරිගණකගත කරන ලද අතර එම තොරතුරු ආශ්‍රයෙන් බැංකු සැසඳුම් වාර්තා හා අවසන් ගිණුම් ලිපි ගොනු යාවත්කාලීන කර ඇත.

මෙම වර්ෂයට අදාළව මාසික වැටුප් වාර්තා සකස් කිරීම, සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා ව්‍යවස්ථාපිත අඩු කිරීම් සඳහා වාර මුදල් ගෙවීම් කටයුතුත්, අවකරණ ලේඛන සකස් කිරීම, ණය ලේඛන යාවත්කාලින කිරීම, 2017 සහ 2018 වර්ෂවල අවසාන ගිණුම් වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම, අවශ්‍ය වැටුප් විස්තර, ඇප තැන්පතු හා අනෙකුත් තොරතුරු ලබාදීම, සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල 2018 අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම යනා දී කටයුතු මේ යටතේ සිදු කර තිබේ. මෙයට අමතරව මණ්ඩලයීය අවශ්‍යතා සඳහා ලිපිද්‍රව්‍ය සැපයීමටත්, අලෙවිහල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමටත්, පොත් බැඳුම්හල සඳහා අවශ්‍ය උපකරණ කට්ටල හා රසායනික ද්‍රව්‍ය සැපයීමටත් අවශ්‍ය පියවර ගෙන තිබේ.

ප්‍රසම්පාදන කටයුතු

ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ග්‍රාමීය සංවර්ධනය සඳහා රු. 1,3076,438,.00 ක් ද, මණ්ඩලයීය නිලධාරීන් පුහුණුව සඳහා රු. 653,833.00 ක් ද, ලී බඩු හා කාර්යාල උපකරණ මිල දී ගැනීම වෙනුවෙන් රු.3,840,015.00 ක් ද, පුස්තකාල ද්‍රව්‍ය සහ මුද්‍රණය සඳහා රු. 2,106,802.00 ක් ද, පරිගණක සහ පරිගණක අමතර කොටස් මිලදී ගැනීම සඳහා රු. 618,400.00 ක් ද, පුස්තකාල පොත් ඩිජිටල්කරණය කිරීම සඳහා රු. 3,339,950.00 ක් ද, Kiyawamu.lk ව්‍යාපෘතිය සඳහා රු. 1,727,122.00 ක් ද 2019 වසර තුළ වැය වී ඇත.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයීය මුදල් අංශය මඟින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව හා ලංකා බැංකුවට අදාළ දෛනික ලැබීම් ලේඛනය, ලැබීම් මුදල් පොත්. කුවිතාන්සි හා බැංකු තැන්පතු පත් පරීක්ෂා කිරීම, ගෙවීම් වවුචර සහ ගෙවීම් මුදල් පොත් පරීක්ෂා කිරීම, අත්තිකාරම් ගෙවීම් සහ පියවීම් පරීක්ෂා කිරීම. වැටුප් අවකරණ යටතේ ආපදා ණය ගෙවීම්වලට අදාළ ලේඛන පරීක්ෂා කිරීම, බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි නිවැරදිභාවය පරීක්ෂා කිරීම, මණ්ඩලයීය නිලධාරීන්ගේ වැටුප් ගෙවීම්වලට අදාළ ලිපිගොනු හා වැටුප් ලේඛන පරීක්ෂා කිරීම සිදු කොට තිබේ.

2019 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් මණ්ඩලයීය මුදල් අංශය මඟින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව (පුරහල ශාඛාව), මහජන බැංකුව (හයිඩ්පාක් ශාඛාව) හා ලංකා බැංකුව (නිදහස් චතුරශ්‍ර ශාඛාව) අදාළ දෛනික ලැබීම් ලේඛනය, ලැබීම් මුදල් පොත්, කුවිතාන්සි පරීක්ෂා කිරීම, ගෙවීම් වවුචර්පත් සහ ගෙවීම් මුදල් පොත් පරීක්ෂා කිරීම (2019 ජනවාරි සිට ජූනි දක්වා) සිදු කර තිබේ. අත්තිකාරම් ලේඛනය සහ ඒ අනුව නිකුත් කර ඇති අත්තිකාරම් සහ එම අත්තිකාරම් පියවීම් පිළිබඳ පරීක්ෂා කිරීම (2018 මාර්තු සිට දෙසැම්බර් දක්වා) , ආපදා ණය ගෙවීම් පිළිබඳ පරීක්ෂා කිරීම (2018 සහ 2019 මාර්තු දක්වා), ප්‍රසම්පාදන කටයුතු කාර්යාල උපකරණ මිල දී ගැනීම පිළිබඳ පරීක්ෂා කිරීම (2018 සහ 2019 වර්ෂවල) සිදු කර ඇත.

එමෙන්ම මණ්ඩලයීය පරිපාලන කටයුතු යටතේ 2015, 2016, 2017 සහ 2018 වර්ෂවල සේවයෙන් ඉවත් ව ගිය හා විශ්‍රාම ගිය සේවකයන් හට සිදු කරන ලද ගෙවීම් ඔවුන්ගෙන් මණ්ඩලය වෙත අයවීම් සහ ඒවා ගිණුම්ගත කිරීම් පිළිබඳ පරීක්ෂා කිරීම සිදු කර තිබේ. මණ්ඩලයීය අනෙකුත් අංශ පරීක්ෂා කිරීම යටතේ ඩිජිටල් පුස්තකාල ඒකකය මඟින් සිදු කරන ජාතික පුස්තකාල එකතුව සංඛ්‍යාංකකරණය කිරීම පරීක්ෂා කිරීම, ප්‍රතිග්‍රහණ අංශයේ කටයුතු පරීක්ෂා කිරීම, ව්‍යාප්ති සේවා අංශයේ කටයුතු පරීක්ෂා කිරීම සිදු කර තිබේ. ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ කටයුතු පරීක්ෂා කිරීම, විශේෂ විමර්ශන යටතේ ජාතික පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සිදු කර තිබේ.

ඉහත සඳහන් පරිදි අභ්‍යන්තර පරීක්ෂාවන් සිදු කර අභ්‍යන්තර විගණන විමසුම් 13ක් 2019 වර්ෂය තුළ නිකුත් කර ඇති අතර, එම විගණන විමසුම් සමඟ අවශ්‍ය විගණන නිර්දේශයන් ද ලබා දී ඇත. එමෙන්ම රජයේ විගණන අංශය මඟින් විගණන විමසුම් 09ක් සහ විගණකාධිපති වාර්තා 03ක් යොමු කර ඇති අතර ඒ සඳහා පිළිතුරු වාර්තා සැපයීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

2019 වර්ෂය සඳහා මණ්ඩලයීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා තිබේ. මීට අමතරව මණ්ඩලයීය ප්‍රතිපාදන සහ සේවක සාමාජික මුදල් මඟින් පවත්වාගෙන යනු ලබන සේවක සුබ සාධක සංගමයේ 2018 වර්ෂයට අදාළ අවසන් ගිණුම් සම්මත නොවූ බැවින් සේවක සුබසාධක සංගමයේ එම වර්ෂයට අදාළ සියලු ගනුදෙනු පරීක්ෂා කර බලා අවසන් ගිණුම් සකස් කිරීම ද සිදු කර ඇත.

සමාප්තිය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පවත්වා ගෙන යාමත් මෙරට සෙසු පුස්තකාලවල අභිවෘද්ධිය සහ සංවර්ධනය සඳහා කටයුතු කිරීම ඇතුළු ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් සේවා සම්පාදනය කිරීමයි. මේ යටතේ 2019 වසර තුළ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා තිබේ. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර වර්ධනයත් සමඟම පුස්තකාල ක්ෂේත්‍රය ද එහි බලපෑමට ඍජු ලෙස ලක් වී තිබේ. පුස්තකාලවල පොතපත අස්ථානගතවීම වැලැක්වීම සඳහා නවීන තාක්ෂණ ක්‍රම භාවිත කරන අතර ඒ සඳහා ලොව ඉතා ප්‍රචලිත ලෙස භාවිත කරන ක්‍රමවේදයක් වන්නේ පොතපත සඳහා RFID (Radio Frequency Identification) ක්‍රමය භාවිත කිරීමයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා ද මෙම වසරේ දී මෙම ක්‍රමය හඳුන්වා දීමට හැකි වී තිබේ.

ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු පසුගිය වසරේ ආරම්භ කළ ද එහි නවීකරණ කටයුතු තවදුරටත් අවසන් නොවීම හේතුවෙන් ජාතික පුස්තකාලයේ කාර්යයන් විධිමත් ව පවත්වාගෙනයාම සඳහා එය බාධාකාරී වී තිබේ. කෙසේ වූව ද විවිධ දුෂ්කරතා මධ්‍යයේ පාඨක සේවා අබාධිතව පවත්වාගෙන යාමට කටයුතු කර තිබේ. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඩිජිටල් පුස්තකාල සංවර්ධන වැඩසටහන සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද එක් පුස්තකාලයක් වශයෙන් තෝරා ගෙන තිබෙන අතර ඒ සඳහා අවශ්‍ය පරිගණක උපාංග හා ඊට අදාළ උපකරණවලින් සමන්විත ඩිජිටල් පුස්තකාල පහසුකම් එක්කිරීමට පියවර ගෙන තිබේ. ඊට අමතරව ස්ථාපිත කිරීමට යෝජිත ළමා අංශය සඳහා අවශ්‍ය මේස පුටු හා ටැබ් යන්ත්‍ර ද මෙම ව්‍යාපෘතිය යටතේ ලබාගැනීමට පියවර ගෙන තිබේ. මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් පොදු ප්‍රජාව වෙත කඩිනමින් තොරතුරු සන්නිවේදනය කිරීමේ අරමුණෙන් මෙම වසරේදී LibraryNews නමින් කෙටි පණිවුඩ සේවාවක් (SMS) ආරම්භ කළ අතර අලෙවි ප්‍රවර්ධන ක්‍රමවේදයක් වශයෙන් මණ්ඩලයේ කටයුතු පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබාදීම ද අරමුණ වේ. **ලෝකය මතකය සුරැකීමේ** වැඩසටහනේ මෙරට නාභිගත මධ්‍යස්ථානය (Focal Point) වශයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය කටයුතු කරනු ලබන අතර අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ ත්‍රිපිටකය ලෝක උරුමයක් බවට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන වෙනුවෙන් දායකත්වය දැක්වීමට හැකි වී තිබේ. එමෙන්ම මෙම කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ **පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහනට** සමගාමීව පොළොන්නරුව නව නගරයේ ඉදි කළ පුරාණ තාක්ෂණ කෞතුකාගාර පුස්තකාලයට අනුබද්ධිත තොරතුරු මධ්‍යස්ථානය සහ පුස්තකාලය ගොඩනැගීමේ කාර්යයේ දී මණ්ඩලය සුවිශේෂී දායකත්වයක් ලබා දී තිබේ. රජරට ප්‍රදේශය පිළිබඳ ලියවුණු කෘතිවලින් මෙන්ම පැරණි තාක්ෂණ විෂයන්ට අදාළ කෘතිවලින් සමන්විත නවීන තාක්ෂණික පහසුකම්වලින් යුක්තව මෙරට ගොඩනගන ලද ප්‍රමුඛ පුස්තකාලය ලෙස මෙම පුස්තකාලය හැඳින්විය හැකිය.

දිවයින පුරා විසිරී තිබෙන පුස්තකාලවල කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ කාර්යයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර 2020 තිරසර පුස්තකාල සංවර්ධන වැඩසටහන යටතේ මධ්‍යම හා උතුරු පළාත්වල පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා දායකත්වය ලබාදී තිබේ.

ශ්‍රී ලංකාවේ ජාතීන් අතර සුහදතාව වර්ධනය කිරීම මූලික කරගනිමින් ජාතීන් අතර සාහිත්‍ය සංසරණයක් ඇති කිරීම සඳහා **දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුවට සාහිත්‍ය පාලමක්** මැයෙන් ග්‍රන්ථ පරිවර්තන ව්‍යාපෘතිය ආරම්භ කළ අතර මේ යටතේ සිංහල බසින් රචිත තෝරාගත් කෙටිකතා දෙමළ බසට පරිවර්තනය කිරීමත් දෙමළ බසින් රචිත කෙටිකතා සිංහල බසට පරිවර්තනය කිරීමත් අපේක්ෂාව වී තිබේ. මණ්ඩලය මඟින් ඉතා දීර්ඝ කාල පරිච්ඡේදයක සිට සම්භාව්‍ය කෘති සංස්කරණයෙන් ප්‍රකාශයට පත් කිරීම සිදු කළ අතර මෙම වසරේ දී **බුත්සරණ** කෘතියෙහි සංස්කරණ කටයුතු නිමකර ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ලැබුණි. ඊට අමතරව මණ්ඩලය මඟින් සිදු කරනු ලබන ප්‍රකාශන කටයුතු පුළුල් කිරීමට පියවර ගත් අතර නව තාක්ෂණ ක්‍රම ඔස්සේ අන්තර්ජාතික ප්‍රමිති අංක (ISBN, ISSN, ISMN) නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගෙන තිබේ. මෙම වසර තුළ ද ආයතනයේ කාර්ය මණ්ඩලයෙන් පිරිසක් විශ්‍රාම ගිය අතර පැවති පුරප්පාඩු සඳහා නවක පිරිස් සේවයට බඳවා ගැනීමට පියවර ගෙන තිබේ. 2019 වසර වෙනුවෙන් සැලසුම් කළ නව ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලැබුණ ද ඒ සඳහා මහා භාණ්ඩාගාරය මඟින් නියමිත ප්‍රතිපාදන නොලැබීම මත සැලසුම් කළ ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අපහසු වූ බව ද සඳහන් කළ යුතුය.

කෙසේ වූව ද මණ්ඩලය මඟින් සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලද සහාය කෘතඥතා පූර්වක ව සිහිපත් කරන අතර ගරු අධ්‍යාපන අමාත්‍යතුමා හා අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් ද ලැබුණු සහාය පිළිබඳව අතිශයින් කෘතඥ වෙමි. එමෙන් ම විවිධ ගැටලු හා බාධක මධ්‍යයේ වුව ද මණ්ඩලය මඟින් 2019 වසර සඳහා සැලසුම් කළ ව්‍යාපෘති කාර්යක්ෂමව ක්‍රියාවට නැවීම හා ඒවා උසස් අයුරින් පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ඇතුළු අනෙකුත් සියලු ම කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහාය මෙහි දී අගය කරන අතර මෙම වාර්තාව සකස් කිරීමේ දී සහාය වූ ක්‍රමෝපාය සැලසුම් අංශයේ අංශ ප්‍රධාන ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතඥතාව පළකරමු.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14
නිදහස් මාවත
කොළඹ07.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

(අධ්‍යාපන අමාත්‍යාංශය)

ගිණුම් වාර්තාව - 2019

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයන්

		31.12.2019	31.12.2018
වත්කම්	සටහන	රු.	රු.
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	10,766,828.00	23,170,555.00
ලැබිය යුතු දෑ	2	14,442,008.00	13,376,535.00
තොගය	3	16,624,477.00	13,070,819.00
කලින් ගෙවීම්	4	854,835.00	810,327.00
නැන්පතු	5	361,942.00	350,579.00
		43,050,090.00	**50,778,815.00**
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම්, පිරියත හා උපකරණ	6	54,144,090.00	55,337,414.00
ඉඩම සහ ගොඩනැගිල්ල	7	108,880,489.00	111,881,818.00
වෙනත් මූල්‍ය නොවන වත්කම්	8	45,274,294.00	41,164,809.00
		208,298,873.00	**208,384,041.00**
වත්කම් එකතුව		**251,348,963.00**	**259,162,856.00**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු වියදම්	9	4,724,284.00	5,478,500.00
උපචිත වියදම්	10	9,581,712.00	7,761,354.00
සේවක ප්‍රතිලාභ	11	314,942.00	303,579.00
වෙනත් ජංගම වගකීම්	12	754,612.00	12,958,980.00
		15,375,550.00	**26,502,413.00**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම්		38,975,663.00	35,285,316.00
වගකීම් එකතුව		**54,351,213.00**	**61,787,729.00**
ශුද්ධ වත්කම්		**196,997,750.00**	**197,375,127.00**
ශුද්ධ වත්කම්/හිමිකම්			
ප්‍රාග්ධන/වෙනත් අනුග්‍රාහක ආධාර	13	7,030.00	7,030.00
සංචිත	14	959,147.00	2,881,696.00
සමුච්චිත ආදායම් (වියදම්)	15	196,031,573.00	194,486,401.00
ශුද්ධ වත්කම් එකතුව/හිමිකම්		**196,997,750.00**	**197,375,127.00**

මෙම මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය ගණකාධිකාරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරන ලදී.

.....

අධ්‍යක්ෂ (මුදල් හා පාලන)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කරනු ලැබේ.

.....
අධ්‍යක්ෂ ජනරාල්
ජා.ප්‍ර.හා ප්‍ර.සේ.ම.

.....
සභාපති
ප.ප්‍ර. හා ප්‍ර.සේ.ම.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්යසාධන විස්තරය

ආදායම්	සටහන	31.12.2019	31.12.2018
		රු.	රු.
පොත් අලෙවි හලේ වෙළඳ ගිණුම	16	2,755,085.00	1,900,258.00
ශ්‍රවණාගාරය කුලියට දීමෙන්		561,045.00	2,132,800.00
කුලී ගාස්තු	17	3,006,065.00	2,405,733.00
පොලී ආදායම්	18	557,543.00	537,871.00
ප්‍රකාශන සඳහා වාර්ෂික දායකත්ව	19	916,487.00	844,326.00
වෙනත් ආදායම්	20	1,772,227.00	2,159,918.00
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර		138,700,000.00	141,389,989.00
ස්ථිර ස්වරූපයේ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස		2,162,277.00	.
ආදායම් එකතුව		**150,430,729.00**	**151,370,895.00**
වියදම්			
පුස්තකාල සේවා වියදම්	21	13,286,101.00	15,859,720.00
පරිපාලන හා ආයතනික වියදම්	22	148,584,176.00	149,149,194.00
මූල්‍ය පිරිවැය	23	33,112.00	42,219.00
වියදම් එකතුව		**161,903,389.00**	**165,051,133.00**
අදාළ කාලය සඳහා අතිරික්තය (හිඟ වැය)		**(11,472,678.00)**	**(13,680,238.00)**
වෙනත් ආදායම්			
PPE මඟින් අලෙවිය - ලාභය / පාඩුව		14,235.00	(753,062.00)
PPE මඟින් කපා හැරීම් - ලාභය / පාඩුව		(6,657.00)	(1,080,644.00)
අදාළ කාලය සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය)		**(11,465,100.00)**	**(15,513,944.00)**

2019.12.31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය

000

	මණ්ඩලයීය අරමුදල	ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ආධාර	වෙනත් ආස්තීත්වයෙන් ලද ප්‍රාග්ධන දායකත්ව ආධාර
2017.12.31 දිනට ශේෂය	**171,642**	**23,679**	**7**
පූර්ව වර්ෂ ගැලපීම්	**765**	**(1,230)**	**-**
2017.12.31 දිනට ගලපන ලද ශේෂය	**172,407**	**22,449**	**7**
වසර තුළ ගැලපීම්	**-**	**-**	**-**
ශුද්ධ අතිරික්තය (හිඟය)	**(15,514)**	**-**	**-**
ප්‍රාග්ධන ආධාර	**-**	**18,026**	**-**
ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම	**37,593**	**(37,593)**	**-**
2018.12.31 දිනට ශේෂය	**194,486**	**2,882**	**7**
පූර්ව වර්ෂ ගැලපීම්	**-**	**-**	**-**
2018.12.31 දිනට ගලපන ලද ශේෂය	**194,486**	**2,882**	**7**
ශුද්ධ අතිරික්තය (හිඟය)	**(11,465)**	**-**	**-**
ප්‍රාග්ධන ආධාර	**-**	**13,250**	**-**
ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම	**13,010**	**(13,010)**	**-**
ස්ථිර සුවරූපයේ පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස		**(2,162)**	
2019.12.31 දිනට ශේෂය	**196,031**	**960**	**7**

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

		31. 12. 2019
		රු
මෙහෙයුම් කටයුතු මඟින් මූල්‍ය ප්‍රවාහ		
ශුද්ධ අතිරික්තය (හිඟය)		(11,465,100.00)
ගැලපීම්		
ක්ෂය කිරීම	12,865,617.00	
ගැලපීම් PPE හි වටිනාකම්	209,521.00	

ගැලපීම් පුනරාවර්තන වියදම් ස්වරූපයෙන්සැලකීම	(2,162,278.00)	
	10,912,860.00	
ලාභය/(පාඩුව) දේපළ ඉවත් කිරීම් , පිරියත හා උපකරණ	(7,578.00)	
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම		
	6,830,283.00	
		17,735,565.00
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		6,270,465.00
(වැඩිවීම)/අඩුවීම තොග	(3,553,658.00)	
(වැඩිකිරීම්) / අඩු කිරීම් ලැබිය යුතු දෑ	(1,065,473.00)	
(වැඩිකිරීම්) / අඩු කිරීම් පූර්ව ගෙවීම්	(44,508.00)	
(වැඩිකිරීම්) / අඩු කිරීම් තැන්පතු	(11,363.00)	
(වැඩිකිරීම්) / අඩු කිරීම් ගෙවිය යුතු වියදම්	(183,475.00)	
(වැඩිකිරීම්) / අඩු කිරීම් උපචිත වියදම්	612,634.00	
(වැඩිකිරීම්) / අඩු කිරීම් සේවක ප්‍ර තිලාභ	11,363.00	
(වැඩිකිරීම්) / අඩු කිරීම් වෙනත් ජංගම වගකීම්	(234,760.00)	
		(4,469,240.00)
මෙහෙයුම් කටයුතු තුළින්ජනිත වූ මුදල		1,801,225.00
විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම්		(3,139,935.00)
මෙහෙයුම් කටයුතු මඟින්ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		(1,338,710.00)
<u>ආයෝජන කටයුතු මඟින්මූල්‍ය ප්‍රවාහ</u>		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ආධාර	13,250,000.00	
වසර තුළ ආයෝජන	-	
දේපළ, පිරියතහා උපකරණ මිලදී ගැනීම්	(24,342,897.00)	
දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ පාඩුව සඳහා	27,880.00	
මූල්‍ය ලැබීම්		
ආයෝජන කටයුතුවලින්ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		(11,065,017.00)
<u>මූල්‍ය කටයුතුවලින්මූල්‍ය ප්‍රවාහ</u>		
දිගු කාලීන ණය කරුවන්ට නැවත ගෙවීම්	-	
මූල්‍ය කටයුතු මඟින්මූල්‍ය ප්‍රවාහ		
ශුද්ධ වැඩිවීම /(අඩුවීම) මූල්‍ය හා සමාන දෑ		(12,403,727.00)
වසර ආරම්භයේදී බැංකු ශේෂය		23,170,555.00
වසර අවසානයේ දී මූල්‍ය හා මූල්‍ය සමාන දෑ		**10,766,828.00**
වසර අවසානයේ දී මූල්‍ය හා මූල්‍ය සමාන දෑ		
2019.12.31 දිනටබැංකුවේ මුදල		**10,766,828.00**

2019 **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති**

1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතට අනුව පිහිටුවන ලද මෙම ආයතනය 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත බවට සංශෝධනය විය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ලෙස රටතුළ පුස්තකාල සේවා සංවර්ධනය කිරීම වෙනුවෙන් සැලසුම් සැකසීම හා ආධාර කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පවත්වාගෙන යාම, මහජන පුස්තකාල හා පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම වෙනුවෙන් උපදෙස් හා ආධාර දීම, කියවීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම, ග්‍රන්ථ සංවර්ධනය හා ප්‍රලේඛන කටයුතු සඳහා අතහිත දීම ආදිය වේ. මෙම ආයතනය අංක 14, නිදහස් මාවත කොළඹ 07 ලිපිනයේ ලියාපදිංචි කර තිබේ.

01 පොදු

01 - 01 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

අ) මූල්‍ය තත්ව වාර්තාව, මූල්‍ය කාර්යසාධන වාර්තාව, ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් වාර්තාව, මූල්‍ය ප්‍රවාහ විස්තරය හා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මණ්ඩලය විසින් යොදාගෙන තිබූ ගිණුම් විස්තර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.රා.ගි.ප්‍ර) අනුව සකස් කර ඇත.

ආ) ඓතිහාසික වටිනාකම් සම්මුතියට යටත්ව මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

ඇ) මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී උද්ධමනීය සාධක ගලපා නොමැත.

ඈ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්න රුපියලට සකස් කර ඉදිරිපත් කර ඇත.

ඉ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

ඊ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ සංකල්පයට අනුව පිළියෙල කර තිබේ.

01 - 02 සංසඳනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව අනුගමනය කරන ලද අතර පසුගිය වසරේ අගයන් හා අනුරූපීව අසම්පූර්ණතා අවශ්‍ය පරිදි නැවත ගලපමින් පවත්නා වසරට ඉදිරිපත් කරන ලදී.

01 - 03 නොවෙනස්ව ඉදිරිපත් කිරීම

2019 වසරට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ ඒකක වර්ග කිරීම කාලානුරූපව වෙනස් කිරීමක් සිදු කර නොමැත.

02 වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත්තේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියට අනුව වර්ෂයක් තුළ දී හෝ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දින සිට වර්ෂයක් ඇතුළත දී මුදල් හෝ මුදල් හා සමාන දෑ බවට පත්වන දෑ වේ.

02-01 දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම

02 -01 -01 දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණවල වටිනාකම පෙන්වා දී ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට ය. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ගණනය කර ඇත්තේ ඒවා මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ එම වත්කම් වර්තමාන තත්වයට ගැනීම සඳහා දරන ලද සියලු වියදම් ද ඇතුළත්වය. සපයනු ලබන සේවා ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් වත්කම් අත්පත් කර ගැනීමේ, අලුත්වැඩියා කිරීමේ සහ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද ස්ථිර ස්වභාවයේ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී.

02- 01 -02 ක්ෂයවීම

ස්ථාවර වත්කම් හීනවන ශේෂ ක්‍රමය අනුව පහත සඳහන් පරිදි ක්ෂය කිරීම් කර ඇත.

ගොඩනැගිල්ල	2.5%
මෝටර් රථ	10%
කාර්යාලයීය ලී බඩු හා උපකරණ	10%
පරිගණක හා පරිගණක උපාංග	10%
පුස්තකාල උපකරණ	10%
පොත් බැඳුම් උපකරණ	10%
ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ	10%
පිරියත හා යන්ත්‍ර	10%
පොත් තොගය (ජාතික පුස්තකාලය)	10%
සංඛ්‍යාංක සංචිතය (ජාතික පුස්තකාලය)	10%
Kiyawamu.lk	10%

ස්ථාවර වත්කම් ඒවායේ ඉතිරි සළුල ආයු කාලය පුරාවට 2014.01.01 සිට ක්ෂයවීම් ගණනය කර තිබේ. 2014.01.01 දින සිට මිල දී ගත්/අත්පත් කර ගත් වර්ෂය සඳහා ක්ෂයවීම් වෙනුවෙන් වෙන් කිරීම් අය නොකරන ලද අතර අදාළ ස්ථාවර වත්කම් යටතේ මිල දී ගත්/අත්පත් කර ගත් ජාතික පුස්තකාල පොත් තොගය 2014.01.01 දින සිට අපහරණය කිරීම සඳහා මිල දී ගත්/අත්පත් කර ගත් මාසය හා දිනය සඳහා සම්පූර්ණයෙන් ම ක්ෂය කිරීම සිදු කරන ලදී.

02 -02 ඉඩම හා ගොඩනැගිල්ල තක්සේරු කිරීම

ස්වාධීන තක්සේරු කරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් ජාතික පුස්තකාලය පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල 1995 නොවැම්බර් 16 දිනට පහත පරිදි තක්සේරු කරනු ලැබීය.

ඉඩම (පර්චස් 318 එකක් රු. 8,000,000.00 බැගින්)	රු. 254,400,000.00
ගොඩනැගිල්ල (ප්‍රධාන ගොඩනැගිල්ල, ගරාජය, මුරකුටිය,	
ජල ටැංකිය, ශීතාගාරය, හා බලාගාර ගොඩනැගිල්ල)	රු. 84,807,400.00
එකතුව	රු.339,207,400.00

02- 03 තොග

නියමිත වටිනාකමට අනුව තොග තක්සේරු කරන ලදී. එසේම නියමිත වටිනාකමට අනුව පරිත්‍යාග ද තක්සේරු කරන ලදී.

02- 04 ලැබීම්

ලැබීම් ලෙස අය වේ යැයි අපේක්ෂිත ද්‍රව්‍යවල වටිනාකම ලැබීම් යටතේ දක්වා ඇත.

02 -05 ස්ථාවර වත්කම් ගණනය කිරීම

2014.12.31 දිනට ස්ථාවර වත්කම් ගණනය කිරීමේ දී කාර්යාල ලී බඩු හා උපකරණ, පුස්තකාල උපකරණ, පොත් බැඳුම් උපකරණ, ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ, මෝටර් රථ , ඒවායේ මිල දී ගැනීමේ වටිනාකමට හා ක්ෂය වීමේ වටිනාකමේ එකතුව 2011.12.31 දිනට භෞතික වටිනාකම්වල වටිනාකම රු.96,512.16 පුස්තකාල උපකරණ 2019.12.31 දිනට භෞතිකව හඳුනා නොගත් වත්කම් වශයෙන් හඳුනාගෙන ඇත. භෞතිකව හඳුනා නොගත් වත්කම් හඳුනාගැනීමෙන් පසු වාර්ෂික ක්ෂය වීම් ගණනය කර නොමැත.

02 -06 ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය

වසර පුරා සිදු වූ සම්පූර්ණ උපයෝගීතා සියල්ල වෙනුවෙන් වූ ප්‍රාග්ධන ප්‍රදාන ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී.

02- 07 ස්ථාවර වත්කම් බැහැර කිරීම

ඉවත් කළ හැකි ස්ථාවර වත්කම් ලෙස රු.253,088.00 ක මුදලක් හඳුනාගෙන ඇති අතර එය එම වසර තුළ දී ඉවත් කොට ඇත.

03 වගකීම් හා වෙන්කිරීම්

03 - 01 මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක් ඇතුළත දී ඉල්ලූ විට ගෙවිය යුතු ගෙවීම්, ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ව වාර්තාවේ වර්ග කර තිබේ. මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක කාලයක් ඉක්ම ගිය පසු ගෙවිය යුතු ගෙවීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ග කර තිබේ. මූල්‍ය විස්තර පිළියෙල කරන දිනට හෙළිදරව් වූ සියලු වගකීම් ගිණුම්ගත කර තිබේ.

03- 02 විශ්‍රාමික ප්‍රතිලාභ

විශ්‍රාමික පාරිතෝෂික සඳහා වසරක කාලයක් සේවය සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා වෙන් කිරීම් කර තිබේ. කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුකූලව වසර 05ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා පමණක් විශ්‍රාමික පාරිතෝෂික ගෙවිය යුතු වේ. මෙම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

03 -03 හඳුනාගත් සේවක දායකත්ව සැලැස්ම සේ.අ.අ. සහ සේ.භා.අ.

මණ්ඩලයේ සියලුම සේවකයින්ට සේ.අ.අ. සහ සේ.භා.අ. දායකත්ව මුදල් යැවීමට සුදුසුකම් පවත්නා අතර ව්‍යවස්ථාපිත නීතිරීතිවලට අනුව ඒ සඳහා මණ්ඩලයෙන් 12%ක් හා 3%ක් වශයෙන් දායකත්ව දරනු ලැබේ.

3.04 මෝටර් රථ මෙහෙයුම් කල්බදු යටතේ කුලියට ගැනීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෑන් රථයක් සහ කැබ් රථයක් මෙහෙයුම් කල්බදු යටතේ අත්පත් කරගෙන ඇත. 2018 සැප්තැම්බර් මස 05 වන දින සිට ගිවිසුම්ගත වී ඇති අතර එය මාස 60 ඇතුළත අවසන් වේ. මණ්ඩලය මේ සඳහා මාසිකව රු.169,369/ ක් බදු, සහ රු.164,300/ ක් බදු ලෙස කල්බදු වාරික ගෙවනු ලබයි.

04 මූල්‍ය කාර්යසාධන විස්තර

04 -01 ආදායම්

අ) මණ්ඩලයේ ඉපැයීම් යටතේ ග්‍රවණාගාර කුලී ආදායම, අලෙවිහලේ ආදායම, පොලී ආදායම සහ විවිධ ආදායම් වශයෙන් ඉදිරිපත් කර ඇත.

ආ) සියලු ආදායම් නිවැරදි පදනමින් හඳුනාගෙන තිබේ.

ඇ) 2019 වසර සඳහා රජයේ ප්‍රදාන වශයෙන් ලැබුණු පුනරාවර්තන ආධාර රු. 138,700,000.00 ක් හා ප්‍රාග්ධන ආධාර රු. 13,250,000.00 ක් එම වසර තුළ වියදම් වශයෙන් සිදු වී ඇත.

04 - 02 ආදායම් හඳුනාගැනීම

අ) ඉහත මූල්‍ය පදනම මත ලද ආදායම් අදාළ වියදම් හා ගලපා ඇත.

ආ) පොලී ආදායම කාල පදනම මත උපචිත කර තිබේ.

04 -03 වියදම්

මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් උපචිත පදනම මත ආදායමට එරෙහිව ගැලපීමෙන් පසු වර්ෂයේ අතිරික්තය/ හිඟය නිරූපණය කර තිබේ.

05 රජයේ ප්‍රදාන

වර්ෂය තුළ ලද රාජ්‍ය ප්‍රදාන ක්‍රමික පදනමකින් සන්සඳනාත්මක වටිනාකමකින් යුතු ආදායම ලෙස හඳුනාගෙන ඇත.

06 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති 02 මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමවේදය අනුගමනය කරමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර තිබේ.

07 මූල්‍ය තත්වයන් ඉදිරිපත් කරන දිනට පසුව සිදු වූ සිදුවීම්

මූල්‍ය තත්ව වාර්තා දිනට පසු සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අවශ්‍ය පරිදි සලකා බලා හෙළිදරව් කර තිබේ.

08 බැංකු ගිණුම්

ප්‍රාග්ධන හුවමාරුව හා වෙනත් අස්තීත්වයන් වෙනුවෙන් මහජන බැංකුවේ ගි.අ. 100113398963 අංක දරන ගිණුමක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති අතර ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා වෙනත් බැංකු ගිණුම් පවත්වාගෙන යනු ලැබේ.

09 අමතර සටහන්

ජාතික පුස්තකාල ගොඩනැගිල්ල පසුගිය වසරේ සිට නවීකරණය කරනු ලබන අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 211 සහ බදු ද ඇතුලත්වේ.

මූල්‍ය විස්තර සටහන්

		31.12.2019	31.12.2018
		රු.	රු.
සටහන් 01 මුදල් හා මුදල් සමාන දෑ			
ගිණුම් අංක 2323283 ලංකා බැංකුව		3,385,131.00	4,009,444.00
ගිණුම් අංක 100113398963 මහජන බැංකුව		3,641,271.00	16,458,960.00
ගිණුම් අංක 100163170315 මහජන බැංකුව - පුරහල ශාඛාව		3,520,663.00	2,485,638.00
පොත් හුවමාරු සේවාව සඳහා තැන්පත් කරා - ජා.ඉ.බැ.		219,763.00	216,513.00
		10,766,828.00	**23,170,555.00**
සටහන් 02 ලැබිය යුතු දෑ			
උත්සව අත්තිකාරම්		71,750.00	65,500.00
ආපදා ණය		14,034,822.00	13,061,388.00
විශේෂ අත්තිකාරම්		4,000.00	4,800.00
සූ ළු මුදල්ග්‍රිමය		4,714.00	4,713.00
විවිධ අත්තිකාරම්		286,722.00	220,134.00
ලැබිය යුතු දෑ කාර්ය මණ්ඩලයෙන්		40,000.00	20,000.00
		14,442,008.00	**13,376,535.00**
සටහන් 03 තොගය			
පොත් තොගය - ජාත්‍යන්තර පොත් හුවමාරු සේවාව		106,435.00	106,435.00
පොත් තොගය - අලෙවිය හා බෙදා හැරීම		4,625,048.00	4,581,263.00
පොත් තොගය - සම්භාව්‍ය කෘති		4,606,132.00	2,683,459.00
ලිපිද්‍රව්‍ය තොගය - පුස්තකාල		1,271,600.00	826,682.00
ලිපිද්‍රව්‍ය - කාර්යාලයීය		1,476,952.00	1,553,656.00
පොත් අලෙවිහලේ වෙළඳ තොගය		4,367,633.00	2,774,993.00
නොනිම් තොගය - බුත්සරණ		-	544,331.00
නොනිම් තොගය - පන්සිය පනස් ජාතක පොත	- iv	170,677.00	-
		16,624,477.00	**13,070,819.00**
සටහන්(04) පූර්ව ගෙවීම්			
අලුත්වැඩියා හා නඩත්තු - කාර්යාල උපකරණ		387,309.00	455,454.00
දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර		77,503.00	93,860.00
රක්ෂණ හා බලපත්‍ර - මෝටර් රථ		72,822.00	86,347.00
රක්ෂණ - දේපළ		104,600.00	110,105.00
පූර්ව ගෙවීම් වෙනත්		212,601.00	64,561.00
		854,835.00	**810,327.00**
සටහන්(05) තැන්පතු			
ඉන්ධන සඳහා තැන්පතු		50000.00	50,000.00
සේවක ආරක්ෂක තැන්පතු - (ජා.ඉ.බැ.)		311,942.00	300,579.00
		361,942.00	**350,579.00**
සටහන්(06) යටිතල පහසුකම්, පිරියත හා උපකරණ			
පුස්තකාල උපකරණ	6.I	26,206.00	26,206.00
ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ	6.II	3,603.00	4,003.00
පොත් බැඳුම් උපකරණ	6.III	5,365,013.00	5,468,421.00
කාර්යාලයීය ලී බඩු හා උපකරණ	6.IV	19,450,056.00	17,936,620.00

පරිගණක හා පරිගණක උපකරණ	6.V	9,774,154.00	10,207,655.00
පිරියත හා යන්ත්‍ර සූත්‍ර	6.VI	2,647,759.00	2,941,955.00
මෝටර් රථ	6.VII	16,877,299.00	18,752,554.00
		54,144,090.00	**55,337,414.00**

සටහන (07) ඉඩම හා ගොඩනැගිලි

ජාතික පුස්තකාල ගොඩනැගිල්ල	7.I	108,442,968.00	111,433,078.00
ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල	7.II	437,521.00	448,740.00
		108,880,489.00	**111,881,818.00**

සටහන (08) වෙනත් මූල්‍ය නොවන වත්කම්

පොත් තොගය - ජාතික පුස්තකාලය	8.I	33,892,847.00	34,007,394.00
ජාතික පුස්තකාලය - සංඛ්‍යාංක එකතුව	8.II	8,852,375.00	6,166,937.00
kiyawamu.lk	8.III	2,529,072.00	990,478.00
		45,274,294.00	**41,164,809.00**

සටහන්(09) ගෙවිය යුතු දෑ

ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	378,000.00	393,000.00
රඳවා ගත් මුදල්	3,582,977.00	3,251,118.00
ගෙවිය යුතු මුද්දර ගාස්තු	-	11,125.00
ගෙවිය යුතු බදු	87,551.00	87,551.00
ගෙවිය යුතු VAT	249,056.00	1,028,739.00
ගෙවිය යුතු WHT	426,700.00	362,500.00
වෙළඳ හිමියෝ	-	135,988.00
ගෙවිය යුතු පාරිතෝෂික	-	208,479.00
	4,724,284.00	**5,478,500.00**

මූල්‍ය විස්තර සටහන් 6, 7, 8 - 2019 දෙසැම්බර් 31 දිනට පිරියත දේපළ හා උපකරණ

සටහන්	විස්තරය	ක්ෂයවීම් අගය (%)	2019.01.01 දිනට වටිනාකම	එකතු කිරීම්	ඉවත් කිරීම්	මුලු පිරිවැය	2019.01.01 දිනට සමුච්චිත ක්ෂය	ඉවත් කිරීම්	2019 වසර සඳහා ක්ෂය	මුලු ක්ෂය	ශුද්ධ වටිනාකම
6.I	පුස්තකාල උපකරණ	10%	96,512.16	-	-	**96,512.16**	70,305.92	-	-	**70,305.92**	**26,206.24**
6.II	ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ	10%	46,874.00	-	-	**46,874.00**	42,871.11	-	400.29	**43,271.40**	**3,602.60**
6.III	පොත් බැඳුම් උපකරණ	10%	8,639,007.00	483,000.00	-	**9,122,007.00**	3,170,586.07	-	586,408.40	**3,756,994.47**	**5,365,012.53**
6.IV	කාර්යාල ලී බඩු හා උපකරණ	10%	36,327,118.80	3,357,014.50	(253,808.70)	**39,430,324.60**	18,390,499.04	(233,507.15)	1,823,277.47	**19,980,269.36**	**19,450,055.24**
6.V	පරිගණක හා පරිගණක උපාංග	10%	17,912,692.68	618,400.00	-	**18,531,092.68**	7,705,038.28	-	1,051,900.24	**8,756,938.52**	**9,774,154.16**
6.VI	පිරියත හා යන්ත්‍ර සූත්‍ර	10%	7,120,653.72	-	-	**7,120,653.72**	4,178,699.26	-	294,195.45	**4,472,894.71**	**2,647,759.01**
6.VII	මෝටර් රථ	10%	32,270,761.74	-	-	**32,270,761.74**	13,518,207.80	-	1,875,255.39	**15,393,463.19**	**16,877,298.55**
7.I	ජාතික පුස්තකාල ගොඩනැගිල්ල	2.5%	144,647,434.78	-	(209,521.22)	**144,437,913.56**	33,214,356.61	-	2,780,588.92	**35,994,945.53**	**108,442,968.03**
7.II	ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල	2.5%	803,320.09	-	-	**803,320.09**	354,580.08	-	11,218.50	**365,798.58**	**437,521.51**
8.I	ජාතික පුස්තකාල පොත් තොගය	10%	108,431,271.41	3,484,786.00	-	**111,916,057.41**	74,423,876.87	-	3,599,332.81	**78,023,209.68**	**33,892,847.73**
8.II	ජාතික පුස්තකාල සංඛ්‍යාංක එකතුව	10%	7,036,661.30	3,339,950.35	-	**10,376,611.65**	869,724.03	-	654,512.62	**1,524,236.65**	**8,852,375.00**
8.III	**kiyawamu.lk**	10%	998,880.00	1,727,121.60	-	**2,726,001.60**	8,401.53	-	188,528.03	**196,929.56**	**2,529,072.04**
	එකතුව		**364,331,187.68**	**13,010,272.45**	**(463,329.92)**	**376,878,130.21**	**155,947,146.60**	**(233,507.15)**	**12,865,618.12**	**168,579,257.57**	**208,298,872.64**

විශේෂ සටහන්

6.I පුස්තකාල අපකරණවල වටිනාකමට අදාළ වත්කම්, සත්‍යාපනය තුළින්හඳුනාගැනීටම නොහැකිවූ බැවින්වාර්ෂික ක්ෂය වෙන්කර නොමැත.

සටහන්(10) උපචිත වියදම්		
අතිකාල හා නිවාඩු දින ගෙවීම්	250,052.00	147,690.00
ශ්‍රවණාගාර දීමනා	5,600.00	3,600.00
සංග්‍රහ වියදම්	42,750.00	28,655.00
සේවක ගමන් වියදම්(දේශීය)	8,470.00	27,070.00
සුභසාධක වියදම්	123,347.00	-
කාර්යාලයීය ලිපිද්‍රව්‍ය	-	33,700.00
ඉන්ධන සහ ලිහිසි තෙල්	49,760.00	10,372.00
සනීපාරක්ෂක වියදම්	271,205.00	222,606.00
දුරකථන	87,016.00	285,988.00
විදුලිය	1,179,206.00	1,270,680.00
ජලය	46,909.00	55,952.00
තොරතුරු තාක්ෂණ (අන්තර්ජාල ගාස්තු)	18,024.00	18,877.00
ආරක්ෂක වියදම්	324,772.00	309,901.00
අලුත්වැඩියා හා නඩත්තු - කාර්යාල උපකරණ	143,570.00	9,000.00
අලුත්වැඩියා හා නඩත්තු - මණ්ඩලයීය පරිශ්‍රය	6,000.00	-
පුස්තකාල උපදේශන හා ව්‍යාප්ති සේවා	-	5,000.00
ජාතික කියවීමේ මාසයේ වියදම්	2,040.00	71,500.00
ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ වියදම්	-	1,443,913.00
නව ප්‍රකාශන මිලදී ගැනීමේ ව්‍යාපෘතියේ වියදම්	16,112.00	-
සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන වියදම්	-	14,357.00
ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය	527,755.00	
පොත් තොගය - ජාතික පුස්තකාලය	1,207,724.00	-
පුස්තකාල ලිපිද්‍රව්‍ය තොගය	796,950.00	-
වෙනත් උපචිත වියදම්	14,000.00	317,043.00
විගණන ගාස්තු	4,460,450.00	3,485,450.00
	9,581,712.00	**7,761,354.00**
සටහන්(11) සේවක දීමනා		
සේවක ආරක්ෂක තැන්පතු	175,253.00	175,253.00
සේවක ආරක්ෂක තැන්පතු පොළිය	139,689.00	128,326.00
	314,942.00	**303,579.00**
සටහන (12) වෙනත් ජංගම වගකීම්		
වෙනත් ආයතනවලින් අයකරගත යුතු වියදම්	(234,760.00)	-
සාමාන්‍ය ණය හිමියන්	989,372.00	12,958,980.00
	754,612.00	**12,958,980.00**
සටහන්(13) ප්‍රාග්ධන / වෙනත් ආයතනවලින් ලද ප්‍රදාන		
ප්‍රදාන හා පරිත්‍යාග ගිණුම්		
ශේෂය ඉ /ගෙ	7,030.00	7,030.00
එකතු කළා - වෙනත් අස්තීත්වයන්ගෙන් ලද ප්‍රාග්ධනය	-	-
	7,030.00	7,030.00
වර්ෂය තුළ ගැලපීම්	-	-
	7,030.00	**7,030.00**

සටහන (14) වෙන්කිරීම්		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන		
ශේෂය ඉ/ගෙ	2,881,696.00	23,678,741.00
ගැලපීම්	-	(1,229,954.00)
	2,881,696.00	22,448,787.00
එකතු කළා - භාණ්ඩාගාරයෙන්ලද ප්‍රා ග්ධන	13,250,000.00	18,025,511.00
	16,131,696.00	40,474,298.00
අඩු කළා - ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	(13,010,272.00)	(37,592,602.00)
ස්ථිර ස්වරූපයේ පුනරාවර්තන වියදම්	(2,162,277.00)	-
ප්‍රාග්ධන වියදම් ලෙස	**959,147.00**	**2,881,696.00**
සටහන (15) ඒකාබද්ධ අරමුදල		
ශේෂය ඉ/ගෙ	194,486,401.00	171,642,467.00
වර්ෂය තුළ ගැලපීම්	-	765,276.00
	194,486,401.00	**172,407,743.00**
එකතු කිරීම්/ අඩු කිරීම්		
වියදම් ඉක්ම වූ ආදායම්වල එකතුව	(11,465,100.00)	(15,513,944.00)
ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම්	13,010,272.00	37,592,602.00
	196,031,573.00	**194,486,401.00**
සටහන (16) පොත් අලෙවිහලේ වෙළඳ ගිණුම්		
පුස්තකාල ලිපිද්‍රව්‍ය අලෙවිය	1,315,345.00	-
බැඳුම් ද්‍රව්‍ය අලෙවිය	98,690.00	-
පොත් අලෙවිය - ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය	(399,215.00)	-
දුම්මල තෙල්	12,500.00	-
කාර්යාල උපකරණ අලෙවිය	135,125.00	-
පොත් අලෙවිහලේ වෙළඳ ගිණුම්	1,592,640.00	1,900,258.00
	2,755,085.00	**1,900,258.00**
සටහන (17) අය කිරීම් දඩ හා අයභාර		
අත්පිටපත් සමීක්ෂණයට ලද ගාස්තු	156,172.00	85,929.00
පාඨකයන් ලියාපදිංචි කිරීමෙන්ලද ගාස්තු	366,592.00	599,950.00
ISBN ව්‍යාපෘතියෙන් ලද ගාස්තු	1,295,868.00	1,075,050.00
පුස්තකාල සේවා මඟින් ලද ගාස්තු	1,187,433.00	644,804.00
	3,006,065.00	**2,405,733.00**
සටහන්(18) පොළී ආදායම්		
ආපදා ණය	548,156.00	531,667.00
විශේෂ අත්තිකාරම්	6,137.00	2,730.00
වෙනත් පොළී	3,250.00	3,474.00
	557,543.00	**537,871.00**
සටහන්(19) ප්‍රකාශන බෙදා හැරීම		
ජාතික ග්‍රන්ථ නාමාවලියේ අලෙවිය	361,491.00	95,255.00

මණ්ඩලයීය ප්‍ර කාශන අලෙවිය		554,996.00	749,071.00
		916,487.00	**844,326.00**
සටහන්(20) වෙනත් ආදායම්			
ඡායා පිටපත් සේවාවෙන්ලද ගාස්තු		144,514.00	104,711.00
ටෙන්ඩර් අයදුම්පත් අලෙවිය		52,500.00	91,000.00
ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අයදුම්පත් ගාස්තු		21,900.00	33,273.00
පුස්තකාල ශ්‍රේණිගත කිරීමෙන්ලද ගාස්තු		153,500.00	94,500.00
වෙනත් ආදායම්		50,000.00	-
විවිධ ආදායම්		1,349,813.00	1,836,434.00
		1,772,227.00	**2,159,918.00**
සටහන්(21) පුස්තකාල සේවා වියදම්			
සාමාජික ගාස්තු - ජාත්‍යන්තර පුස්තකාල		180,342.00	319,473.00
ජාත්‍යන්තර භූවමාරු සේවය		27,461.00	-
ප්‍රතිග්‍රහණ වියදම්		35,712.00	38,727.00
පාඨක අධ්‍යාපන හා ප්‍රචාරක වියදම්		425,400.00	1,023,920.00
පුස්තකාල පර්යේෂණ වියදම්		612,019.00	449,935.00
ජාතික ග්‍රන්ථ නාමවලිය පළ කිරීම		540,453.00	228,309.00
සමාජ විද්‍යා ප්‍රලේඛන වියදම්		-	30,705.00
පුස්තකාල උපදේශන හා ව්‍යාප්ති සේවා		183,489.00	301,796.00
පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම		2,023,052.00	3,697,965.00
ජාතික කියවීමේ මාසයේ වියදම්		1,437,659.00	1,098,275.00
ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය		37,165.00	2,880,905.00
පුස්තකාල විශේෂ දිනසැමරීම		297,409.00	145,985.00
තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා වියදම්		70,426.00	58,308.00
අන්තර්ජාල වියදම්		234,276.00	244,843.00
පුස්තකාල අධ්‍යාපන සම්මන්ත්‍රණ		924,370.00	421,153.00
සම්මන්ත්‍රණ, දේශන හා පුහුණුවැඩමුලු		279,843.00	437,510.00
විශේෂ පාඨමාලා සඳහා ගාස්තු		215,758.00	456,993.00
අත්පිටපත් සමීක්ෂණ ගාස්තු		312,281.00	775,008.00
සංස්කරණය සහ ප්‍රකාශනය සම්භාව්‍ය කෘති		689,627.00	255,074.00
පුස්තකාල විද්‍යා සාහිත්‍ය හා ප්‍රකාශන වියදම්		474,293.00	588,479.00
අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක		382,183.00	374,122.00
පොත් සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම		1,572,441.00	2,011,285.00
පුස්තකාල සහයෝගිතා වියදම්		162,165.00	20,950.00
සංඛ්‍යාංක පුස්තකාල වියදම්		6,000.00	-
කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම්		450,700.00	-
ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය		1,711,577.00	-
		-	15,859,720.00
		13,286,101.00	**15,859,720.00**
සටහන්(22) පරිපාලන හා ආයතනික වියදම්			
සේවක වැටුප්, වේතන හා සේවක දීමනා	22.1	96,985,444.00	101,823,574.00
සැපයීම් හා පරිභෝජන භාවිතය	22.2	32,762,865.00	31,484,755.00
අලුත්වැඩියා හා නඩත්තු ප්‍රාග්ධන වත්කම්	22.3	4,885,568.00	3,898,184.00
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	22.4	12,865,617.00	10,945,013.00

වෙනත් වියදම්	22.5	1,084,682.00	997,668.00
		148,584,176.00	**149,149,194.00**
සටහන් (23) මූල්‍ය වැය			
බැංකු ගාස්තු		33,112.00	42,219.00
		33,112.00	**42,219.00**
සටහන් (22.1) වැටුප් වේතන හා සේවක දීමනා			
වැටුප් හා වේතන		73,976,599.00	78,505,936.00
සේ.අ.අ.		8,316,789.00	8,231,604.00
සේ.හා.අ.		2,079,197.00	2,058,514.00
අතිකාල හා නිවාඩු දින ගෙවීම්		2,348,969.00	1,898,690.00
පාරිතෝෂික		6,830,283.00	7,011,403.00
මණ්ඩලයීය සාමාජික පාරිශ්‍රමිකය		1,182,400.00	883,800.00
කමිටු සාමාජික පාරිශ්‍රමිකය		246,100.00	349,600.00
ශ්‍රවණාගාරයේ වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම්		45,100.00	157,900.00
ගමන් වියදම්		297,424.00	389,937.00
විදේශ ගමන් හා අධ්‍යාපනික වැඩසටහන්		292,211.00	623,385.00
සේවක නිල ඇඳුම්		45,750.00	34,311.00
වෛද්‍ය පර්යේෂණ ගාස්තු		24,500.00	21,250.00
සුභසාධන වියදම්		380,099.00	831,392.00
සංග්‍රහ වියදම්		207,240.00	203,224.00
සහනදායී දුම්රිය ප්‍රවේශ පත්		610,477.00	505,860.00
තරඟ විභාග ගාස්තු		102,306.00	116,768.00
		96,985,444.00	**101,823,574.00**
සටහන් (22.2) සැපයීම් හා පාරිභෝජන වියදම්			
කාර්යාල ලිපිද්‍රව්‍ය		2,202,174.00	1,902,269.00
මණ්ඩලයීය දේපළ රක්ෂණය		144,972.00	146,506.00
වාහන රක්ෂණය		498,095.00	469,503.00
ඉන්ධන සහ ලිහිසිතෙල් වියදම්		1,305,695.00	1,417,335.00
දුරකථන වියදම්		1,829,803.00	1,919,383.00
විදුලිය සඳහා වියදම්		11,658,894.00	15,622,419.00
ජල බිල්පත් වියදම්		527,895.00	553,848.00
ආරක්ෂක වියදම්		4,161,542.00	3,229,485.00
සනීපාරක්ෂක වියදම්		3,078,825.00	3,104,890.00
වාරික සහ මෙහෙයුම් කල්බදු ගැනීම්		4,896,942.00	1,534,880.00
මුද්‍රණ වියදම්		40,044.00	257,721.00
පුවත්පත් හා ප්‍රකාශන		196,060.00	181,320.00
දැන්වීම් පළ කිරීම සඳහා වියදම්		1,259,834.00	604,181.00
තැපැල් ගාස්තු වියදම්		476,873.00	491,535.00
කුවිතාන්සි වෙනුවෙන් මුද්දර ගාස්තු		1,650.00	-
සැලසුම් පිළියෙල කිරීමේ හා පරිවර්තන ගාස්තු		423,567.00	49,480.00
		32,762,865.00	**31,484,755.00**

සටහන් (22.3) අලුත්වැඩියා හා නඩත්තු ප්‍රාග්ධන වත්කම්		
ගොඩනැගිලි නඩත්තුව	680,836.00	179,227.00
කාර්යල උපකරණ නඩත්තුව	2,412,761.00	1,773,126.00
මණ්ඩලයීය භූමියේ නඩත්තුව	350,851.00	232,496.00
මෝටර් රථ නඩත්තුව	1,441,120.00	1,713,335.00
	4,885,568.00	**3,898,184.00**
සටහන් (22.4) ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්		
ක්ෂයවීම	12,865,617.00	10,945,013.00
	12,865,617.00	**10,945,013.00**
සටහන් (22.5) වෙනත් වියදම්		
විගණන ගාස්තු	975,000.00	975,000.00
නීති ගාස්තු	92,940.00	7,276.00
විවිධ වියදම්	16,742.00	15,392.00
	1,084,682.00	**997,668.00**

2019.12.31 **දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම් හා තත්‍ය වියදම් විස්තරය**

විස්තරය	අනුමත අයවැය	තත්‍ය වියදම්	වෙනස	හේතුව
පුනරාවර්තන				
පුද්ගල දායකත්වය	107,434,000.00	96,350,000.00	11,084,000.00	අනපේක්ෂිත සේවක ඉල්ලා අස්වීම් හේතුවෙන් පාරිතෝෂික දීමනා ගෙවීම
ගමන්වියදම්	800,000.00	589,000.00	211,000.00	ජාතික පුස්තකාලයේ කාර්යයන් ඉටු කිරීම ස ඳහා දේශිය ගමන්වියදම්
සැපයීම් හා පරිභෝජනය	5,429,000.00	3,554,000.00	1,875,000.00	රාජ්‍ය උපදෙස්වලට අනුකූලව භාවිතයට නොගෙන පාලනය කිරීමෙන් අරමුදල සුරක්ෂිත වේ
නඩත්තු වියදම්	5,215,000.00	4,886,000.00	329,000.00	ද්‍රව්‍යමය විචල්‍යතාවක් නොමැත (විචල්‍යතාව 7%ට වඩා අඩු)
වෙනත් සේවා	41,073,200.00	30,373,000.00	10,700,200.00	භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍ර තිපාදන හිඟ මත භාවිතය පාලනය කිරීම
පුස්තකාල සේවා	16,548,800.00	13,286,000.00	3,262,800.00	භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන හිඟය සහ අනපේක්ෂිත තත්වයන් හේතුවෙන් වර්ෂය තුළ ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන්
	176,500,000.00	**149,038,000.00**	**27,462,000.00**	
ප්‍රාග්ධන				
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	6,750,000.00	4,458,000.00	2,292,000.00	ප්‍රාග්ධන කාර්යයන් අවසන් නොකිරීම හේතුවෙන්
පුස්තකාල සම්පත් අත්පත් කර ගැනීම	9,500,000.00	8,552,000.00	948,000.00	ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රාග්ධන කාර්යයන් 90%ක් අවසන් කිරීම හේතුවෙන්
	16,250,000.00	**13,010,000.00**	**3,240,000.00**	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/I/NLDSB/2019/FA/06 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 ඔක්තෝබර් 27 දින

සභාපති,

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 1998 අංක 51 දරන නව සංශෝධිත පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව පුකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා යාථාර්ණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික පොත් සංචිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව නීතියානුකූල නැන්පතුව, පරිත්‍යාග, මිලදී ගැනීම්, හුවමාරු සේවා යනාදී වශයෙන් මණ්ඩලයට ලැබී තිබුණද එකතුව රු.111,916,057 ක් වූ මිලදී ගැනීම් වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල පොත් තොගයට ඇතුළත් කර තිබුණි. එසේ වුවත් ආයතනයේ ප්‍රධාන අරමුණු අනුව පොත් වර්ගීකරණය කිරීම, පොත්වල වටිනාකම් හඳුනාගැනීම් හෝ වටිනාකම් හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික උරුමයක් ලෙස වර්ගීකරණය කර ඇති පොත් සම්බන්ධව ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) 2018 සැප්තැම්බර් 05 දින සිට මාස 60 කින් ගෙවා අවසන් කිරීමේ පදනම් මත මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ, මණ්ඩලය විසින් ලබාගෙන තිබුණු වාහන දෙක වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතුව රු.14,681,436 ක් වූ බදු හැර අවම් කල්බදු වටිනාකම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 හි 43 (ආ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී බැංකුව වෙත ලැබී තිබූ එකතුව රු.296,643 ක් වූ සෘජු බැර කිරීම් මූල්‍ය ප්‍රකාශන වලින් අන්හැරී තිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් 31 දිනට ගබඩා තොග සමීක්ෂණ වාර්තා හා මූල්‍ය ප්‍රකාශන අනුව ගබඩාවේ භෞතික පොත් තොගයේ හා සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය කිරීමේ වාසනීය යටතේ භෞතික පොත් තොගයෙහි පිළිවෙලින් රු.187,686 ක හා රු.1,922,912 ක ඌනතාවයක් නිරීක්ෂණය වුවද එම ඌනතාවය අවසාන තොගයට ගැළපීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොත් තොගයේ වටිනාකම් රු.2,110,598 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව දේපල පිරියත හා උපකරණ යටතේ මිලදීගත් පොත් තොගයේ පිරිවැය රු.111,916,057 ක් ලෙස සඳහන් කර තිබුණද, පරිශ්‍රහණ ලේඛනය අනුව එම පොත් තොගයේ පිරිවැය රු.45,524,068 ක් ලෙස දක්වා තිබීමෙන් රු.66,391,989 ක වෙනසක් නිරීක්ෂණය වුවද මෙම වෙනස හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්ව මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම් හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවිද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේමූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ඇ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට නරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	මුදල් රෙගුලාසිය 756. 757	2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.111,916,057 කට මිලදී ගත් පොත් තොගය සහ පානික පුස්තකාලයේ සංරක්ෂික පොත් තොගය සමීක්ෂණය කර නොතිබුණි.
(ආ)	2018 අංක 19 දරන පානික විගණන පනතෙහි 16(1) වගන්තිය	2018 වර්ෂයේ සිට Quick Book පරිගණක මෘදුකාංගය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කර තිබුණු මණ්ඩලයේ ගනුදෙනු සම්බන්ධයෙන් වන ලෙජර සටහන් අබණ්ඩව, කාලීනව ලෙජර ගිණුම්වල සටහන් කරනු නොලබන අතර 2022 ජූලි 20 දින වන විටත් 2020 ජනවාරි මාසයේ ගනුදෙනු පරිගණක මෘදුකාංගයට ඇතුළත් කරන බව විගණනයට නිරීක්ෂණය විය.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව	මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන දින 738 ක ප්‍රමාදයකින් පසුව 2022 මාර්තු 08 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.
(ඈ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.376,878,130 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඉ)	2012 මැයි 22 දින ප්‍රකාශයට පත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නීරණය	මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාට 2010 වර්ෂයේදී නීත්‍යානුකූල නොවන ආකාරයට වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණු රු.247,500 ක් ආපසු අයකර ගෙන පොදු ව්‍යාපාර කාරක සභාවට වාර්තාකරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට නියෝගකර තිබුණද 2022 ජූලි 15 දින වන විටද එම නියෝගය අනුව කටයුතුකර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත	
(අ) 12(2) (අ). (ඇ), (ඉ) වගන්ති	පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් ලබාදීම, දේශීය හා විදේශීය ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම හා සංරක්ෂණය, සම්බන්ධයෙන් මණ්ඩලයට පැවරී තිබෙන කර්තව්‍ය, ඉටුකිරීමේ ප්‍රගතිය පිළිබඳ නිගමනයන් මණ්ඩලයේ සංරක්ෂණ හා ප්‍රතිස්ථාපන, පරිශ්‍රහණ හා ග්‍රන්ථ විඳාපන පාලන යන අංශවල මාසික ප්‍රගති වාර්තා තුළින් පිළිබිඹු වී නොතිබුණු අතර එම අංශවල ප්‍රමාණවත් කාර්යභාර්යක් අතරැදි තිබුණි. 2022 ජුනි 30 දිනට පරිශ්‍රහණ හා ග්‍රන්ථ විඳාපන පාලන අංශවල පිළිවෙලින් 2018 වර්ෂයේ සිට අතරැදි පවතින පොත් හා ප්‍රකාශන ඒකක 5,288 ක් ද හා 1,880 ක් ද හා සංරක්ෂණ හා ප්‍රතිස්ථාපන අංශයේ ඇස්තමේන්තුගත දත්ත අනුව හඳුනාගත් සුළු, මධ්‍යම හා සම්පූර්ණ වශයෙන් ප්‍රතිකර්ම අවශ්‍ය පොත් හා ප්‍රකාශන ඒකක 33,353 ක්ද වශයෙන් කළයුතු කාර්යයන් ලෙස අතරැදි පවතින බව විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නහවිරු විය.
(ආ) 12(2) (ආ) වගන්තිය	ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කිරීම හේතුවෙන් 2018 අගෝස්තු මාසයේ සිට සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය යටතේ පැවති පිරිවැය

රු.3,660,547 ක් වූ උපකරණ සහිත රසායනාගාරය ස්ථාපිත කර තිබුණු ස්ථානයෙන් ඉවත් කිරීම නිසා එහි කටයුතු 2022 සැප්තැම්බර් 30 දක්වාම නතර වී තිබුණි. ඒ හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අවුරුදු 04 ක කාලයක් රසායනාගාරය තුළින් ඉටුකරන දිරාපත් වූ පොත් පිරිසැකසුම් (tissue) කටයුත්ත ප්‍රමාණවත් පරිදි ඉටුකර නොමැතිවීම, ජාතික පුස්තකාලයේ පොත් තැන්පතුවේ සංරක්ෂණ කර්තව්‍ය ප්‍රමාණවත් පරිදි ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

මණ්ඩලය විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මුද්‍රණය කරනු ලැබූ රු.2,084,167 ක් වටිනා මණ්ඩලීය ප්‍රකාශන 8,053 ක තොගයක් 2022 ඔක්තෝබර් 03 දිනවන විටත් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති